**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ සමූහය - 2023**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ("අධිකාරිය") සහ එහි පරිපාලිත සමාගම් ඇතුළත් සමූහයේ ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ,1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**සමූහය**

**තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 1.5 කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

**තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 1.5.1 කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.5.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

සමූහය තුළ ඇති සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.5.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

#### 1.5.1.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය යටතේ ඉදිකරනු ලැබූ හා වර්තමානය වන විට අධිකාරිය විසින් පරිපාලනය, ක්‍රියාකරවීම, නඩත්තුව හා වැඩිදියුණු කිරීම් සිදුකරනු ලබන ප්‍රධාන වේලි 13 ක ප්‍රත්‍යාගණිත අගය ලෙස රු.බිලියන 288.5 ක් 2023 වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 43 ඡේදය ප්‍රකාරව පිළිගත් අදාල වෘත්තීය සුදුසුකම් ඇති ස්වාධීන තක්සේරු වෘත්තියේ සාමාජිකයෙකු හෝ මණ්ඩලයකින් විධිමත් තක්සේරුවක් සිදුකර නොතිබුණි. | අධිකාරිය සතු ප්‍රධාන වේලි ඇතුළු නිර්මිතවල ප්‍රත්‍යාගණිත අගය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වත්කම් තක්සේරු කර ගිණුම් ගත කල යුතුය. |
| (ආ) | මහවැලි මහ සැලැස්ම යටතේ හඳුනා ගෙන තිබූ ඇස්තමේන්තගත පිරිවැය එ.ජ.ඩො.මිලියන 514 ක් වූ උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් 2023 වර්ෂයේ අවසන් කර තිබූ අතර විදුලිජනන කටයුතු 2024 මාර්තු 31 ආරම්භ කර තිබුණද එම සංවර්ධන යෝජනා ක්‍රමය තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය එ.ජ.ඩො.මිලියන 514 කට සැලසුම් කර අපේක්ෂිත ඉතිරි වැඩ කොටස් ලැයිස්තුගත කර අදාළ පාර්ශව වන මහවැලි අධිකාරිය හා ලංකා විදුලිබල මණ්ඩලය 2024.05.31 දින අත්සන් කර භාරගන්නා ලදී.ඉදිකිරීමේ වියදම් මේ දක්වා ලබාදී නොමැති පුහුලුපොල, ඩයරබා වේලි නිර්මිතවල වියදම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට හැකියාවක් නොමැත. | වත්කම් තක්සේරුකර කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය අනුව එම ප්‍රමිති මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළයුතු වුවත්, වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට ලැබිය යුතු රු.1,837,623 ක ඉඩම් පරිහරණ ගාස්තුව එම ලේඛනයේ ඇතුළත් නිලධාරීන් 05 කට ගෙවිය යුතු ශේෂ ලෙස ඇතුළත් කර හිලව් කර තිබුණි. තවද අධිකාරිය සතු 3001 අරමුදල් ගිණුමේ ශේෂය තුළ වසර ගණනාවක් තිස්සේ පැවත එන එකතුව රු.554,135,228 ක් වූ හර ශේෂ හා එකතුව රු.509,098,933 ක් වූ බැර ශේෂ තහවුරු කරගෙන අදාළ ගිණුම්කරණ ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | 2023.12.31 දිනට ලැබිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු ලේඛනයේ, ගෙවිය යුතු ශේෂ වශයෙන් නම් කිහිපයක් සටහන්වී ඇත. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම්, වගකීම් සහ ආදායම් හා වියදම් වෙන වෙනම දැක්විය යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 53 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළයුතු වුවත් ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | 2023.12.31 ට පිළියෙල කළ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පසුගිය හා ප්‍රවර්තන වර්ෂයේ තොරතුරු සංසදනාත්මකව ඉදිරිපත් කර ඇතත් එම සංසදනාත්මක තොරතුරු තුළ ගිණුම් කාල පරිච්ඡේදය ඇතුළත්කර නොතිබුණි.2024 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළයුතුය. |
| (ඉ) | අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර තිබුණද, එම අගයන්ට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 හි 47 හා 54 ඡේද ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.එම අගයන් අතර වෙනස්කම් පහත පරිදි වේ. | පෙර කාලපරිච්ඡේද වැරදි නිවැරදි කර ගිණුම් ශේෂ නැවත ප්‍රකාශ කිරීමේ ප්‍රකාශනය (ReStatement) පිළියෙල කර ඇත. ඒ අනුව, පූර්ව වර්ෂ වලට අදාලව වැරදි, නිවැරදි කිරීමේ දී ප්‍රායෝගිකව හැකිතාක් දුරට හඳුනාගත හැකි අයිතම් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදි කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමේදී අවශ්‍ය හෙළිදරව් කිරීම් කළයුතුය. |

| | 2022 ශේෂය | 2022 නැවත ප්‍රකාශ කරන ලද ශේෂය |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| දේපල පිරියත උපකරණ | 111,447,032 | 111,472,690 |
| ආයෝජන | 235,989 | 235,925 |
| කෙරීගෙන යන වැඩ | 8,738 | 39,113 |
| තොග | 270,140 | 271,328 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 4,576,005 | 4,803,174 |
| ගෙවිය යුතු ශේෂ | 39,760,813 | 596,453 |
| සමුච්චිත අරමුදල | 70,823,574 | - |
| සංචිත - ලාභාලාභ ගිණුම | (2,723,686) | 107,597,615 |
| ප්‍රත්‍යාගණන සංචිත | 7,869,744 | 7,820,774 |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01හි 71 හා 80 ඡේද ප්‍රකාරව රු.524,869,000 ක්වූ ගෙවිය යුතු ශේෂ ජංගම නොවන වගකීම් ලෙස හඳුනා ගත යුතු වුවද එසේ හඳුනා ගැනීමෙන් තොරව මුළු ශේෂයම ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි. | ගෙවිය යුතු ශේෂ ජංගම සහ ජංගම නොවන වගකීම් ලෙස හඳුනා ගෙන 2024 මූල්‍ය ප්‍රකාශන සමග නිවැරදි කිරීමට කටයුතු කරමි. | ජංගම හා ජංගම නොවන වගකීම් වෙන් වෙන්ව හඳුනාගත යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1හි 71 හා 76 ඡේද ප්‍රකාරව වෙළඳ හා වෙනත් ලැබිය යුතු රු5,089,330,000 ක ශේෂය ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස හඳුනා ගත යුතු වුවද එසේ හඳුනාගැනීමෙන් තොරව සමස්ථ ශේෂය ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | ලැබිය යුතු ශේෂ, ජංගම සහ ජංගම නොවන වත්කම් ලෙස හඳුනාගැනීමට 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වෙන්ව හඳුනාගත යුතුය. |
| (ඌ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 ප්‍රකාරව මුදල් හා මුදල් සමාන දේ ලෙස හඳුන්වා ඇත්තේ පහසුවෙන් මුදල් වටිනාකමට පරිවර්තනය කළ හැකි කෙටිකාලීන ඉතා ඉහළ ද්‍රවශීලතාවයක් ඇති ආයෝජන වුවත්, එල් කලාපයේ ජංගම වත්කම් වශයෙන් දැක්විය යුතු රු.206,651 ක් වූ මාස 03 ක ස්ථාවර තැන්පතු 02 ක වටිනාකම හා රු.4,832,466 ක් වූ අවුරුදු 01 කදී කල්පිරෙන ස්ථාවර තැන්පතු 05 ක වටිනාකම මුදල් ශේෂය යටතේ දක්වා තිබුණි.තවද, ජංගම නොවන වත්කම් ලෙස දැක්විය යුතු බී කලාපයේ රු.40,224,961 ක් වූ දින 400 ක ස්ථාවර තැන්පතුවක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කරමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මුදල් හා තැන්පතු නිවැරදි ආකෘතියෙන් ගිණුම්වල දැක්විය යුතුය. |
| (එ) | අධිකාරිය විසින් 1984-1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.64,320,853 ක් වූ ඉඩම් කට්ටි 2 ක්ද, කොත්මලේ කණිෂ්ඨ කඳවුරේ පේලි නිවාස 54 ක්ද, අධිකාරියේ කලාප කාර්යාල, අංශයන්, නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම් හඳුනාගෙන ඒවායේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර එම වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | අධිකාරිය සතු ඉඩම් හා දේපළ හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළයුතුය. |
| (ඒ) | අරලගංවිල ගොවිපොළ සඳහා 2022 මාර්තු 28 දින ලේසර් ලෙවලර යන්ත්‍රයක් රු.1,991,000 කට මිලදී ගෙන එය භාවිතය සඳහා සවිකිරීමට ගැලපෙන ට්‍රැක්ටර් රථයක් නොමැතිවීම හේතුවෙන් යන්ත්‍රය මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණි. එසේ වුවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 69 වගන්තිය අනුව වත්කමක ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වන්නේ එය භාවිතා කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවත් 2023 වර්ෂයේදී යන්ත්‍රය සඳහා රු.227,464 ක් ක්ෂය කර තිබුණි. | අධිකාරියේ ක්ෂය ගණනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වනුයේ යම් ස්ථාවර වත්කමක් මිලදී ගත් දිනයේ සිට වත්කම් ක්ෂය කිරීමයි. ඒ අනුව ''ලේසර් ලෙවලර යන්ත්‍රය'' මිලදී ගත් දිනයේ සිට ක්ෂය කිරීම ආරම්භ කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිති අනුව වත්කම් ස්ථාපිත කර ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළපසු ක්ෂය කළ යුතුය. |
| (ඔ) | අධිකාරියට එරෙහි නඩු 23 ක් සඳහා අසම්භාව්‍ය බැරකම් ලෙස රු.311,157,590 ක් නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) විසින් හඳුනාගෙන තිබුණද, එම අගය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබූ නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 8 හි 22 ඡේදය අනුව අවශ්‍ය පරිදි ප්‍රතිපාදන කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ ප්‍රමිතය අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව බැරකම්වලට අදාළව වෙන් කිරීම් සිදු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි 33 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි හඳුනාගත යුතු එල් කලාපයේ හිඟ ඉඩම් පරිහරණ ගාස්තු රු.1,784,749 ක්ද, වලව කලාපයේ පස් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ පුද්ගලයින්/ආයතන 04 කින් අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.106,909,200 ක් ද, වැලි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ පුද්ගලයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.3,214,200 ක් ද, වික්ටෝරියා කලාපයේ උකුවෙල වාරියපොල වත්ත පිහිටි අක්කර 02 ක ඉඩමෙන් 2001 ඔක්තෝබර් 19 දක්වා කඩා ඉවත් කරන ලද හුණුගල් සඳහා අයවියයුතු සේවා ගාස්තුව හා හිඟ බදු මුදල රු.2,051,060 ක් සහ සී, එල්, එච්, හා වලව කලාපවල කළුගල් කැනීම් වෙනුවෙන් පුද්ගලයන්/ආයතන 71 කින් අය වියයුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු රු.352,240,904 ක් වශයෙන් එකතුව රු.466,200,113 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ ලෙස හඳුනාගෙන නොතිබුණි. | පිළිගනිමි. හිග ඉඩම් පරිහරණ ගාස්තු ලැබිය යුතු ශේෂ ලෙස හඳුනාගෙන 2024 වර්ෂයේ සිට ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ආදායම හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට හා අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ක) | අධිකාරිය එහි ආයෝජන දේපල ලෙස හඳුනාගෙන තිබූ බදු දෙන ලද ඉඩම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 13 ප්‍රකාරව සාධාරණ අගයට අගය කලයුතු වුවත් වලව කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා බදු දුන් ඉඩම් 104 කින් දළ තක්සේරුව මත හෙක්ටයාර 143.05 ක් වූ ඉඩම් 28 ක වටිනාකම රු.62,870,350 ක් ලෙස ගිණුම් ගතකර හෙක්ටයාර 614.72 ක් වූ ඉඩම් 23 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.එයට අමතරව බාහිර පාර්ශවයකට බදු පදනම මත ලබාදී ඇති වික්ටෝරියා කලාපයේ දිගන හොලිඩේ රිසෝට් ඉදිකර ඇති ප්‍රදේශයේ හෙක්ටයාර 4.23 ක් ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් තක්සේරු ගාස්තු, මෙතෙක් ගෙවා නොමැත. බදු ගෙවන ලෙස බදුකරුවන් දැනුවත් කර ඇත. ඒ අනුව නිසි තක්සේරු වටිනාකමක් මෙතෙක් නිශ්චිත වී නොමැති නිසා ගිණුම් ගත නොකල අතර මෙම ඉඩම් කට්ටි සඳහා විධිමත් තක්සේරුව ලබාගැනීමෙන් පසු අදාල තක්සේරු වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ඉපයීම හා විවිධ ව්‍යාපෘතිවලට බැහැර කරන ලද ඉඩම් ආයෝජන දේපල ගිණුම්කරණ ප්‍රමිතිය අනුව හඳුනා ගෙන අගය කර ගිණුම්ගත කළයුතුය. |
| (ග) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 57 ඡේදය ප්‍රකාරව පශ්චාත් සේවක දායකත්ව ප්‍රතිලාභ සැලසුම් ලෙස ක්‍රියාත්මක වන සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් යෝජනා ක්‍රම පිළිබඳ හෙළිදරව් කළයුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කරමි. | ප්‍රමිතිය ප්‍රකාරව සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් යෝජනා ක්‍රම පිළිබඳ හෙළිදරව් කළයුතු කරුණු හෙළිදරව් කළයුතුය. |
| (ට) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 61 ඡේදය ප්‍රකාරව 19හි නිර්වචිත ප්‍රතිලාභ සැලසුම ලෙස හඳුනා ගෙන තිබූ සේවක පාරිතෝෂික ප්‍රතිපාදනය ආයුගණක ශිල්ප ක්‍රම භාවිතා කර හඳුනාගැනීම හා මැනීම සිදුකළයුතු වුවත් ආයතනය ඊට අනුකූලවී නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කරමි. | සේවක පාරිතෝෂික ප්‍රතිපාදනය ආයුගණක ශිල්ප ක්‍රම භාවිතා කර හඳුනාගැනීම හා මැනීම සිදු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඩ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 හානිකරණ ප්‍රමිතිය අනුව අධිකාරිය සතු ඊ කලාපයේ පිරිවැය රු.4,244,607 ක් වූ ගිනිගෙන හානිවූ නිල නිවාස 2 ක් සහ වලව කලාපයේ දක්ෂිණ අධිවේගී ව්‍යාපෘතිය අදියර II හේතුවෙන් හානිවූ වාරි ඇලවල්, අපවහන ඇලවල් හා බෙදුම් ඇලවල්වලට අදාළ හානිකරණ අලාභය හඳුනාගෙන වාර්තා කර නොතිබුණි. | 2024 හානිකරණ අලාභය හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කරමි. හානි වූ ඇලවල්, අපවහන ඇලවල් හා බෙදුම් ඇලවල්වලට වූ හානිය සඳහා රු.43,884,000 ක මුදලක් China State Construction Engineering Co-operation ආයතනයෙන් 2021.03.10 දින අධිකාරියට ලැබී ඇත. අලාභයක් සිදුවී නොමැති අතර එම ගිණුම්කරණ ගැලපීම් 2024 මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් හානිකරණ අලාභ හඳුනාගෙන වාර්තා කළයුතුය. |

**1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය වෙත වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන්, රු.671,503,748 ක්ද මොරගහකන්ද ව්‍යාපෘතියෙන්,රු.536,539,275 ක්ද දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් රු.325,457,540 ක් ලෙස වත්කම් ලැබී සමාලෝචිත වර්ෂය වනවිට පිළිවෙලින් රු.589,325,677 ක, රු.466,896,356 ක හා රු.78,348,847 ක වත්කම් පමණක් ගිණුම්ගතකර තිබුණි. | අධිකාරිය වෙත ව්‍යාපෘති වලින් විධිමත් ලිපි ලේඛන අනුව ලැබුණු සියළුම වත්කම් නිවැරදි ගබඩා ප්‍රතිපත්ති මත ගිණුම්ගත කර ඇත. උක්ත ව්‍යාපෘති මඟින් එලෙස වත්කම් ලබා දී ඇති බව පැවසුව ද විධිමත් ක්‍රමවේද මත ලැබී ඇති භාණ්ඩ ලැබීම් පත් නිකුත් කරන ලද සියළු වත්කම් අධිකාරියේ ගිණුම්වලට ගලපා ඇත. | ව්‍යාපෘතිවලින් ලැබෙන වත්කම් අගය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල භාරයේ පවතින මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ලද වාහන 16 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය විසින් මෙම වාහන 16 (බර යන්ත්‍ර) මහවැලි අධිකාරියේ B, D, E, H හා මොරගහකන්ද කලාප වෙත බාර දී ඇත.එම වාහන අධිකාරියට පවරා දෙන ලෙස රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් කර අනුමැතිය ලැබුණු පසු එම වාහන තක්සේරු කර ගිණුම් ගතකිරීමට කටයුතු කරමි. | ව්‍යාපෘතිවලින් ලැබෙන වත්කම් හඳුනාගෙන අගය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | එල් කලාපයේ රු.4,832,466 ක් වූ ස්ථාවර තැන්පතු සඳහා 2023 වර්ෂයට අදාළ පොලිය රු.1,000,911 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පොළී ආදායම් හඳුනාගෙන ගිණුම් ගත කළයුතුය. |
| (ඈ) | වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ වාහන පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයට අනුව අමාත්‍යාංශයට අයත් වාහන 241 ක් මහවැලි අධිකාරියට ලබාදී තිබුණද ඉන් වාහන 23 ක් ප්‍රවාහන අංශයේ | අධිකාරියත් අමාත්‍යාංශයත් අතර වාහන පැවරීමේ කටයුතු නිසි සම්බන්ධීකරණයක් යටතේ සිදු කිරීමටත් වාහන නිසි පරිදි අයිතිය හුවමාරු කරගැනීමටත් කටයුතු ආරම්භ කර ඇත. | අධිකාරියට ලැබී ඇති වාහන වල අයිතිය නිසි පරිදි තහවුරු කර ගිණුම් ගත |

| | | | |
|---|---|---|---|
| | ලේඛනවලට ඇතුළත් කර තිබුණද, ගිණුම්ගත කර නොතිබුණි. | | කළයුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ එකතුව රු.5,089,330,000 ක් විය. ඉන් අවුරුදු 05 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.434,649,000 ක් විය. එය අයකර ගැනීම අවිනිශ්චිත වූ අතර, ඒ සඳහා වෙන් කිරීමක්ද කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන සමඟ මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමි. | හිඟ ආදායම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඊ) | අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව මහවැලි ලයිව්ස්ටොක් හා ඇග්රෝ එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගමට ගෙවිය යුතු ශේෂය රු.12,710,820 ක් වූ අතර එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු ශේෂය රු.5,820,430 ක් විය. ඒ අනුව අධිකාරියේ ගෙවිය යුතු හා මහවැලි ලයිව්ස්ටොක් හා ඇග්රෝ එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගමේ ලැබිය යුතු ශේෂ අතර රු.6,890,390 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රු.6,890,390 ක වෙනසට හේතුව පෙර වර්ෂයන්හි එච් කලාපයේ මූල්‍ය ප්‍රකාශනවල හා එච් කලාපයේ නිරාවිය ගොවිපල මූල්‍ය ප්‍රකාශන දෙකේම මහවැලි ලයිව්ස්ටොක් ඇන්ඩ් ඇග්‍රෝ එන්ටර්ප්‍රයිසස් පුද්ගලික සමාගමට ගෙවිය යුතු ශේෂයන් දෙක එකතුකර එක් ශේෂයක් ලෙස දැක්වීමයි, තවද සමාගම පමණක් තම ගිණුම් වල හඳුනාගෙන ඇති "සාමාන්‍ය තොගයේ" වටිනාකම වන රු.446,460 ක ශේෂයද ඉහත සඳහන් වෙනසට හේතු වී ඇත. කෙසේ නමුත් සමාගම විසින් නිරාවිය ගොවිපල වෙත පවරන ලද ගොඩනැගිලිවල ශුද්ධ අගය වන රු.7,336,850 ක ශේෂය මෙලෙස ගොවිපල විසින් ගෙවිය යුතු ශේෂයක් ලෙස හඳුනා ගැනීමට හේතු විශ්ලේෂණය කිරීම හා ආයෝජන ගිණුම් සැසඳීම සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. | ශේෂ අතර වෙනස්කම් හඳුනාගෙන ගිණුම්කරණ ගැලපීම් සිදුකිරීමට කටයුතු කළයුතුය. |
| (උ) | පහළ කොත්මලේ ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයෙන් 2021, 2022 හා 2023 වර්ෂ සඳහා ලැබිය යුතු ආදායම් 2024 මැයි 29 දින වනවිටත් ලැබී නොතිබූ අතර ඒවා ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම් පරිහරණයට අදාල ගෙවීම් ප්‍රාදේශීය ලේකම් වෙත කරනු ලබන බවත් එසේ හෙයින් මහවැලි අධිකාරිය වෙත අමතර ගෙවීමක් කල නොහැකි බවත් දන්වා ඇත. මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා නීතිපති උපදෙස්ද මේ වන විට ලබා ගෙන ඇති අතර ව්‍යාපෘති සංවර්ධක සමග ඉදිරි පියවර සඳහා සාකච්ඡා කරමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.1.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සී/ස මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමේ ආයෝජනය රු.10,000,000 ක් වන අතර එහි නිවැරදිතාවය තහවුරු කරගැනීමට හා කොටස් සහතික, ප්‍රතිෂ්ඨාව තීරණය කරන ලද ආකාරය හා ඒ සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍ය මණ්ඩල තීරණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එම | මෙම සමාගම පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පවතින සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. විගණන නිරීක්ෂණ සම්බන්ධ සාකච්ඡාවක් මාගේ ප්‍රධානත්වයෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,අදාල සමාගමේ හා | ආයෝජනයේ නිවැරදිතාවය තහවුරු කර, නිරාවිය හා කළංකුට්ටිය ගොවිපලවලට අදාළ බදු ගිවිසුම් |

| | | | |
|---|---|---|---|
| | සමාගමට බදුදී ඇති අධිකාරියේ තඹුත්තේගම පිහිටි අක්කර 25 කින් යුත් නිරාවිය ගොවිපොල 2019 වසර දක්වා බදු පදනමින් පවරාදී තිබුණද එහි බදු කාලය දීර්ඝ කිරීමට හෝ එම ඉඩම නැවත පවරා ගෙන නොතිබුණි. අධිකාරිය සතු අක්කර 25 කින් යුත් කලංකුට්ටිය ගොවිපලද මෙම සමාගමට 2010 වර්ෂයේදී බදුදී තිබුණද, විධිමත් බදු ගිවිසුමක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින්, මෙම ගොවිපල බදුදී ඇති ආකාරය, බදුදී ඇති කාලය හා හිඟ බදු මුදල වන රු.28,352,000 පිළිබඳව විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | අධිකාරියේ විෂයගත නිලධාරින්ගේ සහභාගිත්වයෙන් 2024.10.14 දින සාකච්ඡාවක් පැවැත්විය. එහිදී මෙම ගැටළු සඳහා දෙපාර්ශවය අතර පවතින රාජකාරිමය ලිපි ලේඛන හුවමාරු කර ඒවා අධ්‍යනය කර නැවත සාකච්ඡාවක් 2024 නොවැම්බර් මස මුල් සතියේදි පැවැත්වීමට දෙපාර්ශවය එකග විය. ඒ අනුව මෙම ගැටළු විසදා ගැනීමට අපේක්ෂා කරමි.තවද ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කොටස් හිමිකාරිත්වය තහවුරු කිරීම සඳහා අදාල සමාගම 2021 වර්ෂය සඳහා සමාගම් රෙජිස්ට්‍රාල් වෙත ඉදිරිපත් කළ වාර්ෂික ප්‍රකාශයේ (Annual Return) මහවැලි අධිකාරිය වෙත කොටස් 100,000 ක් නිකුත් කර ඇති බව දක්වා ඇත. | දීර්ඝ කිරීමට හෝ ඒවා නැවත පවරා ගැනීමත් ගිවිසුම් විගණනයට ඉදිරිපත් කළයුතුය. |
| (ආ) | අධිකාරිය විසින් 2023 දෙසැම්බර් 21 දින වනවිට බදු අයකර ගතහැකි ඉඩම් හෙක්ටයාර 18766 ක් බැහැර කර ඇති අතර, ඉන් හෙක්ටයාර 6114.21 ක් හෙවත් රු.2,810,494,000 ක් පමණක් ගිණුම්ගත කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස මුළු බදු ඉඩම්වලින් සියයට 32.6 ක් විය. මේ අනුව ඉඩම්වල සාධාරණ අගය ගිණුම් මඟින් පිළිඹිබු නොවන අතර, නිවැරදිතාවය සහ එම ඉඩම්වල පවතින වටිනාකම පිළිබඳව විගණනයට තහවුරු කරගත නොහැකි විය. | නිසි තක්සේරු වටිනාකමක් මෙතෙක් නිශ්චිතවී නොමැති නිසා ගිණුම්ගත නොකළ අතර, මෙම ඉඩම් කට්ටි සඳහා විධිමත් තක්සේරුව ලබාගැනීමෙන් පසු අදාළ තක්සේරු වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | විවිධ ව්‍යාපෘතිවලට බැහැර කරන ලද ඉඩම් ආයෝජන දේපල ගිණුම්කරණ ප්‍රමිතිය අනුව හඳුනාගෙන අගය කර ගිණුම්ගත කළයුතුය. |

### 1.5.2 සී/ස පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම

#### 1.5.2.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිරාඳුරුකෝට්ටේ ගොවිපලෙහි අක්කර 1,113 රූඩ් 0 පර්චස් 37.76 ක ඉඩම සහ දම්මින්න ගොවිපළෙහි අක්කර 100 ක ඉඩම සමාගම විසින් භාවිතා කරමින් තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 17.04 ඡේදය අනුව එම ඉඩම්වල වටිනාකම් ගිණුම්වලට ගෙන නොතිබුණි. | සමාගමේ වත්කම් ලෙස ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කර නොමැත. සමාගම වෙත ඉඩම් පැවරීමක් සිදු කර නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කල යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයක සිදු කර තිබුණු කාර්යාල උපකරණ, වාහන හා යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය හේතුවෙන් ඇති වූ රු.640,000 ක ලාභයක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 17 ඡේදය ප්‍රකාර සිදු කළ යුතු හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන අගයද (Additions) එකතු කිරීම යටතට ගෙන දක්වා ඇත. එය වෙන්කර Additions හා Re valuations ලෙස දක්වා නිවැරදි කරන ලද ලේඛනය ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරව් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පූර්ව වර්ෂ සඳහා වූ ගැලපුම් ලෙස රු.814,905 ක් අයභාර සංචිතයෙන් අඩු කර රු.1,274,358ක් එකතු කර තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 10.23 අනුව ඊට අදාළ හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රවර්තන ගැලපුම් හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 28 හි 18 අනුව පාරිතෝෂික ගණනයේදී ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන පාරිතෝෂික වගකීම ගණනය කර ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශවලට ගැලපිය යුතු වුවද, සමාගම ඊට අනුකූලවී නොතිබුණි.තවද, සේවා කාලය වර්ෂ 01ත්-05 ත් අතර වන සේවකයන් 07 දෙනෙකු සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 28 අනුව රු.228,662 ක් වූ පාරිතෝෂික වගකීම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | ප්‍රමිතය ප්‍රකාරව ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන පාරිතෝෂික වගකීම ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | වාණිජ දැව වශයෙන් අලෙවි කිරීමට නිර්දේශ කර තිබූ දම්මින්න ගොවිපලෙහි තේක්ක ගස් 195 ක් හා ගිරාඳුරුකෝට්ටේ ගොවිපලෙහි තේක්ක ගස් 211ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41හි 10 ඡේදය අනුව තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිරාඳුරුකෝට්ටේ හා දම්මින්න ගොවිපළේ තේක්ක ගස් ලේඛන ගතකර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් මෙම ගස් තක්සේරු කර එම වටිනාකම 2024 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ප්‍රමිතිය ප්‍රකාරව මෙම ගස් තක්සේරු කර එම වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |

**1.5.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.1,154,681 ක් වූ තොග වෙනස හා රු.1,113,911ක් වූ පාරිතෝෂික ගෙවීම් ගලපා නොතිබුණි. රු.383,670ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ වැඩි වීම මුදල් ගලා ඒමක් ලෙස දැක්විය යුතු වුවද එය රු.1,916,226ක මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි. ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.155,172ක දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමක් මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණද එහි රු.903,614ක මුදල් ගලා යාමක් විය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නොගැලපිය යුතු රු.459,454ක පූර්ව වර්ෂ ගැලපුම් කාරක ප්‍රාග්ධන වෙනස්වීමක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගම සතුව පැවතුණු තඹුත්තේගම පිහිටි නිරාවිය ගොවිපොළ, කන්තලේ ගොවිපොළ, පොළොන්නරුව පිහිටි සිද්ධපුර ගොවිපොළ, හා වැලිකන්ද පිහිටි මුතුවැල්ල ගොවිපොළ වර්ෂ 2005-2010 අතර කාලපරිච්ඡේදය තුළ විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවකින් තොරව මහවැලි අධිකාරිය වෙත පවරා දී තිබුණි.එම ගොවිපොළවල් සතු පිරිවැය රු.22,336,573 ක් වූ ගොඩනැගිලි හා සවිකිරීම්, වාහන 26 ක්, කාර්යාල උපකරණ 45 ක්, යන්ත්‍රෝපකරණ 63 ක්, ජෙනරේටර් 03 ක් සහ ලිබඩු හා සවිකිරීම් 260 ක් සමාගම විසින් භාවිතා නොකරන නමුත්, සමාගමේ ගිණුම්වල ඇතුළත් කර තිබුණි. තවද එම වත්කම් මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් භෞතිකව සමීක්ෂණය කර නොතිබුණි. | සමාගමේ පාලනයෙන් ඉවත් වී ඇති නිරාවිය, කන්තලේ, සිද්ධපුර, මුතුවැල්ල, තුංකම යන ගොවිපළවල්වල වත්කම් 2024 වර්ෂයට සමාගම මගින් භෞතික සත්‍යාපනය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර සත්‍යාපන කමිටුවක් නම්කර එම කමිටුවට මහවැලි අධිකාරියේ සාමාජිකයෙකුද ඇතුළත් කර මෙම කාර්ය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | සමාගමට අයත් වත්කම් පමණක් ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | 2013 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා මාස 110 ක කාලයක් සඳහා සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු රු. 25,840,605 ක දායක මුදලක් විගණිත දිනය වූ 2024 අප්‍රේල් 04 වනවිටත් ගෙවා නොතිබූ අතර, ඊට අදාළව ගෙවිය යුතු රු.6,208,029ක් වූ අධිභාර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම්ගත කරනු ලැබේ | සියළු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2020 ජූලි සිට 2023 දෙසැම්බර් දක්වා මාස 42 ක කාලයක් සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතු රු. 1,345,988 ක දායක මුදල ගෙවා නොතිබූ අතර, ඊට අදාළව ගෙවිය යුතු රු.652,809ක් වූ අධිභාර, ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් ගතකරනු ලැබේ. | වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු ශේෂය රු.5,820,430 ක් වුවද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් සමාගමට ගෙවිය යුතු ශේෂය රු.12,710,820 ක් වීමෙන් ශේෂ අතර රු.6,890,390 ක වෙනසක් විය. | මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතු කිසිදු ශේෂයක් නොමැත.ලැබිය යුතු ශේෂයේ වෙනස ලෙස දක්වා ඇති රු.446,460.00 ශේෂය මහවැලි අධිකාරිය වෙත නිරාවිය ගොවිපළ භාර ගත් 2010.09.30 දින වන විට ගොවිපල සතුව තිබූ නිෂ්පාදන හා අමුද්‍රව්‍ය තොගයේ වටිනාකම බව සහතික කරමි. | මෙම ලැබිය යුතු මුදල් අධිකාරිය වෙතින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | මහවැලි ආර්ථික ඒජන්සියේ, කොත්මලේ කිරි සංවර්ධන අරමුදලේ, යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන, විදේශ ආධාර හා ප්‍රාග්ධන සංචිත ලෙස දක්වා තිබුණු රු.406,061,033 ක ශේෂ පිළිබඳ ප්‍රමාණවත් විස්තර විගණනයට ඉදිරිපත් නොවූ බැවින්, නිවැරදිතාවය තහවුරු නොවීය. | 2009 වර්ෂයේ පශු සම්පත් සංවර්ධන අංශයේ අවසාන ගිණුම්වල පැවැති මෙම ශේෂ තහවුරු කිරීමට අදාළ ලේඛන සමාගම සතුව නොමැත. මේ සම්බන්ධව අධ්‍යක්ෂ පත්‍රිකාවක් ඉදිරිපත් කර මහවැලි අධිකාරිය වෙත මේ සම්බන්ධයෙන් තහවුරු කිරීම් ලබා ගැනීමට උත්සහ කරන බව දන්වමි. | ශේෂ සනාථ කිරීම් විගණනයට සෘජුව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමෙන් ලද රු.502,203 ක පාඩුව ලාභාලාභ ගිණුමට ගැලපීම වෙනුවට ප්‍රත්‍යාගණන ලාභයට හර කර තිබුණි. | අබලි ද්‍රව්‍ය ප්‍රත්‍යාගණන ගිණුමට ගැළපීම් කර නිවැරදි කරමි. | ගිණුම්කරණ වරද නිවැරදි කළ යුතුය. |
| (ඍ) | නිරාවිය ගොවිපලේ සේවකයන් 06 දෙනෙකුට අදාලව රු. 1,729,889ක හිඟ සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් හා රු.864,945ක අධිභාර මුදල් නොගෙවා පැහැරහැර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට එම හිඟ මුදලෙන් කොටසක් වන රු.402,513 ක දායක මුදල සහ අධිභාර ගිණුම්වල දක්වා නොතිබුණි. | ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් පිළිබඳ තොරතුරු සමාගම විසින් කාලසීමකට ආදාලව සිදුකරන ලද ගෙවීම් පිළිබඳ කරුණු උසාවියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු. 2,030,402 ක ගෙවිය යුතු ශේෂය අඩු වූ අතර එම ශේෂය රු. 50,000 වාරික වලින් ගෙවීමට තීන්දුව ලබා දෙන ලදී. | සියළු වගකීම් ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | වර්ෂ 05 ඉක්මවූ නොගෙවන ලද එකතු කල අගය මත බදු, පිරිවැටුම් බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලට අදාල ගෙවිය යුතු දඩ මුදල වන රු.1,797,312 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂය තහවුරු කිරීම් සාක්ෂි ඉදිරිපත් කර ඇත. | ව්‍යවස්ථාපිත වගකීම් නිරවුල් කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | 2019 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ජනිත වූ රු.213,480ක ප්‍රත්‍යාගණන ලාභය ප්‍රාග්ධන සංචිතයට නොගලපා ආදායම් සංචිතයට ගලපා තිබුණි. | 2019 වර්ෂයේ ප්‍රත්‍යාගණන ලාභයේ වරද නිවැරදි කිරීම 2024 වර්ෂයේ ගිණුම්වලින් සිදු කරමි. | ප්‍රත්‍යාගණන ලාභය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතේ 72 වගන්තිය | ඉඩම් අවසර පත්‍ර නිකුත් කිරීමේදී මැන සැලසුම් කිරීම හෝ යෝග්‍ය ඉඩම් තෝරා ගැනීම සිදුකර අවසර පත්‍ර නිකුත් කළයුතු වුවත්, එම නියෝගයට පටහැනිව 2014 වර්ෂයේ සී කලාපයේ ගිරාදුරුකෝට්ටේ කොට්ඨාශ කාර්යාලයේ පැවති ඉඩම් කච්චේරියේදී තෝරාගත් පුද්ගලයින් 99 දෙනෙකු සඳහා ඉඩම් පෙන්වාදීමකින් තොරව ඉඩම් අවසර පත්‍ර ලබාදී තිබුණි. | 2014 වර්ෂයේ දී ඉඩම් භුක්තිය භාරදීමකින් තොරව අවසර පත්‍ර ලබා දී අවසරපත්‍ර ලාභීන් වෙත බෙදාදීමට සුදුසු ඉඩම් හඳුනාගෙන ඇතත් 2022/11/11 දින සිට ජනාධිපති ලේකම් විසින් නිකුත් කර තිබූ ලිඛිත දැනුම් දීම අනුව නව ඉඩම් බැහැර කිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් මෙම කාර්යය සිදු කිරීමට නොහැකි විය. | යෝග්‍ය ඉඩම් තෝරා මැන සැලසුම් සකස් කිරීමෙන් පසු ඉඩම් අවසර පත්‍ර ලබා දිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9(1) වගන්තිය | පනතේ III වන උපලේඛනයේ සඳහන් ආයතන පමණක් ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කර තිබුණු අතර අධිකාරිය එම උපලේඛනයට ඇතුළත් නොවුනද, බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 03/2015 හා 2015.06.17 දිනැති චක්‍රලේඛයේ 106 ඡේදය ප්‍රකාරව මහවැලි අධිකාරිය අර්ධ රාජ්‍ය ආයතනයකි. (Semi Government) එය සේවා සපයන රාජ්‍ය සංස්ථාවකි. (Service Organize) ඒ සඳහා අවශ්‍ය අරමුදල් භාණ්ඩාගාරය වෙනත් ඒකාබද්ධ අරමුදල් හරහා ලැබෙන බැවින් රාජ්‍ය ආයතන (සංස්ථා) ලෙස සලකා මේ දක්වා Nil Return දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | 2022/2023 තක්සේරු වර්ෂයට අදාලව බදු වාර්තා ලබා දීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| | (i) මු.රෙ 371 (ඇ) | කන්දකාඩු හා ගිරාඳුරුකෝට්ටේ විදුලිවැට ඉදිකිරීම, එච් කලාපයේ මත්ස්‍ය මධ්‍යස්ථානය හා පොකුණු ඉදිකිරීම සඳහා අධ්‍යක්ෂ (පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති) ට ලබා දී තිබූ එකතුව රු.24,239,319ක අත්තිකාරම් මුදල් විගණිත දින වූ 2024 මැයි 10 දිනට වර්ෂ 03 ක් ඉක්මවා ඇතත් පියවා නොතිබූ අතර, අදාළ කාර්යයන් නිසි පරිදි ඉටුකරද නොතිබුණි. | පිළිගනිමි.<br>මහවැලි බී කලාපයේ කන්දකාඩු ගොවිපල වටා ඉදි කල අලිවැට හා එච් කලාපයේ ඉදිකල මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය හා මඩ පොකුණු ඉදි කිරීම ව්‍යාපාතියට ලබා දෙන ලද අත්තිකාරම් පියවීමට ඉදිරිපත් කල තොරතුරු ප්‍රමාණවත් මට්ටමක නොමැති බැවින් එය විධිමත් කිරීමට අදාල අංශ දැනුවත් කර ඇත.<br><br>සී කලාපයට අයත් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය වටා ඉදි කරන ලද එල්ලෙන විදුලි වැටෙහි තාක්ෂණික ගැටළු පැන නැඟී ඇති බැවින් එය අධිකාරිය වෙත භාර ගැනීමට නොහැකි මට්ටමක පවතින බැවින් ඒ පිළිබඳව පරීක්ෂාකර වාර්තා කිරීම සඳහා මා විසින් විශේෂ කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තා මේවන විට ලැබී ඇත, එය අධ්‍යනය කර ඉදිරි කටයුතු සිදුකරමි. | අත්තිකාරම් ලබාදුන් කාර්යය නිමකර පියවීමට පෙර නැවත අත්තිකාරම් ලබාදීම නොකල යුතුය. |
| | (ii) මු.රෙ. 373 | සියළු අග්‍රිම ශේෂ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවද රු.1,037,000ක්වූ ඉන්ධන අත්තිකාරම් රු.169,000 ක් | 2023 ප්‍රාග්ධන ප්‍රදාන (Grant) හා දේශීය අරමුදල් ව්‍යාපෘති ප්‍රතිපාදන දෙසැම්බර් මාසයේ අවසාන රාජකාරි දින ලැබීම | අත්තිකාරම් ලබාදුන් කාර්යය නිමකර පියවීමට පෙර නැවත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සුළු මුදල් අග්‍රිම රු.15,736,000ක්වූ මිලදී ගැනීම් අත්තිකාරම් හා රු.15,736,000 ක් වූ විවිධ අත්තිකාරම් පියවීමෙන් තොරව තවදුරටත් සේවකයන් අත රදවා ගෙන තිබුණි. | හේතුවෙන් අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා වූ මිළදී ගැනීම් වෙනුවෙන් වසර අග වුවද අදාල මිලදී ගැනීම් සිදුකිරීමට අත්තිකාරම් මුදල් ලබා දී ඇත. (උදා: ප්‍රධාන වේලි හා ජලාශ නඩත්තු කරගෙන යාම) ඒ හේතුව මත මෙම අත්තිකාරම් මුදල් වර්ෂය අවසාන වුවද එදිනට පියවීමට නොහැකි වී ඇත. | අත්තිකාරම් ලබා නොදිය යුතුය. |
| | (iii) | මු..රෙ. 1646 | 2020 පෙබරවාරි 04 දින අනතුරකට භාජනය වී ඇති CAF-1918 අංක දරන රථයේ දෛනික ධාවන සටහන් මෙම වාර්තාවේ දිනය දක්වාම විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිගනිමි. කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | කඩිනමින් ඉදිරිපත් කළයුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 චක්‍රලේඛයේ 9.4 ඡේදය හා 2021 නොවැම්බර් 17 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ස්ථාපනය කරන ලද මෙහෙයුම් අත්පොත | | | | |
| | (i) | 3.5 ඡේදය | බාහිර ආයතන වෙත 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලසීමාවේ මුදාහැර සිටි මහවැලි ආරක්ෂක බළකායේ 31 දෙනෙකු සඳහා ගෙවා තිබූ වැටුප් (රු.5,000 ක විශේෂ දීමනාව ඇතුළත්ව), සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්ව මුදල් සහ අතිකාල හා ගමන් වියදම් දීමනා පිළිවෙලින් රු.34,537,879 ක්, රු.4,891,316 ක්, හා රු.2,559,571 ක් 2024 මැයි 20 වන දින වනවිටත් ප්‍රතිපූරණය කරගැනීමට නොහැකිවී තිබුණි. | 06 වන විශ්‍රාමික ජනාධිපතිතුමා වෙත මුදා හරින ලද නිළධාරින් 05 දෙනා හැර අනෙක් ආයතන සඳහා අනුයුක්ත කරන ලද සියළුම නිළධාරින් මේ වන විට අධිකාරියේ රාජකාරි සඳහා නැවත වාර්තා කර ඇත. මුදාහරින ලද ආරක්‍ෂක නියාමකයින් වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය සඳහා අදාල ආයතන ප්‍රතිචාරයක් දක්වා නොමැති බව දන්වමි. වාරිමාර්ග අමාත්‍යංශ ලේකම් ගේ උපදෙස් වලට අනුව අමාත්‍යංශයට මුදා හරින ලද සේවකයන් වෙනුවෙන් වැයකල මුදල් ප්‍රතිපූර්ණය කිරීමක් සිදු නොකරයි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව අනෙකුත් ආයතන වෙත මුදා හල සේවකයන්ට ගෙවූ පාරිශ්‍රමික ආපසු අයකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 7.2 වගන්තිය | අධිකාරියේ කාර්යසාධනය ඇගයීම පිණිස මූලික කාර්යසාධන දර්ශක හා මෙහෙයුම් කාර්යසාධන දර්ශක පිහිටුවා ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගතයුතු වුවද එසේ කර නොතිබුණි. | අධිකාරියේ කාර්යසාධන ඇගයීම සඳහා වන විෂය පථයන්ට අදාල කාර්යසාධන දර්ශක හා මෙහෙයුම් කාර්යසාධන දර්ශක සකස් කර භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනිම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයට යොමුකර ඇත. | මූලික හා මෙහෙයුම් කාර්යසාධන දර්ශක සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |
| | (iii) 7.6 වගන්තිය | අධිකාරියේ කාර්යසාධනයට අදාළ තොරතුරු රේඛීය අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට වාර්තා කිරීම සඳහා නිලධාරියෙකු පත් කළයුතු වුවත්, එසේ කර නොතිබුණි. | අධිකාරියේ කාර්යසාධනයට අදාල නම් කර සිටි නිළධාරිණිය සේවයෙන් ඉල්ලා අස්වීම මත ඒ සඳහා නිළධාරියෙකු නම්කිරීමට නොහැකි විය. නවක නිළධාරින් බඳවා ගැනීම මත සුදුසු නව නිළධාරියෙකු පත්කොට ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | කාර්යසාධන තොරතුරු වාර්තා කිරීමට නිලධාරියෙකු පත්කල යුතුය. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය | අධිකාරියේ 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු නමුත්,ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන වාරිමාර්ග අමාත්‍යාංශයට යොමුකර ඇත. මහවැලි අධිකාරිය මගින් අදාල ආයතන වෙත ඉදිරිපත් නොකළ බව පිළිගන්නා අතර 2025 වර්ෂයේ සිට මෙම චක්‍රල්බයේ නියමයන්ට අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. | ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය සකස් කර අදාල අනුමැතීන් ලබාගෙන නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| | (i) 3.1 වගන්තිය | අධිකාරිය විසින් සිය වාහන සම්බන්ධයෙන් වාර්ෂික ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය උපදෙස් අදාල වාහන භාර නිලධාරීන් වෙත ලබා දී ඇත. ඉන්ධන සීමා කිරීම හා මිල ගණන් ඉහල යාම හේතුවෙන් මෙය සිදු කිරීම මේ වනවිට මන්දගාමී වී ඇතත් හැකි සෑම අවස්ථාවකදීම ඉන්ධන පරීක්‍ෂාව සිදු කරනු ලැබේ. | ඉන්ධන පරීක්ෂාවන් සිදු කළ යුතුය. |
| | (ii) 3.3 වගන්තිය | වාහනවල මාසික ඉන්ධන දහනය සම්බන්ධ සටහනක් අදාළ ආකෘතිය ප්‍රකාරව නඩත්තු කර නොතිබුණි. | දී ඇති උපදෙස් පරිදි ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. | ඉන්ධන දහනය සම්බන්ධ තොරතුරු ආකකෘතිය ප්‍රකාරව නඩත්තු |

කළ යුතුය.

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව මහවැලි කලාපවල ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය මූලික පහසුකම් සලසා දෙමින් කෘෂිකාර්මික, සත්ත්ව පාලන, අගය එකතු කළ හා වෙනත් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන දේශීය විදේශීය වෙළෙඳ පොළට එක් කිරීම තුළින් මහවැලි ජනපදිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කර තිබූ සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රම 3 න් මහවැලි සවිය හා මොරගහකන්ද ණය යෝජනා ක්‍රම යටතේ ණය දීම සඳහා ලබාදුන් රු.මිලියන 107.02 ක මුදලින් 2023 දෙසැම්බර් 31 දිනට ණය ලෙස ලබා දී තිබුණේ රු.මිලියන 78.25 කි. මෙම මහවැලි සවිය ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලෙස ලබා දුන් රු.මිලියන 66.57 ක මුදල සඳහා බැංකුව අයකර ගන්නා පොළියෙන් කිසිදු මුදලක් අධිකාරිය වෙත ලබා දී නොතිබුණි.මොරගහකන්ද ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලෙස ලබා නොදුන් රු.මිලියන 13.32 ක් සඳහා කිසිදු පොළියක් අධිකාරියට අයවී නොතිබුණි. මේ අනුව ණය ලබා දීම සඳහා ලබා දුන් රු.මිලියන 79.89 ක් සඳහා කිසිදු පොළියක් අධිකාරිය වෙත ලැබී නොතිබුණු අතර අධිකාරිය සතු මුදල් වෙනත් පාර්ශ්වයන්ගේ ප්‍රයෝජනය සඳහා ලබා දී තිබුණි. | “මහවැලි සවිය” ණය යෝජනා ක්‍රමය ගිවිසුම පරිදි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සියයට 08 ක පොලියක් අය කර එම බැංකුවේ වියදම් සඳහා භාවිතා කරන නමුත් අත්සන් කරන ලද ගිවිසුමට අනුව පළමු පාර්ශවය වන මහවැලි අධිකාරියේ ආදයම් සඳහා එක් වීමක් සිදු නොවේ.එසේ ගිවිසුම් ප්‍රකාරව නිකුත් කරන ණය මුදල් සඳහා පොලී ආදායම් මහවැලි අධිකාරියේ ආදායම ලෙස නොලැබුණ ද ආයෝජකයින් වෙත නිකුත් නොකල මුදල් ප්‍රමාණය සඳහා වාර්ෂික සාමාන්‍ය ඉතිරි කිරීම් පොලී අනුපාතය යටතේ පොලී ආදායම් හිමි වේ.<br>මොරගහකන්ද අත්වැල ණය යෝජනා ක්‍රමය ලබා දෙන ණය සඳහා අයකරන සියයට 7 ක පොලී අනුපාතිකයෙන් සියයට 2 ක් සහ නිකුත් නොකරන සඳහා වාර්ෂික සාමාන්‍ය ඉතිරි කිරීම් පොලී අනුපාතය යටතේ පොලී ආදායම් හිමි වේ.<br>2006 වර්ෂයේ S.M.E.බැංකුව සමඟ එළඹුණු ගිවිසුමකට අනුව රු.මි.50 ක මූලික තැන්පතුව යටතේ ආරම්භකර ඇති ණය වැඩසටහන පසුකාලීනව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව සමඟ ගිවිසුම් ගතව ආරම්භකර ගෙන පවත්වා ගෙනයනු ලැබේ.ණය මුදල් නිකුත් කිරීම සඳහා සුදුසු ආයෝජකයින් හඳුනාගැනීම ක්ෂේත්‍ර පරීක්ෂාව සහ ඇපකරුවන් අවශ්‍යතාවයන් සඳහා යම් කාලයක් ගතවුවද මේ වන විට ණය මුදල් නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. | ලබාදීමට ඇති මුදල් කඩිනමින් ජානපදිකයින් වෙත ලබාදී එම ණය නිදහස් කිරීමෙන් අධිකාරිය වෙත ලැබිය යුතු ආදායම් ලබාගැනීමට කටයුතු කළයුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,201,567,000 ක අලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු1,494,045,000 ක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,707,522,000 ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පසුබෑමට අනෙකුත් ආදායම් අඩුවීම,රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන ලැබීම් අඩුවීම හා ක්ෂය වීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,201,724,000 ක අලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු1,485,127,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,716,597,000 ක පසුබෑමක් නිරීක්ෂණය විය.මෙම පසුබෑමට අනෙකුත් ආදායම් අඩුවීම,රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන ලැබීම් අඩුවීම හා ක්ෂය වීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි බී කලාපයට අයත් කන්දකාඩුව ප්‍රදේශයේ අක්කර 3,770 ක භූමි ප්‍රදේශයක් කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට රු.6,539,600 කට 2021 සැප්තැම්බර් 28 දින ප්‍රදානය කර රු.3,211,376 ක් ගෙවා තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මෙම ඉඩමේ හිමිකම ජාතික පශු සම්පත් මණ්ඩලය වෙත පැවරීම හේතුවෙන් කොටසක් පමණක් නිමකර තිබූ මෙම පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව පැවරිය යුත්තේ කුමන ආයතනය වෙතද හා මීට අදාළ ඉදිරි ගෙවීම් කුමන ආයතනයකින් දැරිය යුතුද යන්න පිළිබඳ නිශ්චිත එකඟතාවයකට එළඹීමට 2024 මැයි 10 දක්වා අපොහොසත්වීම මත අදාළ පාරිසරික ඇගයීම් වාර්තාව අවසන් කිරීමට විශ්ව විද්‍යාලයට නොහැකිවී තිබුණි.නිසි සැලසුමකින් තොරව ක්‍රියාත්මක නොවන තත්ත්වය මත ඒ වෙනුවෙන් වැය කරන ලද රු.3,211,376 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යනයක් සිදු කර අනාර්ථික වියදම් වළක්වා එම ව්‍යාපෘතිය නොපමාව නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගතයුතුය |
| (ආ) | අධිකාරිය විසින් කිරිගව පාලනයේ නියුතු ගොවීන්ට මහවැලි බී, සී, ඩී, එල් සහ උඩවලව කලාපවල තෘණ වගාව සඳහා අක්කර 2,802 ක් ලබාදී සත්ත්ව පෝෂණය වැඩිදියුණු කිරීමට අදාළ ක්‍රියාකාරකම්වලින් යුක්ත වැඩසටහනක් ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ඒ සඳහා පාරිසරික පරීක්ෂණ, පුරාවිද්‍යා ඇගයීම් පරීක්ෂණ හා මැනම් කටයුතු සඳහා රු.6,571,882 ක් වැය කර ඇතත් විගණිත දින වූ 2024 මැයි 10 දින වනවිටත් කිසිදු ඉඩමක් තෘණ වගාකරුවන් වෙත බෙදාදී නොතිබුණි. | මහවැලි එල් කලාපයේ යෝජිත තෘණ භූමි සංවර්ධනය සඳහා මූලික පාරිසරික පරීක්ෂණය වෙනුවෙන් ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයට රු.1,551,958 ක මුදලක් ද පුරාවිද්‍යා ඇගයීම් පරීක්ෂණයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට රු. 140,099 ක මුදලක් තෘණ වගා භූමිය මැණුම් කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට රු. 4,879,825 මුදලක් ලෙස එකතුව රු. 6,571,882 ක මුදලක් වැය කර තිබුණි.මේ වන විට තෘණ භූමි වල තෘණ වගා කිරීම සඳහා ඉඩම් කච්චේරියක් පවත්වා සුදුසුකම් ලත් කිරි ගොවින් තෝරා ගෙන ඇත. ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද 2022.11.11 දිනැති ලිපිය මගින් මහවැලි අධිකාරිය වෙතින් නව ඉඩම් බැහැර කිරීම් අත්හිටුවන ලෙස කරන ලද නියෝගයට අනුව යෝජිත සංවර්ධන කාර්යය | ශක්‍යතා අධ්‍යයන වාර්තා අනුව ව්‍යාපෘතිය ආරම්භ කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සැලසුම් කල ආකාරයෙන් ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | |
| (ඇ) | මහවැලි බී කලාපයේ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි බෝග නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අක්කර 540 ක පමණ භූමි ප්‍රමාණයක් මුතුවැල්ල වැලිකන්ද ප්‍රදේශයෙන් ලබාදීමට 2020 වර්ෂයේ සැලසුම් කර තිබුණි. මෙම ආයෝජන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් ඇගයීම සඳහා රු.2,619,000 ක කොන්ත්‍රාත්තුව කොළඹ විශ්ව විද්‍යාලය වෙත ප්‍රදානය කර ඉන් රු.2,093,200 ක් විගණිත දින වනවිට ගෙවා තිබුණි. සැලසුම් කළ වර්ෂයේ සිට විගණිත දින වූ 2024 මැයි 10 දින වනවිට වර්ෂ 03 මාස 05 ක කාලයක් ගතවී තිබුණද, කිසිදු ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මුතුවැල්ල ව්‍යාපෘතියේ පරිසර අධ්‍යාන කටයුතුවල ක්ෂේත්‍ර වැඩසටහන් ආරම්භ කිරීම සමඟ කොරෝනා වෛරසය ව්‍යාප්තිය, අනවසර පදිංචිකරුවන්ගේ ගැටලු, ජල මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනය සහ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ සැලසුම් සකස් කිරීම සඳහා කල්ගතවීම හේතුවෙන් සැලසුම් කල කාලයට වඩා අධ්‍යයන කටයුතු ප්‍රමාද වීමට බලපාන ලදි. | ශක්‍යතා අධ්‍යනය මගින් අනාර්ථික වියදම් වළක්වා ව්‍යාපෘතිය නොපමාව නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගතයුතුය. |
| (ඈ) | මහවැලි කලාපවල ගොවීන්ට ගුණාත්මක බීජ වී නිෂ්පාදනය කරදීමේ වැඩසටහනක් ආරම්භ කර අධිකාරිය සතු රත්කිඳ සහ අරලගංවිල බීජ ගොවිපොළවල් සඳහා 2021 හා 2022 වර්ෂවල අවශ්‍ය කෘෂිකාර්මික යන්ත්‍ර මිලදී ගැනීමට හා ගොවිපොළවල් සතු කමත් අළුත්වැඩියා කිරීමට රු.80,968,960 ක් වැයකර තිබුණද, ගොවිපොළවල් සතු කුඹුරු ඉඩම් සියල්ල බාහිර පාර්ශවයන් වෙත කන්න බදු ක්‍රමය යටතේ වී වගා කිරීමට ලබාදී තිබීම හේතුවෙන් මෙම වැඩසටහන වෙනුවෙන් වැය කරන ලද මුදල නිෂ්කාර්ය වියදමක්වී තිබුණි. | 2021 යල කන්නය, 2021/2022 මහ කන්නයෙන් පසුව රටේ පැවතී ආර්ථික අර්බුදය,දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් මූල්‍ය ප්‍රතිපාදන ක්‍රමිකව අඩු කිරීම මත 2022 යල හා 2022/2023 මුළු වගා භූමි ප්‍රමාණයෙන් සියයට 50 ක් කිරීමට සිදුවිය.ඉන් පසු කන්නයන් සඳහා මුළු භූමි ප්‍රමාණයම කන්න බදු ක්‍රමයට ලබා දීම සිදු කරන ලදි.කෙසේ නමුත් උක්ත වත්කම් ඵලදායී ලෙස යොදාගැනීමට සටහන් කරගන්නා ලදි. | ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමෙ හැකියාව සොයා බැලිය යුතුය. |
| (ඉ) | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මඟින් ලබාදී ඇති නිර්දේශවලට අනුව කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන ස්ථාපිත කිරීම 2023 - ඇඹුල් කෙසෙල් අපනයන ගම්මාන වැඩසටහන යටතේ කෘෂි ළිං ඉදිකිරීම වාරිමාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත වලව කලාපයේ ක්‍රියාත්මක කර තිබුණි.ඒ යටතේ කලාපයේ ළිං 200 ක් ඉදිකර තිබුණද, එම ළිං සියල්ල අනාරක්ෂිත තත්ත්වයේ විය. | කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන යටතේ කෘෂි ළිං ආශ්‍රිතව සිදුවිය හැකි අනතුරු වළක්වා ගැනීම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම කර ඇත. දීර්ඝ කාලයක් තිස්සේ කෘෂි ළිං ගොවිතැන් කටයුතු කරනු ලබන ගොවීන් සිටින නමුත් මේ දක්වා කිසිදු අනතුරක් සිදුවූ බවට අනාවරණයවී නොමැත. | කෘෂි ළිං ආරක්ෂිතව ඉදිකිරීමට අවශ්‍ය උපදෙස් හා ආධාර ලබාදියයුතුය. |
| (ඊ) | කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ මිරිස් වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අධිකාරියේ බී කලාපයේ සෙවනපිටිය කොට්ඨාශ කාර්යාලයට අයත් අක්කර 95 ක් ගොවීන් 190 දෙනෙකු අතරේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව බෙදාදී තිබුණි.ගොවීන් සඳහා බෙදාදීමට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය, ප්‍රදේශය, කාලවකවානු හා බෙදා දෙන ක්‍රමය ආදී ද ඇතුළත් අවබෝධතා ගිවිසුමක්ද අධිකාරිය හා කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය | අධිකාරිය හා කෘෂිකර්ම ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතිය අතර අවබෝධතා ගිවිසුමක් බි කලාපය වශයෙන් අත්සන් කර නොමැත. ඉඩම් බැහැර කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය විසින් උපකරණ කට්ටල ලබා දීමත් සමඟ ඉඩමේ භාවිතය සහ බදු අය කර ගැනීම පිළිබඳ සඳහන් කරමින් | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යන සිදු කර ආරම්භ කළ ව්‍යාපෘති නොපමාව නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර ඇති කරගෙන නොතිබුණි.2021 වර්ෂයේ බැහැර කරන ලද මෙම ඉඩම් වෙනුවෙන් 2021 වර්ෂයේ බදු අයකරගෙන නොතිබූ අතර, 2022 හා 2023 වර්ෂවල සිට බදු අයකිරීම ආරම්භ කර තිබුණද, ගොවීන් හා අධිකාරිය අතර විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් ගොවීන් 88 දෙනෙකුගෙන් හිඟව ඇති රු.332,500 ක හිඟ බදු මුදල් අයකර ගැනීම අවිනිශ්චිත විය. විගණිත දින වනවිට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 03 ක් ගතවී ඇතත්, අක්කර 23 ක් බෙදාදී ඇති ගොවීන් 46 ක් විසින් වගාව පිහිටුවා නොතිබුණි. තවද,මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුවී නොතිබූ අතර, දීර්ඝකාලයක සිට වැඩුනු ගස්වැල් සහිත කැලෑ ප්‍රදේශයක් වූ මෙම අක්කර 100 ක වන වගාව ඉවත් කිරීම පමණක් සිදුවී තිබුණි. | අවබෝධතා ගිවිසුමක් මහවැලි අධිකාරිය සහ ගොවි මහතා යන දෙපාර්ශවය විසින් 2022.11.05 දින අත්සන් කර ඇත.<br>සෙවනපිටිය කොට්ඨාශයට බදු පදනම මත ප්‍රතිලාභීන් 163 ක් තෝරා ගෙන ඇතත් වගා ව්‍යාපෘතිය ඇතැම් ස්ථානයන්ගේ අසාර්ථක වීම, වගා ළිං ඉදි කිරීම ප්‍රමාද වීම,සිදු කර නොමැති වීම, ඉදි කර ඇති වගා ළිංවල වියලි කාලයේදී,ප්‍රමාණවත් ජලය නොමැති වීම ගොවි මහතුන් සඳහා උපකරණ කට්ටලය නොලැබීම, ලැබීම ප්‍රමාද වීම හෝ අසම්පූර්ණ වීම වගා වාර කිහිපයක් සිදු කිරීමේදී රෝග හා පලිබෝධ පාලනය අපහසු වීමත් සමඟ බෝග මාරුවක් සිදු කිරීම හෝ කෙටි කාලීනව භූමිය අත හැරීමට සිදු වීම යන කරුණු 1 ක් හෝ කිහිපයක් ප්‍රධාන වී ඇත. | |
| (ඇ) | මහවැලි අධිකාරියේ බලප්‍රදේශවලට අයත් ජලාශවලට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් මහවැලි කලාප ආශ්‍රිතව නිෂ්පාදනය කරගැනීම සඳහා වන වැඩසටහනක් 2021 වර්ෂය තුළ ආරම්භ කර තිබුණි. ඒ අනුව සී, එච්, හුරුළුවැව සහ වලව යන කලාපවල පොකුණු පද්ධති ඉදිකිරීමට සැලසුම් කර තිබූ නමුත්, විගණිත දින වන 2024 අප්‍රේල් 28 වනවිට එච් කලාපයේ පමණක් පොකුණු ඉදිකිරීමේ කටයුතු අවසන් කර තිබුණි. සී කලාපය රු.484,121 ක්, හුරුළුවැව කලාපය රු.523,146 ක්, එල් කලාපය රු.1,036,650 ක් ද ලෙස එකතුව රු.2,043,917 ක මුදලක් මෙම අනෙකුත් කලාප 3 විසින් වැයකර තිබුණද, පොකුණු ඉදිකිරීමේ කටයුතු සැලසුම් කළ පරිදි නිමකර නොතිබුණු බැවින් වැය කරන ලද රු.2,043,917 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | එල් කලාපයේ මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 2ක් ඇහැටුගස්වැව සහ කිරිඉබ්බන්වැව ප්‍රදේශවල ස්ථාපනයට සැලසුම් කොට කිරිඉබ්බන්වැව අභිජනන මධ්‍යස්ථානයේ පොකුණු පද්ධති 6 ක් භාරා අවසන් කොට ඇත. ඇහැටුගස්වැව අභිජනන මධ්‍යස්ථානයේ පොකුනු 3ක ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.<br>සී කලාපයේ රත්කිඳ මහවැලි ගොවිපල තුල මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකයක් ඉදි කිරීමට 2021 වර්ෂයේ සැලසුම් කර මත්ස්‍ය පොකුණු ඉදිකිරීම ආරම්භ කර 2022 වර්ෂය තුලදී පොකුණු 04 ක් කපා අවසන් කරන ලදි. 2024 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන යටතේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉහත පොකුණු ද ඇතුලත් වන පරිදි ගොවිපල තුල ඉදි කිරීමට සැලසුම් කර එම කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.<br>හුරුළුවැව කලාපෙයේ 2022 වර්ෂයේදී මූලික සැලැස්මෙහි ඇති පොකුණු දෙකක් 96x42 හා | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යන සිදු කර ආරම්භ කළ ව්‍යාපෘති නොපමාව නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 80x42 ක් ඉදිකිරීමට සැලැසුම් කල ද දෙවන පොකුණ කැනීමේදී ''ස්වභාවිකව පිහිටි ගලක්'' තිබෙන බැවින් අවශ්‍ය පරිදි කැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. පළමු පොකුණේ කටයුතු අවසන් කර 2023 වර්ෂයේදී බදු පදනම මත විසිතුරු මසුන් ඇති කිරීම සඳහා ලබා දී ඇත. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ සම්පත් යොදා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඉදිරියට සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව 2024 අප්‍රේල් 22 දින වනවිට ආයෝජකයින්ගේ ව්‍යාපෘති වාර්තා පරීක්ෂා කොට සුදුසු ව්‍යාපෘති තෝරා ගතයුතු වුවත්, මේ දක්වා එම කාර්යයන් ඉටු කර නොතිබුණි. | ව්‍යාපෘති කමිටුව විසින් තාක්ෂණික ව්‍යාපෘති වාර්තා ඇගයීමට ලක් කර එම ව්‍යාපෘති කමිටු වාර්තාව 2024.05.06 දින පැවති අමාත්‍ය මණ්ඩලය පත් කල සාකච්ඡා සම්මුති කමිටුව (CANC) වෙත ඉදිරිපත් කරන ලදී.එහිදී මූල්‍ය ව්‍යාපෘති ඇගයීම සඳහා අනුමැතිය හිමි විය. 2024.08.13 දින වන විට රුස්වී ඇගයීම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත.ඒ අනුව සකස් කළ වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරින්ගේ නිර්දේශ ලබා ගැනීමට උත්සාහ කළ ද මැතිවරණ කටයුතු හේතුවෙන් නිලධාරින්ගේ කාර්ය බහුලත්වය මත එම කටයුතු මෙතෙක් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළයුතුය. |
| (ආ) | අධිකාරියට අයත් දෙමටගොඩ, බේස්ලයින් පාරේ පිහිටි හෙක්ටයාර 0.2139 ක ඉඩම හා ගොඩනැගිලි පරිශ්‍රය මේ වනවිට අතහැර දමා විනාශ වෙමින් පවතින අතර, භෞතිකව පරීක්ෂා කිරීමේදී ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි නැවත භාවිතා කළ නොහැකි අයුරින් සම්පූර්ණයෙන්ම පාහේ කැඩී බිඳී විනාශවී ගොස් ඇති බවත් මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | මෙම ඉඩම් ගොඩනැගිලි හා ගෘහභාණ්ඩ හා උපකරණ ආරක්ෂා කිරීමට මහවැලි ආරක්ෂක අංශය වෙත පවරා ඇත.තවද, 2023.08.04 වන දින 352 වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් දෙමටගොඩ, බේස්ලයින් පාරේ පිහිටි හෙක්ටයාර 0.2139 ක ඉඩම හා ගොඩනැගිල්ල ගබඩාවක් සහ වාහන අංගනයක් සඳහා ඉදිකිරීම සඳහා අභිලාෂයන් කැඳවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. | විනාශවූ හා අස්ථානගතවූ දේපල සම්බන්ධව මු.රෙ.ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඇ) | අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදී ද, ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම 2019 වර්ෂයේදී ද ඈවර කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි | මහවැලි වෙන්චර් කැපිටල් (පුද්.) සමාගම ඈවර කිරීමේ කටයුතු අවසන් කොට ඈවරකරුවන් විසින් 29 බී ආකෘතිය සමාගමේ රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත 2024.06.24 දින භාර දී සමාගමේ ගිණුම්වල පැවති සියළුම ශේෂ මහවැලි අධිකාරියේ ගිණුමට බැර කොට ඇත.ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්.) සමාගම ඈවර කිරීමේ කටයුතු සඳහා අවසාන ගිණුම් වාර්තා සකස් කරමින් පවතී. | සමාගම් ඈවර කිරීමේ කටයුතු කඩිනමින් නිමකර අවසාන ගිණුම් වාර්තා ඉදිරිපත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහවැලි අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගමේ ආයෝජන ලෙස රු. 406,389,000ක් දක්වා තිබූ අතර සමාගම එහි අනුබද්ධිත සමාගමක් ලෙසද දක්වා තිබුණි. අදාළ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේද එම සමාගම මහවැලි අධිකාරියේ අනුබද්ධිත සමාගමක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද, මහවැලි අධිකාරිය වෙනුවෙන් එකදු කොටසක් වත් සමාගම විසින් නිකුත් කර නොතිබුණි. | මහවැලි අධිකාරියේ "පශු සම්පත් සංවර්ධන අංශය" 1999 වර්ෂයේදි සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම බවට පරිවර්තනය කිරීමේදි ප්‍රවර්තකයන් ලෙස මහවැලි අධිකාරිය වෙනුවෙන් නිකුත් කල කොටස් 03 න් එක් කොටසක් ලබාගෙන ඇත. රංජිත් ගාමිණී විජේතුංග මහතා එක් කොටසක්ද (මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම), කොග්ගල ලියනගේ සිරිමෙවන් කවිරත්න මහතා එක් කොටසක්ද (මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම) ලෙස කොටස් ලබාගෙන මෙම සමාගම ලියාපදිංචි කර ඇත. සීමාසහිත පෞද්ගලික සමාගමක් බැවින් තනතුරු නාමයට කොටස් නිකුත් කල නොහැකි බැවින් ඔවුන්ගේ පුද්ගලික නමට කොටස් නිකුත් කර ඇත.මින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙනුවෙන් නිකුත් කර ඇති කොටස 2024 වර්ෂයේදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් එම්.එල්.ඩී.සී.එම්. අබේවර්ධන මහතාගේ නමට මාරු කිරීමට කටයුතු කර ඇත. එම අයදුම්පත්‍රය ඉදිරිපත් කලද අදාල කොටස් මාරු කිරිම 2024 වර්ෂයේ අවසානයට සමාගමේ වාර්ෂික ප්‍රකාශය (Annual Return) සමාගම් රේජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව සිදු කෙරේ.අනෙකුත් කොටස්කරුවන් දෙදෙනා මේවන විට මියගොස් ඇත. මෙම කොටස් පවරාගැනීමට වාණිජ මහාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කල යුතු වේ. ඒ සඳහා ඉහතින් හිටපු අධ්‍යක්ෂ ජනරාල් නමට මාරු කරන ලද කොටස ලියාපදිංචි කර අවසන් විය යුතුව පවතින බව දන්වමි. | අධිකාරිය නමින් කොටස් නිකුත් කළයුතුය. |
| (ඉ) | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොඩ, වාරි සහ වර්ෂාපෝෂිත ලෙස 2023 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් හෙක්ටයාර් 157,843ක් කට්ටි 315,529 ක් වශයෙන් බැහැර කර තිබූ නමුත්, කට්ටි 110,902 ට ප්‍රදාන පත්‍ර ලබාදීමට අපොහොසත්වී තිබූ අතර, එය සියයට 35 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.එසේම රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ, නිවාස, ආයෝජන ව්‍යාපෘති, විහාරස්ථාන සහ රාජ්‍ය ආයතනවලට අදාළව 2023 දෙසැම්බර් 31 දින වනවිට ඉඩම් හෙක්ටයාර 18,766 ක් කට්ටි 24,735ක් වශයෙන් බැහැර කර තිබූ නමුත් ඉන් කට්ටි 19,657 ක් සඳහා දීර්ඝකාලීන දීමනා පත්‍ර, නිදහස් දීමනා පත්‍ර ලබාදීමට මහවැලි අධිකාරිය අපොහොසත්වී තිබුණි. එය ප්‍රතිශතාත්මකව සියයට 79 ක ප්‍රතිශතයක් | ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බැහැර කරන ලද ඉඩම් සඳහා ප්‍රදානපත්‍ර ලබාදීමට ප්‍රතිශතයක් වශයෙන් සියයට 35 ක ප්‍රමාණයක් සඳහන්ව ඇත. විවිධ ගැටළු තත්ත්වයන් නිසා ප්‍රදානපත්‍ර ලබාදීමට නොහැකිව ඉතිරි වී ඇත. අවිධිමත් ලෙස අන්සතු කිරීම, සංවර්ධනය කර නොතිබීම, නීතිමය ගැටළු, පවුල් ආරවුල්, ඉඩම් අයිතියේ ගැටළු මේ සඳහා හේතුවී ඇත. දීමනා පත්‍රයක් ලබාදීම සඳහා 2023 වර්ෂයේ අවසන් කාර්තුවේ සිට ක්‍රියාකරමින් ඇත.ඒ අනුව සියළුම මහවැලි ඉඩම් කොටස් සඳහා එකී දීමනාපත්‍ර ලබාදිය යුතුව ඇත.රජයේ ඉඩම් ආඥාපනත යටතේ දීර්ඝකාලීන බදුකර ලබාදීම සඳහා බදු කරුවන් විසින් හිඟයකින් තොරව බදු ගෙවා තිබීම,අදාල ඉඩම් කොටස් මැන | දීමනා පත්‍ර ලබාදීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙන තිබුණි. | මායිම් ගල් දමා පිඹුරුපත් පිළියෙල කර මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් රේඛා චිත්‍ර ලබා ගැනීමෙන් අනතුරුව හා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු වටිනාකම් ලබා ගෙන බදුකර ලබාදීම සිදු කරනු ලබයි .මෙම කාර්යයේදී ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ. | |
| (ඊ) | වරණීය පදනමින් ඉඩම් බැහැර කිරීම | | |
| | 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන ආඥා පනතින් සංශෝධිත ඉඩම් ආඥා පනතෙහි 20(ආ) වගන්තිය අනුව “මහජන යහපත” වශයෙන් දක්වමින් අමාත්‍යවරුන්ගේ පුද්ගලික ලැයිස්තු සඳහා ඉඩම් බැහැර කර තිබීම නිරීක්ෂණය වුණි. තවද, 1947 අංක 08 දරන ඉඩම් ආඥා පනතේ 21 (i) යටතේ ඉඩම් බැහැර කිරීමටත් 21 (ii) යටතේ කටයුතු කිරීමකින් තොරව ජනාධිපතිවරයාගේ හා අමාත්‍යවරුන්ගේ පුද්ගලික ලැයිස්තු පදනම් කරගෙන ඉඩම් බැහැර කර තිබුණි. විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවේදී 1998 සිට 2022 දක්වා කාලය තුළ සී කලාපයේ පුද්ගලයින් 395 දෙනෙකු වෙතද, ඊ කලාපයේ පුද්ගලයින් 91 දෙනෙකු වෙතද, එසේ වරණීය පදනම මත ඉඩම් බැහැර කිරීමට තේරීම් ලබා දී තිබුණි. | රජයේ ඉඩම් අඥා පනතේ ඉඩම් රෙගුලාසි 21(1) යටතේ බදුදීමටත්, 21 (2) යටතේ දැන්වීමක් පල කර සිටීමට ද අමාත්‍යවරයාට බලතල ඇත. එසේ වුවත් රජයේ ඉඩම් අඥා පනතේ “අමාත්‍යවරයා විසින් වෙනත් ආකාරයට නියෝග කර ඇත්නම් මිස වරණීය ප්‍රදාන පත්‍රයක් හෝ බදුකරයක් නිකුත් කිරීමට අදහස් කරන සෑම විටකම ඒ පිලිබඳව නිවේදනයක් 21 (2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ ගැසට් පත්‍රයේ පලකළ යුතුය’’යන්නෙන් ගැසට් පත්‍රයෙහි පළ නොකර සිටීමේ බලතල දක්වා ඇත. | වරණීය පදනමින් ඉඩම් බැහැර කිරීම රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව මහජන යහපත සඳහාම පමණක් සිදු කළයුතුය. |
| (උ) | LC/144 අවසර පත්‍ර නිකුත් කරනු ලැබූ වික්ටෝරියා කලාපයේ කොත්මලේ කොට්ඨාශයට අයත් තම්මියට, බෙල්ටන්, අක්කරමලේ, රිවර්සයිඩ් ජනාවාසවලට අයත් ගොවි පංතියේ පුද්ගලයින් 39 දෙනෙකුගේ තේරීම් ලේඛන සොයාගැනීමට නොහැකිවීම, වසර 40 කට ආසන්න කාලයක් ඔවුන්ට ප්‍රදාන පත්‍ර ලබාදීමට නොහැකිවීම නිසා එම පුද්ගලයින්ට ප්‍රදාන පත්‍ර ලබාදීමේ අරමුණින් පිළියෙල කරනු ලැබූ ලැයිස්තු තුළ 2000, 2002, 2003, 2004, 2012, 2014 හා 2017 යන වර්ෂවලදී නිකුත් කරන ලද LC/144 අවසර පත්‍ර හිමි පුද්ගලයින්ගේ නම්ද ඇතුළත්වීම මත ප්‍රදාන පත්‍ර නිකුත් කිරීමට පිළියෙල කරන ලද මෙම අවසාන ලේඛනයේ නිරවද්‍යතාවය පිළිබඳ විගණනයට සෑහීමකට පත්වීමට නොහැකි විය. | කොත්මලේ කොට්ඨාශයේ නිලධාරින් විසින් ක්ෂේත්‍රය සහ කාර්යාලීය ලිපිගොනු පරික්ෂා කර තොරතුරු ලබා ගෙන 2000, 2004, 2012 හා 2014 වර්ෂවල නිකුත්කර ඇති අවසරපත්‍රවල තොරතුරුද මෙම ලේඛනවලට ඇතුලත් කර තිබුණි. එම අයට අදාල තොරතුරු කාර්යාලීය ගොනුවල සොයා ගැනීමට නොහැකි වී ඇත. කෙසේ නමුත් කොත්මලේ කොට්ඨාසයට අයත් තම්මිටිය, බෙල්ටන්, අක්කරමලේ හා රිවර්සයිඩ් ජනාවාසවලට අයත් ගොවිපන්තියේ 39 කගේ තේරීම් ලේඛන මේ වන විට සොයා ගෙන එම ඉඩම් විධිමත් කිරිම සඳහා වූ එකී ලේඛණ අදාල ඇමුණුම්ද සහිතව නේවාසික ව්‍යාපාර කළමනාකරු ඉදිරි අනුමැතීන් සඳහා මේ වන විට අධ්‍යක්ෂ (ඉඩම්) වෙත යොමුකර ඇති බව දැනුම් දී ඇත. | ලේඛන පිළියෙල කර ඉඩම් ලබාදී නොමැති පුද්ගලයින් හට ඉඩම් ලබාදීම කළයුතුය. |
| (ඌ) | වික්ටෝරියා කලාපයේ අඹකොටේ ප්‍රදේශයේ පේළි නිවාසවල පදිංචි ප්‍රධාන පවුල්, අනු පවුල් සහ අත්කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් විකල්ප ඉඩම් නොලැබීම හේතුවෙන් ඉඩම් ඉල්ලා ඇති පුද්ගලයින් | 2017 සැප්තැම්බර් 29 වන දින තේරීම් ලේඛනයට අනුව පේළි නිවාසවල පදිංචිකරුවන් 13 ක්ද අනු පවුල් 26 ක්ද අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් පදිංචි ඉඩම් නොලැබුණු ඉල්ලුම්කරුවන් 27 ක්ද | රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව තේරීම් ලබාදී ඇති |

| | | | | |
|---|---|---|---|---|
| | | සඳහා පර්චර්ස් 10 ක් බැගින් ඉඩම් ලබාදීමට 2017 සැප්තැම්බර් 29 දින අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියද ලැබී තිබුණි. එම පාර්ශවයන්ට තේරීම්ලාභීත්වය ලබාදී මේ වනවිට වසර 06 කට ආසන්න කාලයක් ගතවී තිබුණද ප්‍රධාන පවුල් 86 කටද අත්පත් කරගත් ඉඩම් වෙනුවට පදිංචි ඉඩම් නොලැබුණු ඉල්ලුම්කරුවන් 23 කටද ඉඩම් බෙදාදී නොතිබූ නමුත්, පුද්ගලික වශයෙන් ජනාධිපති, අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් හා අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් කරන ලද ඉල්ලීම්වලට තේරීම් 37 ක් ලබාදීමට කටයුතු කර තිබූ බවද නිරීක්ෂණය විය. | යනුවෙන් හඳුනාගෙන තිබුණු අතර 2024 මාර්තු 22 දින වන විට ජෙළි නිවාසවල පදිංචිකරුවන් 27 කටද අනු පවුල් 26 කටද අත්පත් කර ගත් ඉඩම් වෙනුවට ඉඩම් 04 කටද ඉඩම් කොටස් ලබා දී ඇත. නමුත් බැහැර කිරීමට යෝජිත ඉඩම්වලින් කොටසක් පර්චස් 06 ට වඩා අඩු වීමද, කොටසක් ජලාශ රක්ෂිතයේ මීටර් 100 සීමාවට අයත්වීම හේතුවෙන් ද බැහැර කිරීමට නොහැකි විය.<br>එසේ වුවත් විගණන විමසුමේ දක්වා ඇති ආකාරයට විවිධ ඉල්ලීම් වලට අනුව ඉඩම් කොටස් 37 ලබා දීමට කටයුතු කර තිබූ බව දක්වා ඇතත් ලේඛන වලට අනුව ඉඩම් කොටස් 05 ක් පමණක් බැහැර කිරීමට කටයුතු කර ඇත. | පුද්ගලයින් හට කඩිනමින් ඉඩම් ලබාදීමට කටයුතු කළයුතුය. |
| (ඒ) | ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීම | | | |
| | (i) | මහවැලි ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොතිබුණු අතර, සීමිත සම්පතක් වන ඉඩම් මානව අවශ්‍යතා අනුව මනා විනයක් ඇතිව,විනිවිදභාවයකින් යුතුව කෘෂිකර්මාන්තය, පදිංචිය, කර්මාන්ත හා සංචාරක මෙන්ම පාරිසරික සමතුලිතතාවය සඳහා වඩාත් සැලසුම්සහගත හා විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ බැහැර කර නොතිබුණි. | මහවැලි අධිකාරි පනතේ පැවරී ඇති බලතල සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ ආයෝජන ඉඩම්, සුදුසු ආයෝජකයින් තෝරා විධිමත් ලේඛණ අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ආයෝජකයින් වෙත බැහැර කර ඇත.<br>විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත ආයෝජන ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් මගින් තාක්ෂණික, සමාජීය හා මූල්‍ය නිර්ණායක ඔස්සේ ව්‍යවසායකයින් ඇගයීම භෞතික සැලසුම් නිර්දේශය යටතේ රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව විද්‍යාත්මක ක්‍රමවේදයක් මත ඉඩම් බැහැර කිරීමට කටයුතු කර ඇත. | මහවැලි ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දී භෞතික සැලසුම් නිර්දේශ අනුගමනය කර ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව විද්‍යාත්මක ක්‍රමවේදයක් මත ඉඩම් බැහැර කළයුතුය. |
| | (ii) | 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වගන්තිය අනුව ඉඩම් පරිහරණය සඳහා මූලික ව්‍යුහාත්මක සැලසුම් සකස් කර තිබුණද, 2011 වර්ෂයෙන් පසු වර්තමාන ඉඩම් පරිහරණ අවශ්‍යතා අනුව එම ව්‍යුහාත්මක සැලසුම් යාවත්කාලීන කර නොතිබුණි. | මහවැලි කලාප සඳහා ව්‍යුහාත්මක සැලසුම් සැකසීම අනාගත වර්ෂ 20 ක පමණ සංවර්ධන අවශ්‍යතා සැළකිල්ලට ගෙන සිදුකරනු ලැබේ. ඒ අනුව බී කලාපය සඳහා 2011 වර්ෂයේදී සිදුකර ඇති සංශෝධනද වසර 20 ක කාලීන අවශ්‍යතා සැළකිල්ලට ගෙන සිදුකර ඇති බැවින්, එම ව්‍යුහාත්මක සැලසුම්වලට අනුගතව කාලීන අවශ්‍යතා සැළකිල්ලට ගෙන නව ඉඩම් ඉල්ලීම් වලට අදාලව ඉඩම් පරිහරණ සැලසුම් සංශෝධනය කිරීම කලාපීය භෞතික සැලසුම් කමිටු මගින් දෙනු ලබන නිර්දේශ මත පදනම්ව සිදු කිරීම අනුමත ක්‍රමවේදය වේ. | ඉඩම් පරිහරණ අවශ්‍යතා අනුව එම ව්‍යුහාත්මක සැලසුම් යාවත්කාලීන කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | කෘෂිකාර්මික හා ව්‍යාපාර සංවර්ධන කාර්යයන් වෙනුවෙන් දිගුකාලීන බදු පදනම මත මහවැලි බලප්‍රදේශවල ඉඩම් ලබාදීමේදී ලබාදිය හැකි ඉඩම් ප්‍රමාණය,ප්‍රදේශ අනුව සුදුසු ආයෝජන ව්‍යාපෘති, ලබාදිය හැකි අවම හා උපරිම ඉඩම් ප්‍රමාණය පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කළ නිශ්චිත හා පැහැදිලි ප්‍රතිපත්තියක් නොතිබුණි. ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීමේදී පුද්ගලයින්ගේ ඉල්ලීම් අනුව ඉඩම් ලබාදී තිබුණ අතර, ආයෝජකයින් තෝරා ගැනීම පිළිබඳ නිර්නායක හඳුනාගෙන නොතිබුණි. | ආයෝජන ව්‍යාපෘති සඳහා සුදුසු ප්‍රදේශ ව්‍යුහාත්මක සැලසුම් අනුව හඳුනාගැනීම 2021 වර්ෂයේදී සිදුකර ඒ අනුව සී කලාපය, වලව කලාපය හා බී කලාපය යන කලාප වල එම හඳුනාගත් ඉඩම් සඳහා පුවත්පත් මගින් අභිලාෂයන් කැඳවා සුදුසු අයෝජකයින් තෝරාගැනීමට සැලසුම් කර ඇත. ඊට අමතරව පුද්ගල ඉල්ලීම් අනුව කාලප මට්ටමින් විසිරී පවතින කුඩා ඉඩම් කැබලි කලාපීය භෞතික සැළසුම් කමිටු නිර්දේශ අනුව වෙන්කර ලබාදීමද සිදුකරනු ලබයි. ආයෝජකයින් තෝරාගැනීම පිළිබඳ නිර්ණායක මත පදනම්ව ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් මගින් ආයෝජකයා පිළිබඳ ඇගයීම සිදුකර එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආයෝජකයන් වෙත ඉඩම් බැහැර කරනු ලැබේ. | මහවැලි ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දියයුතුය. |
| (ඒ) | කලාප 05 ක වසර 30 ක කාලයකට බදුදී තිබූ ඉඩම් හෙක්ටයාර 421.22 කට අදාළ බදු කාලය විගණිත දින වන 2024 මැයි 10 වන විට අවසන්වී වසර 06 සිට වසර 13 දක්වා කාලයක් ගතවී තිබූ නමුත්, එම බදු ගිවිසුම් අලුත් කිරීමට හෝ අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම දීර්ඝකාලීන බදුකර අවසන්වූ ඉඩම් සම්බන්ධයෙන් බදුකරය නැවත නිකුත් කරන්නේද, අවලංගු කරන්නේද, ඉඩම නැවත තක්සේරු කරන්නේද හෝ නැවත අධිකාරිය වෙත පවරා ගන්නේද යන කරුණු පිළිබඳව බදු කාලපරිච්ඡේදය අවසන්වීමට ප්‍රථමයෙන් කළමනාකාරිත්වය විසින් තීරණය කරද නොතිබුණි | දීර්ඝකාලීන බදු දුන් ඉඩම්, මුල් වසර 30 බදු කාලය නිමවීමෙන් පසු පවතින සංවර්ධන තත්ත්වය සලකා එම ඉඩම්ලාභීන් වෙතම තවත් වසර 30 ක් සඳහා බදු දීම සිදු කෙරේ. ඒ අනුව මුල් බදු කාලය අවසන් බදුකර සඳහා දෙවන බදුකාලයට අදාල බදුකර 2022.11.11 දින දක්වා ලබාදී ඇත. එහෙත් 2022.11.11 දිනැති ජනාධිපති ලේකම්ගේ ලිපිය මඟින් නව ඉඩම් බැහැර කිරීම් අත්හිටුවන ලදි. ඉන්පසු ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු උපදෙස් පරිදි මුල් වසර 30 බදු කාලය අවසන් වූ නැවත බදු අනුමැතිය ලබාගැනීම සඳහා අදාල ලේඛන ජනාධිපති ලේකම් කාර්යාලය වෙත විධිමත් ආකෘතියක් මඟින් යොමු කර ඇත. ඒ අනුව අනුමැතිය ලද පසු මුල් බදු කාලය අවසන් බදුකර සඳහා බදුකර ලබාදීමට හැකියාවක් පවතී. | බදු කාලය අවසන්වීමත් සමඟ නව බදු ගිවිසුම්වලට එළඹීය යුතුය. |
| (ඔ) | කෘෂි ව්‍යාපාර පුද්ගලික සමාගමකට බී කලාපයේ සිද්ධපුර ගොවිපලෙන් අක්කර 500 ක් හා මුතුවැල්ල ගොවිපලෙන් අක්කර 500 ක් ලබාදී ඉඩම සංවර්ධනය නොකිරීම යන කාරණය පදනම් කරගෙන 2021 සැප්තැම්බර් 29 දින බදු බලපත්‍රය අවලංගු කර තිබුණි. එම ඉඩමෙන් අක්කර 400 ක් පමණක් වෙනත් ආයෝජකයින් 16 දෙනෙකු වෙත කෙටිකාලීන බෝග වගාව සඳහා එක් අයෙකුට අක්කර 25 බැගින් වසරක කාලයකට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත කන්නයකට රු.4,000 බැගින් කන්න බදු තීරණය කර ඇතත්, ඒ තුළ වූ සමහර ගොඩනැගිලිද සමඟ බදුදී ඒ සඳහා වෙනම මාසික කුලියක් අය කර නොතිබුණි.මෙම | සිද්ධපුර ගොවිපලෙන් හෙක්ටයාර 182.188 ප්‍රමාණයක් පුද්ගලික සමාගමක් වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත බැහැර කර ඇත. ඉතිරි ඉඩම් කොටස් මේ වන තෙක් විධිමත්ව බදු දී නොමැති අතර ජනාධිපති ලේකම්වරයාගේ 2022.11.11 දිනැති ලිපිය මගින් මහවැලි අධිකාරිය තුළ ඉඩම් බැහැර කිරීම අත්හිටුවා ඇත.<br>කෘෂි ව්‍යාපාර පුද්ගලික සමාගම වෙත පෙර බැහැර කර තිබූ මුතුවැල්ල ගොවිපලෙන් කෙටිකාලීන බෝග වගාව සඳහා පුද්ගලයන් 17 දෙනෙකු වෙත හෙක්ටයාර 10 ක් බැගින් ලබා දී ඇති අතර එයින් පුද්ගලයන් 07 දෙනෙකු ඉඩම තුල සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී. | බදු ගිවිසුම්වලට එළඹීම, ඉඩම් ලබාදීමේ පරමාර්ථ ඉටුවීම, ඉඩම් සංවර්ධනය, පසු විපරම හා සංවර්ධනය නොකරන ඉඩම් නැවත පවරා ආයෝජකයින්ගේ බදු අයිතිය අවලංගු කර හිඟ බදු මුදල් අයකර ගැනීම නෛතික ක්‍රියාමාර්ග ගැනීම |

| | | | |
|---|---|---|---|
| | ආයෝජකයින් තෝරාගන්නා ලද ආකාරය විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම වාර්තාවේ දින වන විට ආයෝජකයින් 09 දෙනෙකුම වර්ෂයට අදාල බදු මුදල් ගෙවා නොතිබූ  අතර භූමිය එකහ වු පරිදි සංවර්ධනය කර ද නොතිබුණි. | සංවර්ධනය නොකරන ලද ආයෝජකයින් 09  දෙනෙකුගේ ඉඩම් සංවර්ධනය කිරීම අවලංගු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා කන්න බදු අයකර ගන්නා ආකාරය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා තෙක් අක්. 01 ක් සඳහා රු.4000 බදු මුදලක් අයකර ගන්නා ලෙස අනුමැතිය ලබා දී  ඇත. තාවකාලිකව වගා කටයුතු සඳහා ඉඩම් බැහැර කරන ලද පුද්ගලයන්ගේ අවසර ලද කාලය  2023.03.31දිනෙන් අවසන් වී ඇති බැවින් ඒ සඳහා කඩිනමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කරගන්නා ලදි. | කළ යුතුය. |
| (ඕ) | ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන අනුව ආයෝජන ව්‍යාපෘතිවලින් 2023 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු වු බදු මුදල රු.165,524,701ක්වූ අතර ඉන් රු.22,993,596ක් වසර 05කට අධික කාලයක සිට අයකර ගැනීමට නොහැකිව තිබුණි. | මේ පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ක) | ඉඩම් අනවසර භාවිතය | | |
| | 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතෙහි 180 වගන්තිය අනුව අනවසර අල්ලා ගැනීම් සිදුනොවීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබූ අවස්ථා. | | |
| | (i) කලාප 08 කට අදාලව හෙක්ටයාර 897ක ඉඩම්  ප්‍රමාණයක් වර්තමානය වන විට අනවසර භුක්ති කරුවන් 4,616 දෙනෙකු විසින් භුක්ති විඳිමින් පැවතුණද, උක්ත විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අනවසරකරුවන් යටතට, මෙතෙක් බෙදා දී ඇති ඉඩම් අන්සතු කිරීමෙන් පසුව මුල් ඉඩම්ලාභීයාගෙන් අවලංගු කිරීමෙන් භුක්තිවිඳින අයවලුන්ද ඇතුලත් වන අතර එම පුද්ගලයින් ඉඩම් කච්චේරි වලට යොමු කිරීමෙන් තේරීම් සිදු කරන අතර අනෙකුත් අනවසර පුද්ගලයින් සඳහා සන්තකය ආපසු ලබා ගැනීම පනත යටතේ කටයුතු කරනු ලබයි. මේ සඳහා අස්කිරීමේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීම ආදී කටයුතු සඳහා යම් කාලයක් ගතවනු ඇත. ඒ අතර රජයේ ඉඩම් අනවසරකරුවන්ගෙන් ආරක්ෂාකර ගැනීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා විවිධ අවස්ථාවල ලිපි මගින් දැනුවත් කිරීම සිදුකර ඇත. | කඩිනමින් අනවසරකරුවන් ඉවත් කළයුතුය. |
| | (ii) චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව අනවසර නියමානුකූල කිරීමේ ප්‍රතිපත්තිය 2008 ජුනි 13 දින සිට අත්හිටුවීමට තීරණය කර තිබුණද, 2010 වර්ෂයෙන් පසු කලාප 08ක අනවසර නියමානුකූල කිරීමේ පරීක්ෂණ 151 ක් සඳහා සහභාගි වු | අනවසරකරුවන් යටතට, මෙතෙක් බෙදා දී ඇති ඉඩම් අන්සතු කිරීමෙන් පසුව මුල් ඉඩම්ලාභීයාගෙන් අවලංගු කිරීමෙන් භුක්තිවිඳින අයවලුන්ද ඇතුලත් වන අතර එම පුද්ගලයින් ඉඩම් කච්චේරි වලට යොමු කිරීමෙන් තේරීම් සිදු කරන අතර අනෙකුත් අනවසර පුද්ගලයින් සඳහා සන්තකය | චක්‍රලේඛ ප්‍රකාරව ඉඩම් ලබාදීම සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පුද්ගලයින්ට තේරීම් 16,135ක් ලබා දී තිබුණි. | ආපසු ලබා ගැනීම පනත යටතේ කටයුතු කරනු ලබයි. මේ සඳහා අස්කිරීමේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීම ආදී කටයුතු සඳහා යම් කාලයක් ගතවනු ඇත.අනවසර නියමානුකූල කිරීමේ පරීක්‍ෂණ කිරීම සිදු කර නොමැති අතර ඉඩම් කච්චේරි මඟින් පමණක් පරික්ෂණ පවත්වා අදාල පුද්ගලයින් තෝරා ගෙන ඇත. | |
| (iii) | නීත්‍යානුකූල තේරීමක් නොමැතිව අවිධිමත්ව අන්සතු කරන ලද හෝ පුද්ගලයින් විසින් අල්ලා ගන්නා ලද ඉඩම් එම පුද්ගලයන්ටම නීත්‍යානුකූලව පැවරීම සඳහා අනවසර නියමානුකූල කිරීමේ ඉඩම් කච්චේරි තුළින් කටයුතු කිරීම විධිමත් ක්‍රමවේදය ඔස්සේ ඉඩම් ලබාගැනීමට මහජනතාවගේ ඇති අභිප්‍රේරණය පහළ දැමීමටත්, ජනතාව අතර අනවශ්‍ය ගැටුම් නිර්මාණයවීමටත් හේතුවී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී සී කලාපයට හා වික්ටෝරියා කලාපයට අයත් ප්‍රදේශවල පමණක් කට්ටි නොකරන ලද හෙක්ටයාර 177.95 ක් පුද්ගලයින් 550 දෙනෙකු වාණිජ, පදිංචි හා වගා කටයුතු වශයෙන් අනවසරව භුක්ති විඳිමින් පැවතුණි. | ඉඩම්ලාභීන් වෙත අවසරපත්‍ර මත ඉඩම් බැහැර කර ඇති අවසථාවේ දී, අවසර පත්‍ර ලාභීන් විසින් අවසර පත්‍රයේ කොන්දේසි කඩ කර ඇති විට දී ඉඩම් සංවර්ධන ආඥා පනතේ ප්‍රතිපාදන මත එම අවසර පත්‍ර අවලංගු කර, භුක්තිකරු ඉඩම් කච්චේරිය මඟින් තෝරා ගැනීමට පනතේ ප්‍රතිපාදන අනුව කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටින අතර එම තෝරා ගැනීම අනවසර නියමානුකූල කිරීමක් වශයෙන් නොසැලකෙන අතර අවිධිමත් භුක්තිය විධිමත් කිරීමක් ලෙස සැලකිය යුතු බව ද තවදුරටත් සඳහන් කරමි. කට්ටි නොකල රජයේ ඉඩම්වලට අනවසරකරුවන් ඇතුල්වීම වැලැක්වීමට කටයුතු කරන අතර මීට පෙර සඳහන් කර ඇති පරිදි අනවසරකරුවන් වෙත සන්තකය ආපසු ලබා ගැනීමේ පනත අනුව කටයුතු කරන බව වැඩිදුර දන්වා සිටිමි. | අනවසරකරුවන් ඉවත් කර චක්‍රලේඛ ප්‍රකාරව ඉඩම් ලබාදීමේ කටයුතු සිදු කල යුතුය. |
| (iv) | අධිකාරියට අයත් බී, සී,ඩී, ජී, එච්, එල්, ඊ, හුරුළුවැව, වලව යන කලාපවල සහ ජලාශ හා මෙහෙයුම් අංශය යටතේ පවතින ජලාශ රක්ෂිතවල 2024 මැයි 20 දින වනවිට අනවසරයෙන් භුක්ති විඳින පුද්ගලයින් 2,544 ක් විය. | | |
| | a අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා කලාප මට්ටමින් කට්ටි 910 ක් සඳහා ආයතනික ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර, කට්ටි 145 ක් වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි.මේ අනුව අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් කට්ටි 1,489 ක අනවසරකරුවන් ඉවත් කිරීම වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් විගණිත දින වන 2024 මැයි 20 දින වනවිටත් ගෙන නොතිබුණි. | අභ්‍යන්තර ජලාශ හා වෙනත් ජල මූලාශ්‍ර වල අනවසර කටයුතු වැලැක්වීමට කලාපයේ ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය උල්හිටිය/ රත්කිඳ ජලාශ රක්ෂිතවල අනවසර කටයුතු පාලනය කරනු ලබයි.ඒකකයේ ඒකක කළමනාකාර සෘජුවම මැදිහත්ව කොට්ඨාස කළමණාකාර හා ඉඩම් නිළධාරීගේද සහයෝගය ලබා ගනු ලබයි. | අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| b | අධ්‍යක්ෂ (ජලාශ හා මෙහෙයුම්) යටතේ පවතින ජලාශ රක්ෂිතවල අනවසර පදිංචිකරුවන් 150 දෙනෙකු ඉවත් කිරීම සඳහා ආයතනික ක්‍රියාමාර්ගද 185 දෙනෙකු වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ගද ගෙන තිබූ අතර, ඉතිරි 67 දෙනා ඉවත් කිරීම සඳහා විගණිත දින වන 2024 මැයි 20 දින වනවිටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මයුරපුර කොට්ඨාසයේ වන අලි කළමණාකරණ රක්ෂිත ප්‍රදේශය සඳහා අනවසර වලක්වා ගැනීමේදී ඇතිවන ප්‍රායෝගික අපහසුතා මැඩලීම සඳහා අනවසර වලක්වා ගැනීමේ ඒකකයට ක්ෂේත්‍ර රාජකාරි හා ආරක්ෂක කටයුතු ක්‍රියාවේ යොදවා ඇත. එම ඒකකය පිහිටුවීමත් සමඟ අනවසර අල්ලා ගැනීමේ කටයුතු විශාල වශයෙන් පාලනය වී ඇත.පාලනය කර ගත නොහැකි මට්ටමේ අනවසර අල්ලා ගැනීම් සිදුවන අවස්ථාවලද මෙම අනවසර ඒකකය වලව කලාපයේ අනෙකුත් කොට්ඨාස සඳහාද කැඳවනු ලබයි.<br><br>වැව් හා රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත අනවසර පදිංචි කරුවන් සඳහා අධිකරණ ක්‍රියා මාර්ග ගෙන පුද්ගලයන් 76 දෙනෙකුට එරෙහිව නඩු පැවරීමේ කටයුතු සිදු කරමින් පවතී.<br><br>ඩී කලාපයේ බිසෝපුර කොට්ඨාසයේ 2009 ඉඩම් පරිපාලනය භාර ගන්නා විටත් කුඩා වැව් සහ අමුණු ස්ථාන 21 තුල අක්කර ¼ සිට අක්කර 05 දක්වා විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්තව රජය සතු ඉඩම් භුක්ති විඳින පුද්ගලයින් 851 සංඛ්‍යාවක් හඳුනාගෙන ඇත. විවිධ සමජ ආරවුල් සහ පවුල් ආරවුල් ඇතිවීමේ තත්ත්වයන් නිරික්ෂණය වන බැවින්, මේ වන විටත් එම ගැටළු විසඳීමට කලාපයේ ඉඩම් අංශය සහ ඉඩම් පරිහරණ සැලසුම් අංශයෙන් මඟින් පිඹුරුපත් සකසමින් පවතී. | අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කළයුතුය. |
| c | මහවැලි සී කලාපයේ වැව් රක්ෂිත ආශ්‍රිතව අක්කර 137.175 ක පුද්ගලයින් 219 ක් උපරිම වසර 40 දක්වා කාලයක් තිස්සේ ද, වික්ටෝරියා කලාපයේ ජලාශ රක්ෂිත ආශ්‍රිත අක්කර 23 ක පුද්ගලයින් 237 ක් උපරිම වසර 30 දක්වා කාලයක් තිස්සේ ද, වලව කලාපයේ වැව් හා ජලාශ රක්ෂිත ආශ්‍රිතව අක්කර 645 ක පුද්ගලයින් 1042 ක් උපරිම වසර 45 දක්වා කාලයක් තිස්සේද අනවසරයෙන් ස්ථිර බෝග හා බෝග වගා කරමින්, ස්ථිර ගොඩනැගිලි ඉදිකරමින් භුක්ති විඳිමින් පැවතුණ මෙම අනවසර | ප්‍රධාන වෙලි හා ජලාශ මෙහෙයුම් අංශය ජලාශ රක්ෂතවල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ කටයුතු වලට අදාලව නෛතිකව ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර 2024 ,මැයි 20 දින සිට මේ දක්වා අනවසර පදිංචිකරුවන් 13ක් ඉවත් කිරීම සඳහා නඩු කටයුතු වලට එළඹ ඇති බව සඳහන් කරමි. | අධිකාරිය සතු සංවේදී ප්‍රදේශ ආරක්ෂා කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාවිතකරුවන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය අධිකාරිය තුළ මන්දගාමී ස්වරූපයකින් ක්‍රියාත්මකව තිබුණි. | | |
| d | වික්ටෝරියා කලාපයේ ජලාශ රක්ෂිතවල වන වගාව සුරක්ෂිත කිරීම සඳහා අධිකාරිය අත්පත් කරගත් ඉඩම් අක්කර 20.19 ක් පුද්ගලයින් 181 දෙනෙකු විසින් වසර 30 ක් තිස්සේ අනවසරයෙන් භුක්ති විඳීම ඉහත අනවසර භාවිතයට ඇතුළත්ව තිබුණි. | දුල්ගොල්ලයාය, 1987 වර්ෂයේදී වන වගා කටයුතු සඳහා අත්පත් කර ගත්තද අනවසරකරුවන් 1994 වර්ෂය වනවිට අවිධිමත් සංවර්ධනය හේතුවෙන් ඉවත් කිරීම ප්‍රායෝගික නොවන අතර අත්පත් කරගත් කාර්යයෙන් පරිබාහිරව බැහැර කල නොහැකි හෙයින් විධිමත් කිරීම හැකියාවක්ද නොමැත. ක්ෂේත්‍රයේ තත්ව මිණුමක් කර අදාල තොරතුරු සමග අධ්‍යක්ෂ (ඉඩම්) වෙත යොමු කර ඇත. | අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කළයුතුය. |
| (v) | සී කලාපයේ ගිරාදුරුකෝට්ටේ ඒකකයේ උල්හිටිය ජලාශයට යාබදව අධිකාරිය විසින් පෞද්ගලික සමාගමකට ආයෝජන ව්‍යාපෘතියක් සඳහා බැහැර කර ඇති අක්කර 511.52 ක ඉඩම්වලට මැදිව පිහිටි අක්කර 50 ක පමණ භූමි ප්‍රමාණයක අයිතිය ප්‍රකාශ කරමින් පෞද්ගලික පාර්ශවයක් විසින් වගාවක් පිහිටුවීම සඳහා 2014 මාර්තු 15 දින සිට 2024 මාර්තු 14 දින දක්වා වූ වසර 10 ක කාලසීමාවකට පෞද්ගලික සමාගමකට රු.6,522,100 ක මුදලකට බදුදී තිබුණි. මෙම භූමියේ අයිතිය පිළිබඳව තොරතුරු පරීක්ෂා කර අදාළ පුද්ගලයා අනීතිකව ඉඩම හිමිකර ගෙන සිටී නම් නැවත අධිකාරිය වෙත ලබාගැනීමටද රජයට සිදුවී ඇති පාඩුව ඔහුගෙන් අයකර ගැනීමටද හෝ රක්ෂිතය තුළ ඇති වෘක්ෂලතා ඉවත් කිරීම පිළිබඳව හෝ වගාකරුට විරුද්ධව කිසිදු නෛතික ක්‍රියාමාර්ගයක් විගණිත දින වූ 2024 අප්‍රේල් 28 දක්වා ගෙන නොතිබුණි. | මහවැලි සී කලාපයේ ගිරාඳුරුකෝට්ටේ ඒකකයේ කලාප මායිම ආශ්‍රිතව අක්කර 50ක බිම් ප්‍රමාණයක් අංක17, නව නගරය, ගිරාඳුරුකෝට්ට ලිපිනය ඇති ආර්.එම්.සී.එම්.ඒ.රත්නායක යන අය විසින් 16409 අංක දරණ ඔප්පුව යටතේ සංවර්ධන කර භුක්ති විඳිනු ලබයි.<br>මෙම ඉඩම් කොටස මහවැලි අධිකාරියේ ආරම්භයේ සිටම පුද්ගලික ඉඩමක් වශයෙන් පවත්වාගෙන ගොස් ඇති බැවින් අද දක්වා එම ඉඩම රජයේ ඉඩමක් වශයෙන් සලකා කටයුතු කර නැත. කෙසේ වුවත් මෙම ඉඩමේ නිරවුල්භාවය තහවුරු කර ගැනීමට අදාල කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කළයුතුය. |
| (vi) | උක්ත අනවසර වගා කරුවන් ඉවත් කිරීමට අවශ්‍ය නෛතික කටයුතු ආරම්භ කර නොතිබුණු අතර, ඉඩම් අල්ලා ගැනීම වලක්වාලීමට මයුරපුර බල ප්‍රදේශයේ පිහිටුවා තිබූ මහවැලි ආරක්ෂක බළකායේ නිලධාරීන්ට නොහැකිවී තිබුණි. | ඒ.එල්.පුෂ්පලාල් සහ ආර්.ඒ. ඉන්දික යන අය වෙත කෘෂිකාර්මික ව්‍යාපෘතියක් සඳහා අක්කර 45 බැගින් වූ ඉඩම් කොටස් දෙකක් ලබා දීමට අධ්‍යක්ෂ (ඉ.ප.සැ) නිර්දේශ ඉදිරිපත් කර තිබුණද අදාළ ඉඩම් වන අලි කළමණාකරණ රක්‍ෂිතයට අයත් බැවින් ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් නැවත අවශ්‍ය උපදෙස් ඉල්ලීම්කර ඇතත් වනඅලි කළමණාකරණ රක්‍ෂිතය 2021 වර්ෂයේ ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් ඉඩම් බැහැර කිරීම සිදුකල නොහැකිබව දන්වා | අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අදාළ අනවසරකරුවන් ඉවත්කිරීමට අදාළ නීතිමය කටයුතු සිදු කරමින් පවතී. | |
| (vii) | මහනුවර දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගැටඹේ ග්‍රාම නිලධාරී වසම තුළ මහවැලි ගඟට මැදිවන ලෙස පිහිටා ඇති දූපත තුළ අක්කර 01 යි රූඩ් 01 පර්චස් 36 ක් පමණ භූමි ප්‍රදේශයක පුද්ගලික පාර්ශවයක් විසින් අවන්හලක් පවත්වාගෙන යනු ලබයි. මෙම දූපත පිහිටි ප්‍රදේශය වරාතැන්න හක්කිද පාරිසරික ආරක්ෂණ කලාපය තුළ පිහිටි පුද්ගලික අවන්හල විගණිත දින වන 2024 මාර්තු 22 දක්වා එම රක්ෂිතයෙන් ඉවත් කර නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය මෙම අවන්හල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීමට පෙර සිට පවත්වාගෙන ආ ව්‍යාපාරික ස්ථානයක් බැවින්, අවන්හල පවත්වාගෙන යාම සඳහා ඉඩම් බදු දීමට කමිටු අනුමැතියක් නොමැතිව මහවැලි අධිකාරියේ නෛතික ප්‍රතිපාදන මත සිදු කිරීම සුදුසු බවටත් නිර්දේශ කර ඇත.<br>අවන්හල පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික නිර්දේශ හා කොන්දේසි පැනවීම මගින් අවන්හල බදු පදනම මත ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාදී ඇත. | අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කළයුතුය. |
| (viii) | වික්ටෝරියා කලාපයේ අලුත්වත්ත රජවැල්ල ප්‍රදේශයේ පොදු සුසාන භූමි සඳහා වෙන් කර තිබූ අක්කර 3.1 ක භූමියක්ද පුද්ගලයින් 39 දෙනෙකු විසින් අනවසරයෙන් අත්පත් කර ගෙන තිබුණද, ඒ සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අලුත්වත්ත සුසාන භූමිය සඳහා වෙන් කල අනවසරකරුවන් 39 ක් දීර්ඝ කාලයක් අව්ධිමත් ඉදි කිරීම් සිදු කර ඉඩම් භුක්ති විඳින අතර වෙන් කර ඇති කාර්යයෙන් පරිහාහිරව ස්ථිර පදිංචිය දරණ බැවින් තත්ව මිනුමක් සිදුකර හඳුනා ගැනීම සඳහා කටයුතු කර ඇතත් මෙතෙක් සැලසුම් ලැබී නොමැත. | අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කළයුතුය. |
| (ග) | අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් අයකරගෙන නොතිබුණි.එම ගබඩාවල අයිතිය වී අලෙවි මණ්ඩලය වෙත පවරා දීම සඳහා එම ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගැනීමට කටයුතු සිදුකෙරෙමින් පවතින බව ඉකුත් වර්ෂයේදී විගණන වාර්තාවට පිළිතුරු වශයෙන් දන්වා තිබුණි. එසේ වුවද, විගණිත දින වූ 2024 මැයි 20 දක්වා එම ගොඩනැගිලි සඳහා කුලී අයකර ගැනීම හෝ පවරාදීම සම්බන්ධ ප්‍රගතියක් ලබා නොතිබුණි | වී අලෙවි මණ්ඩලය වෙත පවරා ගැනිමට අනුමැතිය ලබා ගැනිම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිනම් අදාල බදුකුලී ගෙවීමට වී අලෙවි මණ්ඩලය එකග නොවන්නේනම් එම ආයතනය පිහිටුවන ලද පනතේ රජයේ ඉඩම් නොමිලේ ලබාගැනීම සඳහා හැකියාව පවතින බවට ප්‍රතිලාභ තිබේනම් එම පනතේ පිටපතක්ද සමග මා වෙත කඩිනමින් දැනුම් දෙන ලෙස වී අලෙවි මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද ඒ සඳහා ප්‍රතිචාර දක්ව නොතිබුණි. | හිඟ ගබඩා බදු කුලී අයකර ගැනීමටත් ඒවා විධිමත්ව නිදහස් කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ච) | තඹුත්තේගම නිරාවිය ගොවිපලෙහි අක්කර 146 ක භූමි භාගයක් කෘෂිකාර්මික කටයුතු සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව 2020 වර්ෂයේ යුධහමුදාවට භාරදී තිබුණි. එහිදී යුධහමුදා නිලධාරීන් ගොවිපොළෙහි සංචාරක බංගලාවේ හා නිල නිවාසවල රැඳී සිටියද කිසිදු අයකිරීමක් අධිකාරිය විසින් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් විගණිත | නිරාවිය ගොවිපල භූමිය තුලින් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත ලබා දි ඇති භූමි කොටස තවදුරටත් පවත්වාගෙන යාමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී එ අනුව අදාල කුලී හා එහි ජලය හා විදුලිය භාවිතය පිළිබඳ දෙපාර්ශවය මේ වන විටත් සාකච්ඡා පවත්වාගෙන යයි. | බදු ගිවිසුම්වලට එළඹී ඒ අනුව කුලී මුදල්, විදුලිය හා ජල ගාස්තු අයකර ගත යුතුය. |

දින වන විට රු.මිලියන 24 ක පමණ ආදායමක් අධිකාරියට අහිමිවී තිබුණි.

(ජ) ඛනිජ සම්පත් නිස්සාරණය

| | | |
|---|---|---|
| (i) වලව කලාපයේ මයුරපුර කොට්ඨාශයේ හෙක්ටයාර 20.2343 ක ප්‍රමාණයක් පස් කැපීමේ ව්‍යාපෘතියක් සඳහා පුද්ගලික සමාගමක් වෙත 2016 වර්ෂයේදී බැහැර කර තිබුණි. මෙම ආයතනය 2016 දෙසැම්බර් 20 දින සිට 2017 දෙසැම්බර් 19 දක්වා කාල වකවානුව තුළ පස් කියුබ් 66,012 ක් කැනීම වෙනුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත රාජ්‍යභාග ගෙවා තිබුණද, අධිකාරියට ගෙවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.51,533,440 ක් විගණිත දින වන 2024 මාර්තු 19 දක්වා අයකර කර ගෙන නොතිබුණි.තවද, එකඟවූ පරිදි අදාළ භූමිය පුනරුත්ථාපන කටයුතු සිදුකර ද නොතිබුණි. | නේවාසික ව්‍යාපාර කළමාණාකාර (වලව) අදාළ ආයතනය වෙත හිග ඉඩම් පරිහරන ගාස්තු ගෙවීම් කරන ලෙස දන්වා යවා ඇත. නමුත් මෙතෙක් එම මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් ඊට අදාළ නෛතික කටයුතු සිදු කරනු ලබයි. | හිඟ ඉඩම් පරිහරණ ගාස්තු අයකර ගැනීම සඳහා නීති ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ii) මහවැලි අධිකාරිය පිහිටුවීමට අදාළ පනතේ 12 (ඇ) වගන්තිය අනුව යම් විශේෂ ප්‍රදේශයක් තුළ භෞතික පරිසරය සංරක්ෂණය කිරීම සහ එය පවත්වාගෙන යාම අධිකාරියේ ප්‍රධානතම කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| a ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීමේදී කැනීම් භූමියෙහි ඇති වන ආගාධ එම භූමිය අවට පරිසරයට අනුගත කිරීම සඳහා අදාළ භූමිය පුනරුත්ථාපනය කිරීම අවශ්‍ය වුවත්, 2019 වර්ෂයට පෙර අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විගණිත දින වූ 2024 මැයි 20 වන විටද එම කැනීම් භූමි පුනරුත්ථාපනය කිරීමකින් තොරව අනාරක්ෂිත විශාල දිය පිරුණු වලවල් ලෙස අත්හැර දමා තිබුණි. | 2019 වර්ෂයෙන් පසු කැණීම් බලපත්‍ර ලබාදීමේදී මෙන්ම ඉන්පෙර ලබාදී ඇති බලපත්‍ර අළුත් කිරීමේද, පුනරුත්ථාපන සැලැස්මක් අනුමත කරවා ගැනීම මෙන්ම අනුමත පුනරුත්ථාපන සැලැස්ම අනුව ගාස්තු අයකර දීර්ඝ කිරීම සඳහා කටයුතු කර ඇත. | 2019 ට පෙර අත්හිටුවා ඇති කැනීම් භූමි නැවත බඳුදීමේදී භූමි පුනරුත්ථාපනය පිළිබඳ විධිවිධාන ඇතුළත් ගිවිසුම්වලට එළඹීම, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය. |
| b 2019 අප්‍රේල් 01 දින සිට භූමි පුනරුත්ථාපන ගාස්තු සුරක්ෂණ රඳවා ගැනීමට නීති සම්පාදනය | 2019 වර්ෂයෙන් පසු කැණීම් ආරම්භ කරන ලද හා බලපත්‍ර දීර්ඝ කරන ලද ව්‍යාපෘති සඳහා පුනරුත්ථාපන සැලසුම් ඉදිරිපත් | අත්හිටුවා ඇති කැනීම් භූමි බඳුදීමේදී භූමි |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණද එම කාලපරිච්ඡේදයට පෙර නිකුත් කරනු ලැබූ කැනීම් බලපත්‍ර නැවත අලුත් කිරීමේදී එම කැනීම් භූමිවලින් භූමි පුනරුත්ථාපන ගාස්තුවක් අයකර ගැනීමට හෝ භූමි පුනරුත්ථාපනය සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග අලුතින් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි. | කරන ලෙස කලාප මට්ටමින් අයෝජකයින් දැනුවත් කිරීම සිදු කර ඇත.ව්‍යාපෘති පුනරුත්ථාපන සැලැස්ම සකස් කිරීමේදී සිදුවී ඇති තාක්ෂණික ගැටළු නැවත සකස් කිරීමේදී සිදුවී ඇති ප්‍රමාදය හා 2019 වර්ෂයෙන් පසු කැණීම් භූමි ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පෙර වර්ෂවල සිදුකල කාර්යයන් සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමේ ප්‍රායෝගික ගැටළුව වැනි කරුණු හේතුකොට ගෙන පුනරුත්ථාපන වියදම් නැවත ගෙවනු ලබන තැන්පතුවක් ලෙස අය නොකර ගෙන ඇති අවස්ථා පවතින අතර, එම කැණීම් භූමි මේ වන විට අත්හිටුවා ඇත. | පුනරුත්ථාපනය පිළිබඳ විධිවිධාන ඇතුළත් ගිවිසුම්වලට එළඹීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය. |
| c | විගණිත දින වූ 2024 මැයි 10 දිනට කලාප 05 ක පවතින අතහැර දමා තිබෙන කළුගල් කැනීම් ව්‍යාපෘති 35 කින් භූමි පුනරුත්ථාපන ගාස්තු අයකර නොතිබුණි. කැනීම්කරුවන් විසින් එම කලුගල් ව්‍යාපෘතිවලින් කළුගල් කියුබ් 197,730 ක ප්‍රමාණයක් කැනීම් කර තිබුණි. | එල් කලාපයේ ඉඩම් පරිහරණ ගාස්තු ගෙවීම පැහැර හරින ලද කළුගල් ව්‍යාපෘති 02 ක් අත්හිටුවීම සඳහා කටයුතු කර ඇත.වලව කලාපයේ 2019.04.01 දින සිට නිර්දේශ දෙන ව්‍යාපෘති වෙනුවෙන් භූමි පුනරුත්ථාපන ගාස්තු විධිමත්ව අයකරනු ලබයි. බී කලාපයේ බැහැර කරන ලද කලුගල් ව්‍යාපෘතිය තුලින් එක් කැනීම්කරුවකු හට කලුගල් කැණීම සඳහා 2022 වර්ෂයේ දී බැහැර කරන ලද කට්ටි කැඩීමේ සිතියම් අංක 14 හි කැබලි අංක 1 ට අදාලව පමණක් පුනරුත්ථාපන රුදවුම් ගාස්තු එම අවධියේදී අයකර නොමැත. එම බදුකරු මියගොස් කලුගල් කැණීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවේ.කලුගල් කැණීමේ ව්‍යාපෘතිය පරීක්ෂා කර බලා අදාල භූමිය පුනරුත්තාපනට අදාලව මෙම කලාපයේ පරිසර නිලධාරි විසින් නිර්දේශය ලබා දී ඇති අතර බලපත්‍රකරුගේ පුත්‍රයා විසින් මේ වන විට අදාල භූමියෙහි වන වගා පැල සිටුවා භූමිය පුනරුත්ථාපනය කිරීමට කටයුතු සිදු කර ඇත.එච් කලාපයේ භූමි පුනරුත්ථාපන ගාස්තු අයකිරීම පිළිබඳ ප්‍රගතිය දක්වා ඇත. | 2019 ට පෙර අත්හිටුවා ඇති කැනීම් භූමි නැවත බඳුදීමේදී එම භූමි පුනරුත්ථාපනය පිළිබඳ විධිවිධාන ඇතුළත් ගිවිසුම්වලට එළඹීම, ඒවා පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය. |
| d | කැනීම් බලපත්‍ර දීර්ඝ කරනු ලබන අවස්ථාවන්හීදී පෙර වර්ෂයේ හිඟ ගාස්තු ගණනය කර එය අයකර ගැනීමෙන් පසු නව බලපත්‍රයක් නිකුත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම හා වගකිවයුතු නිලධාරීන් අදාළ හිඟ ඉඩම් පරිහරණ ගාස්තු යාවත්කාලීනව අයකර ගැනීම නොසලකා හැරීම මත 2019 වර්ෂය අවසන් වන විට අධිකාරියට අය වියයුතු හිඟ | පිළිතුර නොගැලපේ. | වගකීම් පැහැර හරින ලද නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගෙන රජයට වූ අලාභය අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉඩම් පරිහරණ ගාස්තු රු.1,898,907,760 ක් වී තිබුණි. | | |
| e | 2020 දෙසැම්බර් 14 දිනැති අංක අමප/20/1852/317/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් කළුගල් ව්‍යාපාරිකයින්ගෙන් අයවිය යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු මුදලින් සියයට 75 ක් කපා හැරීමටත්, ඉතිරිය වාරික 36 කින් අයකර ගැනීමටත් ඉඩකඩ සලසාදී තිබුණි. ඒ අනුව සී, එච්, එල් හා වලව කලාපවලින් කපා හරින ලද රු.1,424,180,320ක මුදල අධිකාරියට අයකර ගත හැකිව තිබූ ආදායමක් බවත්, අධිකාරියේ ආදායම් එකතු කිරීමේ නිලධාරීන්ගේ හා අධීක්ෂණ නිලධාරීන්ගේ දූර්වල හා අකාර්යක්ෂම රාජකාරී ඉටුකිරීම හේතුවෙන් මෙම මුදල් අධිකාරියට අහිමිව තිබූ බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය. | කර්මාන්තකරුවන්ගේ හිඟ මුදලින් සියයට 25 ක් වසර 03 ක් තුල මාසික වාරික 36 කින් අය කිරීමට ලබාදුන් අමාත්‍ය මණ්ඩලය අනුමැතිය හේතුවෙන් විමසුමේ දක්වා ඇති හිඟ ඉඩම් පරිහරණ ගාස්තු අයකර ගත නොහැකි විය. ආමාත්‍ය මණ්ඩල තීරනය ප්‍රකාරව සියයට 25 ලෙස ගණනය කරන ලද හිඟ ඉඩම් පරිහරණ ගාස්තු අයකර ගනිමින් පවතී. | වගකීම් පැහැර හරින ලද නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර, රජයට වූ අලාභ අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| f | හිඟ මුදල් ගෙවීමට කැනීම්කරුවන්ට ලබා දුන් සහන කාලසීමාව 2023 දෙසැම්බර් 31 දින වනවිට අවසන්ව තිබුණු නමුත්, කැනීම්කරුවන් 65 කගෙන් රු.298,362,829 ක මුදලක් 2024 මැයි 20 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂාවේදී කැනීම්කරුවන් 27 කගෙන් අයකර ගතයුතු රු.69,423,300 ක මුදලින් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණු අතර, ඉහත ලබාදුන් සහනය අවභාවිතා කරමින් කැනීම්කරුවන් 38 දෙනෙකු ගෙවීමට ඇති මුදලින් ඉතා සුළු මුදලක් පමණක් ගෙවීම් කර නැවත කැනීම් ආරම්භ කර තිබුණි. එම කැනීම්කරුවන් ගෙවිය යුතුවූ රු.373,612,647 ක මුදලින් විගණිත දින වන විට රු.228,939,529 ක මුදලක් අයකර ගතයුතුව තිබුණි. එය ඔවුන්ගෙන් අයවීමට ඇති මුදලින් සියයට 61 ක් වී තිබුණි.ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය තුළින් | ඉඩම් පරිහරණ ගාස්තු ගෙවන ලෙස ලිඛිතව ආයෝජකයින් දැනුවත් කිරීම කලාප මට්ටමින් සිදු කර ඇති අතර, නීතිමය ක්‍රියාමාර්ග සඳහා එළඹීම සඳහා එන්තරවාසි යොමුකිරීමද සිදු කර ඇත. එසේ යොමුකළ ද ගාස්තු ගෙවීමට යොමු නොවූ ආයෝජකයින්ට ඉදිරි පියවර ගැනීම 1982 අංක 12 දරණ පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳව පනත යටතේ නඩුපැවරීමට අදාළ පැමිණිලි ඒ ඒ ගල්වල පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ පැමිණිලි යොමු කිරීමට කටයුතු කර ඇත. | කැනීම්කරුවන්ට විරුද්ධව නීති ප්‍රකාර කටයුතු කර ගාස්තු හා ඊට අදාළ නෛතික පොළියද අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | රජයට ලැබිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු මුදලින් සියයට 75 ක් අත්හැරීමටත් ඉතිරිය වාරික 36 කින් ගෙවීමටත්, එම හිඟ මුදල සඳහා කිසිදු පොලියක් අය නොකිරීමටත් වැනි සහන ලබාදීමෙන් පසුත් එම හිඟ මුදල් නොගෙවන ව්‍යාපාරිකයින්ගෙන් එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා විගණිත දින වනවිටත් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2023 අගෝස්තු 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී නිසි පරිදි ගෙවීම් නොකරන ආයෝජකයින්ට එරෙහිව කඩිනමින් පොදු දේපල පනත යටතේ නඩු පවරන ලෙස උපදෙස් දෙනු ලැබුවත් ඒ අනුව නඩු පැවැරීමට කටයුතු කර ද නොතිබුණි. | |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි සී කලාපයේ වැලි කැනීම සඳහා බලපත්‍ර ලබාදීමේදී සිදුවී ඇති අක්‍රමිකතා සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සිදුකළ මූලික විමර්ශන වාර්තාව අනුව රාජ්‍ය සම්පත් සාවද්‍ය පරිහරණය කිරීමට ඉඩහැරීම සම්බන්ධයෙන් හිටපු නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්ට එරෙහිව ආයතන සංග්‍රහයට අනුව කටයුතු කිරීමටත්, ඛනිජ ද්‍රව්‍ය කැනීම් සම්බන්ධව සම්පූර්ණ වගකීම දැරූ ඉඩම් පරිහරණ අංශයේ හිටපු අධ්‍යක්ෂකට එරෙහිව ආයතන සංග්‍රහයේ 02 වන උපලේඛනයේ වරදක් සිදුකිරිම සම්බන්ධව කටයුතු කිරීමටත් නිර්දේශ කර තිබුණි. මූලික විමර්ශන වාර්තාවේ එම නිර්දේශ ක්‍රියාත්මක කර ඇති බව දක්වා තිබුණද, 2024 මැයි 20 දින වනවිටත් ඉහත සඳහන් ප්‍රධාන වැරදිකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම හෝ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් කිසිදු සාධනීය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ මත විශ්‍රාම ලබා ඇති එවකට නේවාසික ව්‍යාපාර කළමණාකාර (සී) ලෙස ද්විතිය පදනම මත රාජකාරි සිදුකල නිලධාරියාට හා මෙම අධිකාරියෙන් ඉවත්ව් වෙනත් ආයතනයක සේවය කරන එවකට අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) විසින් දෙපාර්ත්තමේන්තු අත්පොත්වල හා උපදෙස් සංග්‍රහ වල විධිවිධාන උල්ලංඝණය කිරිම, නොසලකා හැරිම, මග හැරිම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II බාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ පලමු උපලේඛනයේ 8,15 වන වගන්ති ප්‍රකාරව කටයුතු කිරිම මත එම නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය අනුව කටයුතු සිදු කරන ලෙස සිදුකල දැනුම්දිම මත 2023.06.27 දිනැති ලිපිය මගින් නිති අංශය දැනුවත් කර ඇත.<br>නිතිපති ලිඛිත උපදෙස් මත ඉඩම් පරිහරණ ගාස්තුව නොගෙවූ වැලි මංකඩ ලාභින්ට එරෙහිව පොදු දේපල පනත යටතේ නඩු පවරා අදාල අලාභය අය කර ගැනිම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස නේවාසික ව්‍යාපාර කළමණාකාර (සි) දැනුවත් කර ඇති බව නියෝජ්‍ය අධ්‍යක්ෂ (නිති) විසින් දැනුම් දි ඇත. | ආදායම් අහිමි කිරීමට වගකිවයුතු පාර්ශවයන්ගෙන් සම්බන්ධයෙන් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී වැලි කැනීම්වල පරිසර හානි අවම කිරීමට මහවැලි ගඟ දෙපස මීටර 60 ක රක්ෂිත මායිම් සලකුණු කිරීමට එකඟවී තිබූ අතර, ඒ සඳහා 2018 වර්ෂයේ රු.1,000,000 ක් 2019 වර්ෂයේ රු.612,300 ක් ද ලෙස එකතුව රු.1,612,300 ක මුදලක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ නමුත්, විගණිත දින වූ 2024 මැයි 10 දක්වා මැනීම් කටයුතු හෝ රක්ෂිත මායිම් සලකුණු කිරීම සිදුකර නොතිබුණි. | මහවැලි ගඟ දෙපස මීටර් 60 රක්ෂිත ප්‍රදේශය මායිම් සළකුණු කිරීමට අදාලව මූලික මැණුම් කටයුතු මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී ආරම්භ කළද ඉන්පසු වර්ෂවල කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් පැවති ප්‍රවාහන අපහසුතා හා වන අලින් බහුල ප්‍රදේශයක් වීම හා එම කාලයේදී ප්‍රදේශය තුළ සිදුවූ ජීවිත හානි හේතුවෙන් ආරක්ෂාව පිළිබඳව පැවති තත්වයන් හේතුකොට ගෙන මැණුම් කටයුතු අවසන් කිරීමට නොහැකිවී ඇත. ඒ පිළිබඳව කරන ලද නිරන්තර ඉල්ලීම් අනුව මැණුම් කටයුතු 2024.06.24 දින නැවත ආරම්භ කර ඇත. | රක්ෂිත මායිම් සළකුණු කිරීමේ කාර්යය කඩිනමින් නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉඩම් කළමනාකරණයට 2016 හා 2018 වර්ෂවලදී රු.6,973,405 ක් වැයකර ඉඩම් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් 60 ක් පුහුණු කර තිබුණි. එසේ වුවද විගණිත දින වූ 2024 අප්‍රේල් 28 වනවිටද ඉඩම් කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක නොවීම නිසා එම වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. | 2021 වර්ෂයේ දී LGC 1 සිට LGC 2 දක්වා දත්ත අවකාශ මාරුවීම සිදුවීම හේතුවෙන් දත්ත පද්ධතිය අක්‍රීය වී දත්ත ඇතුලත් කිරීමට නොහැකි විය. මෙම දත්ත පද්ධතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අමාත්‍යාංශ උපදේශන ප්‍රසම්පාදන කමිටුවක් (CPCD) 2024.01.10 දින පත්කර එහි නිර්දේශ 2024.05.27 වන දින අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.<br>Araaya Business Solutions (Pvt) Ltd ආයතනය මඟින් e-Slim පරිගණක පද්ධතිය නැවත ස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති 4,450,000 ක මුදල සහ එක් වර්ෂයක් සඳහා මෘදුකාංග ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් 2,750,000 ක මුදලක් ගෙවීම නිර්දේශ කර ඇත.<br>තවද LGC 1 සිට LGC 2 දක්වා දත්ත අවකාශ මාරුවීම සඳහා ඉල්ලුම්කර ඇති රු.800,000 ක මුදල හා වර්තමානයේ පවතින රජයේ ඉඩම් සම්බන්ධ ක්‍රියාකාරකම් වලට ඇතුලත් වන පරිදි රජයේ ඉඩම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහිත දැනට පවතින පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ඉල්ලීම් කරන ලද රු.700,000 ක මුදල ගෙවීමට කමිටුව විසින් නිර්දේශ කර ඇත.<br>ඒ අනුව e-Slim පද්ධතිය මහවැලි අධිකාරිය තුල ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර අදාල සමාගම සමඟ ගිවිසුම් ගත වී ඇත. | ඉඩම් කළමනාකරණ තොරතුරු පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කල යුතුය. |
| (ඇ) | ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යන්ත්‍රස්ථාන ඉදිකිරීම, මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැගීම අධිකාරියේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි.මීට අදාළව පහත නිරීක්ෂණ කෙරේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රධාන වේලි හා ජලාශ පද්ධතියේ ඉදිකිරීම් වියදමෙහි සමස්ථ වටිනාකම රු.බිලියන 288.5 ක් ලෙස තක්සේරු කර තිබුණද, වාර්ෂිකව මෙම වේලි හා ජලාශ පද්ධතියේ නඩත්තු වියදම් හා ප්‍රධාන පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් පැහැදිලිව හඳුනාගත හැකි පරිදි වාර්තා පවත්වා නොතිබුණි. | ප්‍රධානවේලි පද්ධතියේ ඉදිකිරීම් වියදමෙහි සමස්ත වටිනාකම රු.මිලියන 420 කි,එසේ වුවත් වාර්ෂික නඩත්තු පිරිවැය වෙන වෙනම සේවාගත කිරීම දිගු කාල සීමාවක සිට සිදු කර නොමැති බැවින් ඉදිරියේදී එම විස්තර පරික්ෂාකර ලේඛණ ගත කිරීමට කටයුතු සිදු කරමින් පවතී. මේ වන විට 2020 සිට 2023 දක්වා වියදම් ලේඛණ ගත කිරීමට කටයුතු කර ඇත. | වේලි හා ජලාශ පද්ධති නඩත්තු හා පුනරුත්ථාපන වියදම් හඳුනාගත හැකි පරිදි වාර්තා තබා ගතයුතුය. |
| (ii) | විදුලි බලය නිෂ්පාදනය කිරිම සඳහා වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ,කොත්මලේ, බෝවතැන්න, මාදුරුඔය, පොල්ගොල්ල හා උඩවලව ජලාශවලින් ජලය රඳවාගෙන නිකුත් කරනු ලබන අතර, එම ජලාශ නඩත්තුව හා මෙහෙයවීම වෙනුවෙන් අධිකාරිය වාර්ෂිකව විශාල වැය බරක් දරනු ලැබේ. කෙසේ වෙතත් 2022 හා 2023 වර්ෂයේ ජල විදුලි බලය නිපදවීම වෙනුවෙන් මෙම ජලාශවලින් පිළිවෙලින් ජල කියුබ් මීටර මිලියන 11,042.07 ක් හා 9,210.85 මුදාහැර තිබූ අතර, ඉන් පිළිවෙලින් ගිගා වොට් පැය 2,327.46 ක් හා 1,845.76 ක විදුලිබල නිෂ්පාදනය සිදුකර තිබූ නමුත් කිසිදු මුදලක් අධිකාරිය අයකර නොතිබුණි. | ජලාශවල වත්කම්, මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරණය මහවැලි අධිකාරිය විසින්ද විදුලි බලාගාරය මෙහෙයුම් කටයුතු ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදුකරණු ලබයි.ඔවුන්ගේ ප්‍රාග්ධනය හා පුනරාවර්ථන වියදම්, කාලානුරූපීව වෙනස්වන ගාස්තු ක්‍රමයක් මගින් පාරිභෝගිකයන්ගෙන් අයකරණු ලබයි. නමුත් මහවැලි අධිකාරිය මෙහෙයුම් හා නඩත්තු සිදුකරණු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන වාර්ෂික ප්‍රතිපාදන මතය.<br>මහවැලි ප්‍රතිව්‍යුහගත සැලසුම් අනුව ස්වයං මූල්‍ය (Self-Finance) ආයතනයක් බවට පරිවර්ථනයවීමේ ක්‍රියාවලියේදි ජල විදුලි උත්පාදනය කරන ජලාශවල නඩත්තු හා මෙහෙයුම් වියදම් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලි ඒකකයක් සඳහා නඩත්තු පිරිවැයේන් සියයට 20 ක මුදලක් (ආසන්න වශයෙන් රු. 1 සහ 2) අයකර ගැනීමට නිර්දේශ වුවත් මේ සඳහා යහපත් ප්‍රතිචාරයක් ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් දක්වා නැත. | විදුලි ජනනය සඳහා නිදහස් කරන ජලය වෙනුවෙන් සාධාරණ ගාස්තුවක් අය කළයුතුය. |
| (iii) | ජල විදුලි බලය නිපදවීමට අමතරව අධිකාරියට අයත් ගංගා, ජලාශ, වැව් හා ඇල පද්ධතිවලින් නොයෙකුත් ව්‍යාපාර සඳහා ජලය විශාල ලෙස නිකුත් කරන නමුත්, ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් යටතේ ගාස්තු අය කිරීමක් වර්තමානය වනවිටද සිදුනොවේ. විගණනයට ලබාගත හැකිවූ තොරතුරු අනුව ගොවිපල/වැඩබිම් ස්ථාන 48 කට දිනකට ජලය ඝන මීටර් 133,113 ක් නිකුත් කරනු ලබයි. | මහවැලි අධිකාරිය මගින් නඩත්තු හා මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන ජල මූලාශ්‍රවලින් පෝෂණය වන විවිධ ව්‍යාපෘති සඳහා ජල ගාස්තුවක් අයකර ගැනීමට මහවැලි කලාප හා ප්‍රධාන වේලි නඩත්තු කිරීමේ අංශයට උපදෙස් ලබා දෙන ලදි.එම ක්‍රියාවලිය මේ වන විට සිදුකෙරෙමින් පවතින අතර මේ වන විට 2022 වර්ෂයේ සහ 2023 වර්ෂයේ පිළිවෙලින් රුපියල් මිලියන 5.33 ක් හා රුපියල් මිලියන 7.09 ක මුදලක් ජල ගාස්තු වශයෙන් අධිකාරිය අය කර ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයද වාර්ෂිකව මහවැලි ජල මූලාශ්‍ර තුලින් ඝන මීටර් මිලියන 250 ක පමණ ප්‍රමාණයක් ලබා ගන්නා අතර මේ සඳහා කිසිදු ගෙවීමක් සිදු කරනු නොලබයි. | අධිකාරියේ ජල මූලාශ්‍රවලින් ජලය ලබාදීමේදී ඒ සඳහා යම් ගාස්තුවක් අයකිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | අධිකාරිය විසින් කුඩා පරිමාණ ජලවිදුලි බලාගාර ඉදිකිරීමට ආයෝජකයින් තෝරා ගැනීම සහ ඊට සුදුසු ස්ථාන 20 ක් හඳුනා ගැනීමට 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.1,297,533 ක් වැයකර තිබුණද, ඉන් ව්‍යාපෘති 10 ක් විගණිත දින එනම් 2024 අප්‍රේල් 28 දින දක්වා අවසන් කිරීමට නොහැකිවී තිබුණි. | 2011 වර්ෂයේ තෝරාගන්නා ලද ස්ථාන 20 අතරින් 2024.09.30 දිනට ප්‍රගතිය දක්වා ඇත. | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන කර ආයෝජකයින් හා සුදුසු ස්ථාන හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |
| (v) | උක්ත විදුලි බලාගාරවලට අමතරව අධිකාරිය විසින් නියාමනය නොකරන නමුත්, මහවැලි විශේෂ බලප්‍රදේශ තුළ විදුලි ජනනයේ යෙදී සිටින කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර 65 කින් ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීම සඳහා විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකර ඇති ප්‍රදේශ මහවැලි ගැසට් බල ප්‍රදේශ තුල පිහිටා තිබුණද එම ප්‍රදේශ පරිපාලනය කරනු ලබනුයේ අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේය .ඒ අනුව, ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේදීද එකී කාර්යාලවෙතින් අනුමැතිය ලබාගෙන ඇත.මෙම බලාගාර සඳහා වසර 15 ක කාලයක් වලංගු වන පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර ඇති අතර එකී බලපත්‍රය යාවත්කාලීන කිරීමේදී මහවැලි අධිකාරියට මෙම ව්‍යාපෘති සඳහා නැවත මැදිහත් වීමට හැකියාව ලැබෙන බැවින් ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කිරීමට සහ සුදුසු පරිදි ගිවිසුම්ගත වීමට බලාපොරොත්තු වේ. | ජල විදුලි බලාගාරවල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තු අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතුය. |
| (vi) | භූමිය මත පිහිටි හා පාවෙන සූර්ය විදුලි බලාගාර ඉදිකිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනාගෙන සූර්යය බලශක්ති ආයෝජන ව්‍යාපෘති ස්ථාපනය කිරීම වෙනුවෙන් අධිකාරිය විසින් හෙක්. 692.6 ක භූමි ප්‍රදේශයක් විගණිත දින වූ 2024 අප්‍රේල් 28 වනවිට ආයෝජකයින් 33 දෙනෙකු වෙත බදුදීම සඳහා වෙන්කර දී තිබුණි. එසේ වුවද විගණිත දින වූ 2024 අප්‍රේල් 28 වනවිට ඉන් විදුලි ජනනයේ යෙදී සිටියේ ආයෝජකයින් 08 දෙනෙකු පමණි. ව්‍යාපෘති ආරම්භ නොකළ ඉඩම් වෙනත් ආයෝජකයින් වෙත ලබාදීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති සඳහා නිසි බලධාරියා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වේ. සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් ඇරඹීමේදී මුලින්ම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙතින් මූලික එකඟතාව ගෙන අනතුරුව අදාල පරිසර අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වේ. තවද, නිපදවනු ලබන විදුලිය මිලදී ගැනීම සඳහා ලංකා විදුලිබල මංඩලය එකඟ විය යුතු අතර ඒ අනුව විදුලිය මිලදී ගැනීම සඳහා ගිවිසුම් අත්සන් කල යුතුවේ.කොවිඩ් වසංගතය සහ අනතුරුව එළඹි ආර්ථික පසුබෑස්ම හමුවේ ආයෝජකයින් ඉදිරිපත් නොවීම මත මෙම කාර්යය සඳහා කල් ගතවූ නමුත් මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. | ඉඩම් ලබාදීමේ පරමාර්ථ,සංවර්ධනය පසු විපරම හා සංවර්ධනය නොකරන ඉඩම් නැවත පවරා ගෙන සුදුසු කාර්යයන් සඳහා භාවිතා කළයුතුය. |

(ඉ) ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | කලාප 05 ක තොරතුරු අනුව 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරිය | මහවැලි කලාප 10 ආවරණය වන පරිදි ඉඩම් කැබලි 797කට අදාළව හෙක්.6,534ක් බැහැර | පූර්ණ අසංවර්ධිත ව්‍යාපෘති අවලංගු |

| | | | |
|---|---|---|---|
| | විසින් ආයෝජන ව්‍යාපෘති 82 ක් සඳහා බැහැර කර තිබුණු ඉඩම් හෙක්ටයාර 464.68 ක්වූ එම ඉඩම් බැහැර කර වසර 02 ත් 38 ත් අතර කාලයක් ගතවී තිබුණද, ඌන සංවර්ධිත මට්ටමක (සංවර්ධනය සියයට 25 කට අඩු) පැවතුණි. | කර ඇත.2023.05.23 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභා රැස්වීම සඳහා ඉදිරිපත්කරන ලද යාවත්කාලීන කරන ලද දත්තවලට අනුව බැහැර කරන ලද මුළු ඉඩම් කට්ටි ප්‍රමාණයෙන් සියයට 75 කට අඩු සංවර්ධන තත්වයක් සහිත ඉඩම් කැබලි 325ක් පවතින බවට හඳුනාගෙන ඇත. ඒ අනුව බී කලාපයට අයත් ඌණ සංවර්ධිත ඉඩම් කැබලි 135 ක් මේ වන විටත් අවලංගුකර ඉතිරි කලාපවලද එම කටයුතු ආරම්භ කර සිදුකරගෙන යනු ලබයි. | කර ඉඩම් ආපසු ලබාගැනීමටත්, අනෙක් ව්‍යාපෘති නියමිත යෝජනාවලට අනුකූලතාව කාලීනව අධීක්ෂණය කළයුතුය. |
| (ii) | කලාප 06 ක අයෝජන ව්‍යාපෘති 186 ක් සඳහා බැහැර කරන ලද ඉඩම් හෙක්ටයාර 229.3 ක රජයේ තක්සේරුව ලබා නොගෙන දළ තක්සේරුව මත පදනම්ව බදු අයකර තිබුණි. මෙම ඉඩම් බදුදී වසර 02 ත් 34 ත් අතර කාලය ගතවී තිබුණද, රජයේ තක්සේරු ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ආයෝජන දේපලවලින් රජයට ලබාගත හැකිවූ නිවැරදි බදු මුදල් අයකර ගත නොහැකිව තිබුණි. | තක්සේරුව ලබා ගැනීමේදී සිදුවන ප්‍රමාදයන් නිසා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව දළ තක්සේරුවට අනුව බදු අය කෙරේ. ඒ අනුව රජයේ තක්සේරුව ලබා ගැනීමට කටයුතු සිදුකරගෙන යනු ලබයි. | රජයේ තක්සේරුව ලබා ගෙන බදු අය කළයුතුය. |
| (iii) | කලාප 05 ක වසර 30 ක කාලයකට බදුදී තිබූ ඉඩම් හෙක්ටයාර 421.22 කට අදාළ බදු කාලය විගණිත දින වන 2024 මැයි 10 වන විට අවසන්වී වසර 06 සිට වසර 13 දක්වා කාලයක් ගතවී තිබූ නමුත්, එම බදු ගිවිසුම් අලුත් කිරීමට හෝ අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝකාලීන බදු දුන් ඉඩම්, මුල් වසර 30 බදු කාලය නිමවීමෙන් පසු පවතින සංවර්ධන තත්ත්වය සලකා බලා එම ඉඩම්ලාභීන් වෙතම තවත් වසර 30 ක් සඳහා බදු දීම සිදු කෙරේ. ඒ අනුව මුල් වසර 30 ක බදු කාලය අවසන් බදුකර සඳහා දෙවන බදුකාලයට අදාල බදුකර 2022.11.11 දින දක්වා ලබාදී ඇත. එහෙත් 2022.11.11 දිනැති ජනාධිපති ලේකම්ගේ ලිපිය මගින් නව ඉඩම් බැහැර කිරීම් අත්හිටුවන ලද අතර ඒ අනුව එදින සිට වසර 30 බදු කාලය අවසන් වූ පුද්ගලයින් සඳහා නැවත බදු ලබාදීමක් සිදුකර නැත. ඉන්පසු ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු උපදෙස් පරිදි මුල් වසර 30 බදු කාලය අවසන් වූ නැවත බදු අනුමැතිය ලබාගැනීම සඳහා අදාල ලේඛන ජනාධිපති ලේකම් කාර්යාලය වෙත විධිමත් ආකෘතියක් මගින් යොමු කර ඇත. ඒ අනුව අනුමැතිය ලද පසු මුල් බදු කාලය අවසන් බදුකර සඳහා බදුකර ලබාදීමට හැකියාවක් පවතී. | කාලය අවසන් වූ බදු දීම් සඳහා නව බදු ගිවිසුම්වලට එළඹීමටත්, බදු සංශෝධන යාවත්කාලීන කර හිඟ බදු අයකර ගැනීමටත් කටයුතු කළයුතුය. |
| (iv) | සී කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කරන ලද ඉඩම් හෙක්ටයාර 85.42 ක් අවිධිමත්ව අන්සතු කර තිබුණි. | මහවැලි අධිකාරියේ අනුදැනුමකින් තොරව අවිධිමත්ව අන්සතු කර ඇති ආයෝජන ව්‍යාපෘති රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවලංගු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. | අවිධිමත් ආයෝජන ව්‍යාපෘති රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රකාරව අවලංගු කිරිමට කටයුතු කළයුතුය. |
| (v) | වලව කලාපයේ ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් බැහැර කර තිබූ ඉඩම් අක්කර 206 ක් විගණිත දින වු 2024 මැයි 10 වනවිට බැහැර කර වසර 02 ත් 11 ත් අතර කාලයක් ගතවී තිබුණද කිසිදු සංවර්ධනයක් කර නොතිබූ අතර බදු ගිවිසුම් අවලංගු කිරිමටද කටයුතු කර නොතිබුණි. | එක් එක් ආයෝජන ව්‍යාපෘති වලට අදාළව ආවේණික ගැටළු මත සංවර්ධන කටයුතු අඩාල වී ඇත. සංවර්ධන කටයුතු සිදු නොකරන ආයෝජකයින්ගේ බදු අනුමැතිය අවලංගු කර ඌන උපයෝගී ඉඩම් මහවැලි අධිකාරිය සතුකර ගැනීමට කටයුතු කරමින් පවතී.මීට අමතරව චන්ද්‍රිකාවැව කොට්ඨාසයේ 2022 වර්ෂයේදී ලබා දී ඇති නව ආයෝජන ඉඩම් බෙදා දීමක් සිදු කළද ඉඩම් භාරගත් ආයෝජකයින් විසින් එම ඉඩම්වල සංවර්ධන කටයුතු සිදු කර නොමැති බැවින් බදු මුදල් ගෙවා සංවර්ධන කටයුතු සිදුකරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති අතර ඉදිරියේදී මෙම අයගේ බදු අනුමැතිය අවලංගු කිරීමට අදාළ කටයුතු සිදු කරනු ලැබේ. | පූර්ණ අසංවර්ධිත ව්‍යාපෘති අවලංගු කර ඒ සඳහා එම ඉඩම් ආපසු ලබාගැනීම කළයුතුය. |
| (vi) | තඹුත්තේගම කොට්ඨාශයේ 406/408 ඒකකයේ අ.ග.පි 80 හි කැබලි අංක 366 රජයේ රක්ෂිතයක් ලෙස වෙන් කර තිබූ නමුත්, මෙම ඉඩම් කොටසින් තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ කසල කළමනාකරණය වෙනුවෙන් අක්කර 5 ක් ද, ආරණ්‍ය සේනාසනයක් සඳහා අක්කර 20 ක ප්‍රමාණයක්ද, පේර වගාවක් සඳහා අක්කර 10 ක ප්‍රමාණයක් සහ මිදි වගාවක් සඳහා අක්කර 12 ක ප්‍රමාණයක්ද වෙන් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ. | | |
| a | 2015 හා 2019 අතර කාලය තුළදී ඉහත සඳහන් කරුණු වෙනුවෙන් ඉඩම් වෙන් කර තිබුණද, විගණිත දින වන 2024 මාර්තු 25 දින වනවිට ද මෙම ඉඩම් කොටස් නිශ්චිතව මැන මායිම් ලකුණු කර අදාළ පුද්ගලයන් හා ආයතන වෙත බැහැර කර නොතිබුණි. ඒ හේතුවෙන් බැහැර කරන ලද ඉඩම් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ඔවුන් විසින් භුක්ති විඳිමින් පැවතුණ අතර, ඒ සඳහා බදු අයවීද නොතිබුණි. | 2005 වර්ෂයේ මිදි වගාව සඳහා අක්කර 12 ක් බැහැර කිරීමේ දි අනුරේඛනයකට අනුව බැහැර කර ඇත. 2013 වර්ෂයේ දි පේර වගාව සඳහා අක්කර 10 ප්‍රමාණය ද අනුරේඛනයකට අනුව බැහැර කර ඇත. 2019 වර්ෂයේ ඔරුගලයාය කසල බැහැර කළමණාකරනය කිරිම වෙනුවෙන් හෙක් : 2.0267 කින් යුත් ඉඩම් කොටස මැනුම් කර 2018.07.02 වන දින අ.ග.පි 366 අතිරේඛ 09 කැබලි අංක : 153 ලෙස සැලසුම සකස් කර ඇත.ඒ අනුව විගණන නිරීක්ෂණ වල දක්වා ඇති පරිදි බැහැර කරණ ලද ඉඩම් ප්‍රමාණයට වඩා භුක්ති විඳින ඉඩම් ප්‍රමානය වැඩිවීම හා ඒ සඳහා බදු අය නොවීම පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදි. | අනවසරකරුවන් භුක්ති විඳින ඉඩම් ආපසු ලබා ගත යුතුය.= |

| | | | |
|---|---|---|---|
| b | 2005 වර්ෂයේදී මිදි වගාව සඳහා ලබාදුන් අක්කර 12 ක ප්‍රමාණය එම කටයුත්තට යොදවා නොතිබුණු අතර, නිසි පරිදි බදු මුදල් නොගෙවීම නිසා 2022 වර්ෂයේදී බදුකරුගේ බදු අයිතිය අවලංගු කර තිබූ නමුත්, එකඟ වූ පරිදි ඉඩම ආපසු අධිකාරිය වෙත ලබාදී නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දින වනවිට එම ඉඩම සඳහා අයවිය යුතු හිඟ බදු මුදල රු.489,625 ක් විය. | 2005 වර්ෂයේ දි මිදි වගාව සිදු නොකර ඒ සඳහා ගෙවිය යුතු බදු මුදල් ඉඩම්ලාභියා නොගෙවීම හේතුවෙන් බදු අයිතිය 2022 වර්ෂයේ අවලංගු කර ඇතත් ඉඩම මහවැලි අධිකාරිය වෙත භාර දි එයින් ඉවත් නොවීම හේතුවෙන් සන්තකය ආපසු ලබා ගැනිමේ පනත යටතේ ඉදිරි නෛතික කටයුතු සිදුකරගෙන යනු ලැබේ. | ආයෝජකයින්ගේ හිඟ බදු මුදල් අයකර ගැනීම කළ යුතුය. |
| c | පේර වගාව සඳහා ලබාදුන් අක්කර 10 ක පමණ භූමි ප්‍රමාණය බදුකරු විසින් වගා නොකර පසුව පුද්ගලික සමාගමක් වෙත රු.ලක්ෂ 30 කට අනීතිකව විකුණා තිබුණි. තවද එම අක්කර 10 ට අමතරව තවත් යාබදව පවතින අක්කර 8 ක පමණ ප්‍රමාණයක් එම සමාගම සිය වගා කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. | පේර වගාව සඳහා ලබා දුන් අක්කර 10 ක පමණ භූමි ප්‍රමාණයට අමතරව තවත් අක්කර 08 ක පමණ ප්‍රමාණයක් අනවසරයෙන් වැඩිපුර වගා කටයුතු සඳහා යොදවා ගෙන ඇති අතර, මෙම අය විසින් ඉඩම මහවැලි අධිකාරිය වෙත භාර දි එයින් ඉවත් නොවිම හේතුවෙන් සන්තකය ආපසු ලබා ගැනිමේ පනත යටතේ ඉදිරි නෛතික කටයුතු සිදුකරගෙන යනු ලැබේ. | ආයෝජකයින්ගේ බදු අයිතිය අවලංගු කර හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |
| d | මෙම රක්ෂිතයේ නැගෙනහිර මායිමේ අක්කර දෙක/තුනක ප්‍රමාණයක් යම් පුද්ගලයෙකු විසින් අනවසරයෙන් භුක්ති විඳින අතර, එහි අඹ පොල් වැනි දීර්ඝකාලීන වගාවන් සිදුකර තිබුණි. තඹුත්තේගම කොට්ඨාශ කළමනාකරු විසින් මේ සම්බන්ධයෙන් නේවාසික ව්‍යාපාර කළමනාකරු දැනුවත් කර තිබූ නමුත්, විගණිත දින වන 2024 මාර්තු 25 දක්වා එම අනවසර වගාකරු ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මෙම රක්ෂිතයේ නැගෙනහිර මායිමේ අක්කර දෙකක, තුනක ප්‍රමාණයක් යම් පුද්ගලයෙකු විසින් අනවසරයෙන් භුක්ති විදින අතර, එහි අඹ, පොල් වැනි දිර්ඝකාලින වගාවක් සිදු කර ඇති අතර එම අනවසරකරු ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | අධිකාරිය සතු සංවේදී ප්‍රදේශ හා කලාප ආරක්ෂා කළයුතුය. |
| e | අදාළ රක්ෂිතයේ ශේෂ ප්‍රදේශය තුළ අක්කර 20 ක භූමි ප්‍රමාණයක් ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානයකට ලබාදීමට අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ හා | මෙම අ.ජ.පි. 366 අති 29 කැ.අ. 156 ප්‍රමාණයෙන් හෙක්.53.9496 ඔරුගලයාය තෙල්හිරියාව කැලේ ශේෂ ප්‍රදේශය ලෙස මූලික සැළැස්මේ වෙන්කරන ලද ඉඩමක් වන අතර, එම ප්‍රදේශයේ ඉඩම් පරිහරණය සැළකිල්ලට ගෙන, ජාත්‍යන්තර භාවනා | අධිකාරිය සතු සංවේදී ප්‍රදේශ හා කලාප ආරක්ෂා කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැලසුම්) විසින් 2021 වර්ෂයේදී අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වෙතත් අදාළ භූමිය සඳහා විධිමත් බදු අනුමැතිය ලබාදීමට සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිර්දේශිත අක්කර 20 ක භූමි ප්‍රමාණයට පරිබාහිරව කුටි රාශියක් තැනින් තැන ඉදිකර ඇති බවත් එම මුළු ප්‍රමාණය මැනුම් කිරීමේදී එහි අක්කර 87 ක ප්‍රමාණයක් ඇති බවත්, ඊට පරිබාහිරව තවදුරටත් කුටි ඉදිකරමින් පවතින බවත් තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් දැනුම්දී තිබුණි. මේ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ලබා දෙන මෙන් අධ්‍යක්ෂ ජනරාල් ඇමතු ලිපියෙන් ඉල්ලා තිබූ නමුත්, විගණිත දින වන 2024 මාර්තු 25 දක්වා ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මධ්‍යස්ථානය සඳහා අක්. 20 ක භූමි ප්‍රමාණයක් වෙන් කිරීම සඳහා නිර්දේශ ලබාදීම සිදුකරන ලදී. එම නිර්දේශ ලබාදීමේදී 2020 වර්ෂයේදී මෙම භූමියේ වන අලි උවදුරෙන් සිදුවූ මිනිස් ඝාතනය හේතුවෙන් යටිකැළය ඉවත් කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගනු ලැබූ තීරණ ක්‍රියාතමක කිරීමට අදාලව සිදුකල ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවේ නිරීක්ෂණ සැළකිල්ලට ගන්නා ලදී. ඒ අනුව, අක්කර 20 කට වැඩි භූමි ප්‍රමාණයක් ආරණ්‍යයක් සඳහා නගර ආශ්‍රිත ප්‍රදේශයකින් වෙන්කිරීම නිර්දේශ කළ නොහැකි බව මාගේ උපදෙස් මත ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර උපදෙස් ලබාදී ඇත. | |
| (ඊ) | 1995 ජුලි 17 වෙනි දින එක් පුද්ගලික සමාගම වෙත බැහැර කර තිබූ මු.පි.මහ 4971 ඉඩමේ කැබලි අංක 03 හා 05 දරන ඉඩම් කොටස් එම සමාගම විසින් බිස්කට් සමාගමක් වෙත අවිධිමත්ව අන්සතු කර තිබුණු අතර, බදු මුදල් ගෙවීමද පැහැර හැර තිබුණි. මේ හේතුවෙන් 2019 නොවැම්බර් 06 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් එකී තේරීම්ලාභීත්වය අවලංගු කර තිබුණි. එම සමාගම 2023 දෙසැම්බර් 31 දින වනවිට ඉඩම සියයට 75 කට වැඩි එනම් පූර්ණ සංවර්ධිත තත්ත්වයකට සංවර්ධනය කර ආදායම් උපයා තිබුණද, ඉඩමේ තක්සේරුව ලබාගෙන බදු අයකිරීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියට ලැබිය යුතු ආදායම් අහිමිව තිබුණි. | අවිධිමත් ලෙස භුක්ති විදින වර්තමාන භුක්ති කරු නමින් එය විධිමත් කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට නේවාසික ව්‍යාපාර කළමනාකරු අනුමැතිය ඉල්ලා එහෙත් ජනාධිපති ලේකම්ගේ 2022.11.11 දිනැති ලිපිය මගින් නව ඉඩම බැහැර කිරීමේ කටයුතු අත්හිටුවා ඇති බැවින් වර්තමාන භුක්තිකරු නමින් බදු අයිතිය විධිමත් කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට අනුමැතිය ලබා දී නොමැත. ජනාධිපති කාර්යාලය මගින් ඉහත ලිපිය මගින් පනවා ඇති වාරණය ඉවත් කල පසු වර්තමාන භුක්තිකරු නමින් බදු අයිතිය විධිමත් කිරීම සඳහා ඉදිරි කටයුතු කල හැකි බව වාර්තා කරමි. | නව බදු ගිවිසුම්වලට එළඹීටත්, ඉඩම තක්සේරු කර හිඟ බදු අයකර ගැනීම කළයුතුය. |
| (උ) | වැනිලා, ගම්මිරිස්, කුරුඳු හා ඉඟුරු ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා කොත්මලේ කඩදොර ජනාවාසයේ හෙක්ටයාර 0.226 යුත් ඉඩමක් පුද්ගලික සමාගමක් වෙත 2021 ජනවාරි 05 දින භාරදී තිබුණි. එසේ වුවද ඉඩම හෝ ගොඩනැගිලි සඳහා තක්සේරුවක් ලබාගෙන අධිකාරියට අය | මෙම ආයෝජකයා වෙත අපනයන බෝග සැකසුම් කිරීමේ කර්මාන්තශාලාවක් ස්ථාපනය කිරීමට හැකිවන පරිදි ඉඩමේ භුක්තිය භාරදී ඇත. නමුත් බදු අයකිරීමට විධිමත් රජයේ තක්සේරුවක් හෝ විධිමත් අනුමැතියක් ද ලැබී නොමැත. නමුත් මේ අය ඉඩම භුක්ති විදින බැවින් හා රජයට ගාස්තු අය නොවන බැවින් දළ තක්සේරුව ලබා | බදු ගිවිසුම්වලට එළඹීමටත්, ඉඩම තක්සේරු කර හිඟ බදු අයකර ගැනීමටත් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | වියයුතු ආදායම් අයකර ගෙන නොතිබුණි. | ගැනීමට කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | |
| (ඍ) | රඹකැන්ඕය කලාපයේ පොල්ලේබැද්ද අක්කරදාහ ප්‍රදේශයෙන් දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම හා විදේශීය මූල්‍ය පහසුකම් යටතේ ආයෝජන අවස්ථා සඳහා ඉඩම් ලබාදීම යටතේ ආයෝජකයන් 04 දෙනෙකු වෙත අක්කර 1,750 ක් ලබාදී තිබුණි. එහිදී, | | |
| (i) | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත අක්කර 150 ක් 2020 වර්ෂයේදී ලබාදී තිබුණද, ඉඩම නිසි පරිදි මැනුම් කර විධිමත් ගිවිසුමකින් ලබාදී නොතිබුණු අතර 2020, 2021, 2022 හා 2023 වර්ෂ සඳහා බදු හෝ අය වියයුතු බදු ගිණුම් ගතකර නොතිබුණි. | ඉංජිනේරුමය කාර්යන් පිළිබද මධ්‍යම උපදේශක කාර්යංශය වෙතින් අයවිය යුතු 2021 යල කන්නයේ සිට 2023/24 මහ කන්නය දක්වා වූ හිඟ බදු මුදල එකතුව රු 4,050,000 ගණනය කර ඇති අතර ගිණුම් ගත කර නිවැරදි කිරිමට කටයුතු කරමි. | බදු ගිවිසුම්වලට එළඹීමටත්, ඉඩම තක්සේරු කර හිඟ බදු අයකර ගැනීමටත් කටයුතු කළයුතුය. |
| (ii) | වැවිලි සමාගමක් වෙත බඩඉරිඟු වගාව සඳහා ලබාදී තිබූ අක්කර 500 ඔවුන් විසින් අතහැර දමා තිබුණි. | අභියාචනාධිකරණයේ අංක CA(writ) 70/2021 දරන නඩුව පවරා ඇති බැවින් මෙම ඉඩම සංවර්ධන කටයුතු අතිරේක සොලිස්ටර් ජනරාල් විසින් අත්හිටුවා ඇත .ඒ අනුව අදාළ ආයෝජකයින් ඉඩම අතහැර ගොස් ඇත . | නඩු කටයුතු අවසන් වූ වහාම ඉඩම් සංවර්ධනය කිරීමට කටයුතු කළයුතුය. |
| (iii) | කෘෂිකාර්මික සමාගමක් වෙත මූලිකව නිදහස් කර තිබූ අක්කර 250 සඳහා 2024 මැයි 26 දක්වාම බදු අනුමැතියක් ලබාදී හෝ බදු අයකරගෙන නොතිබුණු අතර, එකඟවූ පරිදි රු.1,125,000 ක කාර්යසාධන බැඳුම්කරයක් ගෙන නොතිබුණි. | • මෙම සමාගම වෙතින් 2020/2021 මහ කන්නයට අදාලව කාර්යසාධන බඳුකරය අයකර ගෙන ඇත.<br>• මෙම ආයෝජකයා වෙත කන්න බදු ගෙවන ලෙස අධ්‍යක්ෂ (ඉඩම්) ගේ අංක **DL/**10/02/7-37 හා 2023.01.16 දිනැති ලිපිය මගින්ද දැනුම් දීම් සිදුකර ඇත.<br>• එම ලිපි සඳහාද නිසි ප්‍රතිචාර දක්වා නොමැති බැවින් බදු මුදල් නොගෙවීම හා වගා කටයුතු නොකිරීම මත මෙම ඉඩමද අවලංගු කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. | ආයෝජකයින්ගේ බදු අයිතිය අවලංගු කර හිඟ බදු අයකර ගත යුතුය. |
| (එ) | බී කලාපයේ දමින්න කොට්ඨාශයේ අළුත්වැව ඒකකයෙන් කෘෂිකාර්මික ව්‍යාපෘති යටතේ පොල් වගා කිරීම සඳහා වැවිලි සමාගමක් වෙත දීර්ඝකාලීන බදු පදනම මත අක්කර 100 ක් අවුරුදු 30 ක කාලයකට ලබාදීම පොලොන්නරුව දිසාපති මගින් සිදුකර ඇතත්, අදාළ මුල් ලිපිගොනුව එම කාර්යාලයේදී අස්ථාන ගතවී තිබීම හේතුවෙන් ඉඩමට අදාළ මුල් තක්සේරුව අධිකාරිය වෙත ලැබී නොතිබුණි.රජයේ ඉඩම් ආඥා පනත | මෙම ඉඩම් මුල් අවධියේ දී බැහැර කර ඇත්තේ පොලොන්නරුව දිසාපති කාර්යාලයෙන් වන අතර එයට අදාල මුල් ලිපි ගොනුව එම කාර්යාලයේ දී අස්ථානගත වීම හේතුවෙන් මෙම අධිකාරිය වෙත ලබා දී නොමැත.එම ඉඩම් සඳහාකැබලි 03 ක් වන සේ දීර්ඝකාලීන බදුකර නිකුත් කර ඇත. කැබලි අංක 488 සඳහා ආරම්භක බදු මුදල රු. 202 ක් ද කැබලි අංක 487 සඳහා ආරම්භක බදු මුදල රු. 203 ක් ද , කැබලි අංක 485 සඳහා ආරම්භක බදු මුදල රු. 396 ක් ද | ඉඩම් තක්සේරු කර බදු අය කර බදු කාලය අවසන් ඉඩම් සඳහා නව බදු ගිවිසුම්වලට එළඹීමටත්, චක්‍රලේඛ ප්‍රකාරව බදු සංශෝධන යාවත්කාලීනකොට හිඟ බදු අයකර ගැනීම කළ යුතුය. |

යටතේ 1983 දෙසැම්බර් 13 දින සිට අදාළව දීර්ඝකාලීන බලපත්‍රයක් උක්ත සමාගමට ලබාදී තිබුණි.ඒ අනුව පළමු බදු කාලය 2013 දෙසැම්බර් 14 දිනෙන් අවසන්වී තිබුණි.අනතුරුව ඉඩමේ අක්කර 100 සඳහාම වර්ෂයකට රු.7,302 බැගින් 2013 සිට 2017 දක්වාද, වර්ෂයකට රු.8,764 බැගින් 2018 සිට 2021 දක්වා ද එකතුව රු. 80,330 ක් අධිකාරිය විසින් එම සමාගමෙන් අයකර තිබුණි.2013 වර්ෂයේ පළමු බදු කාලය අවසන්වූ මෙම ඉඩමට අදාළව වෙනත් ආයතනයක් දීර්ඝකාලීන බද්දක් ලබා දෙන ලෙස 2013 වර්ෂයේ සිට ඉල්ලීම් කරමින් සිටි අතර, එහිදී ලබාගත් රජයේ තක්සේරුව අනුව මෙම පොල් අක්කර 100 ක ඉඩමේ තක්සේරු වටිනාකම 2013 දෙසැම්බර් 12 දිනට රු.1,500,000 ක් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර තිබුණි. ඒ අනුව මෙම ඉඩම සඳහා 2014 සිට 2018 දක්වා වර්ෂයකට රු.604,000 බැගින් රු.3,020,000 ක් ද, 2019 සිට 2022 දක්වා වර්ෂයකට රු.724,800 බැගින් රු.2,899,200 ක් ද ලෙස එකතුව රු.5,919,200 ක මුදලක් අය කළයුතු වුවත්, අධිකාරිය අයකර තිබුණේ රු.80,330 මුදලකි.ඒ අනුව මෙම ආයෝජන ව්‍යාපෘතිය මඟින් අධිකාරියට අයවිය යුතු රු.5,838,870 ක මුදලක් අහිමිවී තිබුණි.

වශයෙන් දක්වා තිබුණි. මෙම බදු මුදල වසර 5 කට වරක් සියයට 50 බැගින් ප්‍රතිශෝධනය වන අතර 2016/02 චක්‍රලේඛය පරිදි මෙම බදු ප්‍රතිශෝධනය සියයට 20 දක්වා අඩු කර ඇත. එයට අමතරව පළමු වසර 30 ක බදු කාලය අවසන් වීමෙන් අනතුරුව නැවත බදු කාලය දීර්ඝ කිරීමේ දී අවසන් වර්ෂයේ අය කල බදු මුදලට සියයට 20 ක බදු ප්‍රමාණයක් එකතු කර දෙවන බදු කාලයේ පළමු බදු මුදල ගණනය කිරීම සිදු කල යුතු බව දක්වා ඇත. ඒ අනුව මෙම බදුකරුගේ මුල් වසර 30 ක බදු කාලය අවසන් වීමේ දී පැවති බදු මුදලට සියයට 20 ක අගයක් එකතු කර දෙවන වසර 30 හි බදු කාලයට අදාල බදු මුදල ගණනය කර ඇත. මෙම බදු ගණනය කිරීමේ දී නියමිත චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර ඇති අතර නියමිත පරිදි බදු ගණනය කිරීම හේතුවෙන් රජයට පාඩුවක් සිදු වී නොමැත.

(ඒ) අධිකාරියට අයත් වත්කම් බාහිර පාර්ශවයන්ට ලබාදීම

(i) අධිකාරියට අයත් හෙක්ටයාර 1.7176 ක භූමි භාගයක පිහිටි කොත්මලේ නිවාඩු නිකේතන ප්‍රධාන ගොඩනැගිල්ල,ක්‍රීඩා සංකීර්ණය, පිහිනුම් තටාකය සහ නිවාස ගොඩනැගිලි 15 කින් යුක්ත නිකේතනය සාමාන්‍ය පිළිවෙතින් බැහැරව රු.300,000 ක මාසික කළමනාකරණ ගාස්තුවකට පෞද්ගලික පාර්ශවයකට 2013 නොවැම්බර් මස සිට වසර 10 ක කාලයකට පවරාදී තිබුණි.මෙම කළමනාකරණ ගාස්තුව තීරණය කළ ආකාරය විගණනයට ඉදිරිපත් නොවූ අතර එම කළමනාකරණ ගිවිසුමේ කොන්දේසි අනුව එකඟවූ මාසික ගාස්තුව දෙපාර්ශවයේ

2010 ඔක්තෝබර්. 06 වන දින පැවති 219 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණ අංක 2914 මගින් මේ සඳහා අනුමැතිය ලබා දී ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකාර (වික්ටෝරියා/කොත්මලේ) විසින් තක්සේරු දෙපාර්තුමේන්තු වෙතින් 2023 දෙසැම්බර් මස සිට 2028 නොවැම්බර් දක්වා මාසික කුලිය තක්සේරු කර ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාසික කුලී තක්සේරු මුදල රු.440,000.00 ලෙස දන්වා ඇත. ඒ අනුව නව මාසික කුලී තක්සේරු මුදලද ඇතුලත්කර 2024.09.05 දින වසර 05 ක කාලයක් සඳහා (2023.11.05 දින සිට ඉදිරියට වසර 05 ක්) විධිමත් පරිදි නව ගිවිසුමකට ඇතුලත්ව ඇත. 2024 මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරමි.

බාහිර ආයෝජකයින් වෙත බදුදීමේදී ඒ සඳහා සාමාන්‍ය පිළිවෙත අනුගමනය කර බදු ගිවිසුමකට එළඹිය යුතු අතර එය ආයෝජන දේපලක් ලෙස ගිණුම්වල දැක්විය යුතුය.

| | | | |
|---|---|---|---|
| | එකඟතාවය මත වර්ෂ 05 කට පසු වැඩි කළයුතු වුවද 2018 නොවැම්බර් 25 දිනෙන් පසුව එම ගාස්තුව වැඩි කිරීමට කටයුතු කර නොතිබුණි. එම ගොඩනැගිල්ල සතු ආපන ශාලාව, මුළුතැන්ගෙය, කාර්යාලය, මත්පැන් හල, ක්‍රීඩා සංකීර්ණය, පිහිනුම් තටාකය, පෙරහන් කාමරය, එළිමහන් වැසිකිලිය හා නිවාසවල (ගොඩනැගිලි අංක 01, 02, 03, 04, 05, 06, 07, 08, 09, 11, 12 ඒ, 12 බී, 14, 15, 18) පිරිවැය හෝ තක්සේරු වටිනාකම ආයෝජන දේපලක් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | | |
| (ii) | අධිකාරියට අයත්ව තිබූ දිගන විලේජ් රිසෝට් 1993 ජුනි 01 දින පුද්ගලික සමාගමකට අවබෝධතා ගිවිසුමකින් අක්කර 07 ක ඉඩම සහ සියලු ගෘහ භාණ්ඩ හා උපකරණ ඇතුළත් ප්‍රධාන ශාලා ගොඩනැගිල්ල, පිහිනුම් තටාකය, ක්‍රීඩා කාමර, නවාතැන් කාමර සහිත පරිශ්‍රය පවරාදී තිබුණි.<br>ආයෝජක පාර්ශවය නීත්‍යානුකූලව ලබාදුන් ප්‍රමාණයට අමතරව තවත් අක්කර 03 ක පමණ ප්‍රදේශයක්ද භුක්ති විඳීමට කටයුතු කර තිබුණි.2005 වර්ෂයේදී සමාගම වැඩිපුර භුක්ති විඳින ඉඩම් කොටස් බෙදා වෙන් කිරීමට අධිකාරිය කටයුතු කිරීමේදී ඉහත සමාගම විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර, 2022 නොවැම්බර් 21 දිනැති නඩු තීන්දුව අනුව 2023 පෙබරවාරි 26 දින හෝ එදිනට පෙර නියමිත පරිදි පරිශ්‍රය අධිකාරිය වෙත භාරදිය යුතු වුවත්, විධිමත්ව දේපල නැවත භාරදීමකින් තොරව පරිශ්‍රයෙන් ඉවත්වී ගොස් තිබුණි.විගණිත දින වූ 2024 මාර්තු 22 වන විට අදාළ පරිශ්‍රයේ මෙහෙයුම් කටයුතු නතරවී වසරක් ගතවී ඇති අතර, පරිශ්‍රය තුළට ඇතුළුවීමට නොහැකි තරමට කැලෑ වැවී වල්බිහිවී ඇති අතර පරිශ්‍රය ඇතුළු අනිකුත් දේපල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් යොදා නොතිබුණි.<br>ආයෝජනයෙන් එකඟ වූ ප්‍රතිලාභ | මහවැලි අධිකාරියේ මූලික විරෝධතාව පිළිගනිමින් පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභා කර ඇත. එම තීන්දුව අනුව මෙම පරිශ්‍රයේ භුක්තිය ලබා ගැනීමට නොහැකි බැවින් පරිශ්‍රයේ ඒ වන විට සිටින ලද අනවසරකරුවන් හඳුනාගෙන නිල නිවාසය අධිකාරිය වෙත භාරදීමට කැමැත්ත පලකොට භාරදෙන ලදී. ඒ වන විට අතහැර දමන ලද නිල නිවාස වල සන්තකය ඒ සඳහා පත් කරන ලද කමිටුවක් මඟින් අප අධිකාරිය වෙත භාරගැනීමට කටයුතු කරන ලදී. එලෙස භාර නොදුන් නිල නිවාස සහ නිවාඩු නිකේතන සඳහා 2023.01.28 දින රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා නඩු 03 කට අදාළ සන්තකය මේ වන විට අප අධිකාරිය වෙත පවරා ගෙන ඇති අතර 78086 සහ 78087 දරණ නඩුවල නියෝග 2024.10.18 දින ලබා දීමට නියමිතව ඇත.<br>මෙම පරිශ්‍රයේ චිත්‍රාගාරයක් පිහිටුවීමට යෝජනාවක් ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් වී ඇති බැවින් ජනදිපති කාර්යාලයේ පූර්ව අනුමැතියකින් තොරව බැහැර නොකරන ලෙස දන්වා ඇත. ඉන්පසු ජනාධිපති කාර්යාලය 2023.11.03 දිනැතිව නැවත අනවසරකරුගෙන් සමාගම වෙත අවුරුදු 30 කට බදු දීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇතත් අධිකාරිය වෙත විධිමත්ව පවරා ගැනීමට අවශ්‍ය සියළු කටයුතු සිදු කරමින් පවතී.<br>මෙම පරිශ්‍රය ආයෝජන පාර්ශවය විසින් අදාල අධිකරණ තීරණයෙන් අප අධිකාරියට විධිමත්ව භාරදී නොමැති හෙයින් අප ආයතනයේ නිලධාරීන්ට මෙම පරිශ්‍රයට | මෙම පරිශ්‍රය නැවත පවරාගෙන නැවත බදුදීම් කළයුතුය.<br>මෙම පරිශ්‍රයේ ප්‍රමාණවත් ආරක්ෂාවක් යෙදවීමටත්,අලාභය සඳහා වගකිවයුතු පාර්ශව හඳුනා ගැනීම කළයුතුය. හිඟ කුලී මුදල් අයකර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලැබී නොතිබුණු අතර, ආයෝජිත පාර්ශවය 1993 වර්ෂයේ සිට වසර 20 ක කාලයක් මෙම පරිශ්‍රය බාහිර පුද්ගලයන් හා ආයතන වෙත විවිධ උත්සව කටයුතු සහ නේවාසික පහසුකම් සඳහා ලබාදී ආදායම් උපයා තිබුනද, අධිකාරිය වෙත කිසිදු මුදලක් නොගෙවා ලැබිය යුතු ලෙස ගණනය කර ඇති හිඟ කුලී මුදල රු.4,500,000 ක් විය. | නීත්‍යානුකූලව ඇතුළුවීමට නොහැකි වී ඇත. එබැවින් ස්ථානය විවෘත කර, සිදුවී ඇති අලාභ හානිය තක්සේරු කිරීමට නොහැකිව ඇත. තවද මෙම ස්ථානයේ ආරක්ෂාව සඳහා සහකාර අධ්‍යක්ෂ (මහවැලි ආරක්ෂක බලකාය) විසින් ආරක්ෂක නියාමකවරුන් යොදවා ඇත. මේ වන විට ආරක්ෂාව සපයා ඇත. | |
| | (iii) නිලගම ප්‍රදේශයෙන් සැලසුම් අංක 935 හා 997 යටතේ පුද්ගලයින් 33 දෙනෙකු වෙත 2005 වර්ෂයේ බැහැර කර තිබූ ඉඩම් කට්ටි 33 ක් වෙනුවෙන්ද නිසි පරිදි බදු අයකරගෙන නොතිබුණි. | සැලසුම් අංක 935හා 997යටතේ කිසිදු පුද්ගයකු සඳහා ඉඩම් බැහැර කර නොමැති අතර නඩු කටයුතු අවසන් වනතුරු ඉඩම් බැහැර කිරීම හා බදු අයකිරීමද නතර කර ඇත. | හිඟ කුලී මුදල් අයකර ගතයුතුය. |
| (ඔ) | පෞද්ගලික දූරකතන සමාගම් වෙත දුරකථන කුළුණු ඉදිකිරීම සඳහා කලාප 04 ක ඉඩම් බදුදී දූරකතන කුළුණු 45 ක් ඉදිකර තිබුණි.2024 මැයි 10 දින වනවිට දූරකතන කුළුණු 23 ක් සඳහා ඉඩම් බැහැර කර වසර 2 ත් 28 ත් අතර කාලයක් ගතවී තිබුණද ඒ සඳහා රජයේ තක්සේරුව ලබා නොගෙන දළ තක්සේරුව මත පදනම්ව බදු අයකර තිබූ අතර දූරකතන කුළුණු 07 ක් සඳහා ඉඩම් බැහැර කර වසර 2 ත් 13 ත් අතර කාලයක් ගතවී තිබුණ ද ඉඩම් තක්සේරු කර බදු අය කර නොතිබුණි. මෙහිදී ඉඩම් බැහැර කිරීමේදී අධිකාරිය හා එම සමාගම් ගිවිසුම්ගත නොවීම නිසා අධිකාරියේ අනුමැතියකින් තොරව එම කුළුණු වෙනත් දූරකතන සමාගම් වෙත භුක්තිය මාරු කර තිබුණි. එබැවින් බදු ගෙවීම් පැහැර හැරීමේදී ඒවා නැවත අයකර ගැනීම ගැටළු සහගතවී තිබුණි. | සී කලාපය තුල දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වල වෙනත් සමාගම් වල දුරකථන උපකරණ සවිකිරීම සම්බන්ධ විස්තර ලබා දෙන ලෙස මේ වන විට දැනුම් දී ඇත.<br>එල් කලාපයේ ස්ථාපිත සම්ප්‍රේෂණ කුළුණු සමාගම් විසින් මහවැලි අධිකාරියේ එකඟතාවය මත අනෙකුත් දුරකථන සමාගම් වෙත ඒකාබද්ධ සම්ප්‍රේෂණ කටයුතු වෙනුවෙන් ලබා දී ඇත. එම ඒකාබද්ධ සම්ප්‍රේෂණ කටයුතු සිදුකරනු ලබන සමාගම් වෙතින්ද බදු මුදල් අයකර ගැනීම මේ වනවිට සිදුකෙරෙමින් පවතී. | ගිවිසුම්ගතව හා රජයේ තක්සේරුව මත ඉඩම් බදුදීමත්,උප බදුදීම් තොරතුරු කැඳවීම හා හිග බදු අයකර අයකර ගැනීම කල යුතුය. |
| (ඕ) | වලව කලාපයේ ප්‍රාදේශීය කර්මාන්තපුර වැඩසටහන 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මකව තිබියදී නව කර්මාන්තපුරයක් එම කොට්ඨාශයේම හල්මිල්ලකැටිය ඒකකයේ ඉදිකිරීම 2020 වර්ෂයේ ආරම්භ කර තිබුණි. මෙසේ නව කර්මාන්තපුරයක් ආරම්භ කිරීමට අදාළ ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් හෝ සංකල්ප පත්‍රිකාවක් විගණනයට ඉදිරිපත් නොවීය.කෙසේ වෙතත් 2024 අප්‍රේල් 28 දින දක්වා එම කර්මාන්තපුරයේ කිසිදු කර්මාන්ත ශාලාවක් ආරම්භ කර නොතිබුණි. | මූලික ව්‍යූහාත්මක සැළැස්මේ කර්මාන්ත සඳහා වෙන්කර ඌණ උපයෝජිතව පැවැති භූමියක් කර්මාන්ත භාවිතය සඳහා පුවත්පත් මගින් අභිලාශයන් කැඳවා ඇගයීමෙන් අනතුරුව ඉඩම් ප්‍රමාණ වෙන්කර ඇත. 2020 වර්ෂයේ මූලික සැළසුම් ආරම්භ කලඳ, ආයෝජකයින් තෝරා බදු අනුමැතිය ලබාදීම ආදී විධිමත් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සඳහා වසර 02 කට අධික කාලයක් ගතවී ඇති අතර, ආර්ථිකය තුළ සිදුවූ පසුබෑම හේතුවෙන් කර්මාන්තකරුවන් නව කර්මාන්ත ආරම්භ නොකිරීම හේතුවෙන් කර්මාන්ත ස්ථාපිත කිරීමේ පසුබෑමක් පැවතිණි. 2022 වර්ෂයේ | නව කර්මාන්ත පුරයට වෙන් කළ සම්පත් ඵලදායී අන්දමින් භාවිතයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සිට නව ඉඩම් බැහැර කිරීම තාවකාලිකව නවතා ඇති බැවින් නව ආයෝජකයින් තෝරාගැනීමේ හැකියාවක්ද නොමැතිවී ඇත. | |
| (ක) | නිවාස ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම විගණිත දින වූ 2024 මාර්තු 19 වන විට අධිකාරියේ වලව කලාපය තුළ නිවාස ව්‍යාපෘති 35 ක් ක්‍රියාත්මක කිරීමට අදාළ කොන්දේසි ඇතුළත් අවබෝධතා ගිවිසුමක් අධිකාරිය හා නිවාස සංවර්ධන අධිකාරිය අතර ඇතිකර ගැනීමකින් තොරව අධිකාරිය සතු හෙක්ටයාර 69 ක් 2018 හා 2019 කාලපරිච්ඡේදයේදී නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබුණද විගණිත දින වූ 2024 අප්‍රේල් 30 දක්වා මෙම ඉඩම් නීත්‍යානුකූලව නිවාස සංවර්ධන අධිකාරිය වෙත බැහැර කර නොතිබුණි.මයුරපුර කොට්ඨාශයේ රුහුණුපුර, කරුවලවැව, බොල්හිද, ගල්වැව, බැල්ලගස්වැව, කටුවැව සහ තිස්සපුර ඒකකවලින් අක්කර 65 ½ ක් මෙසේ නිවාස සංවර්ධන අධිකාරිය වෙත නිවාස යෝජනා ක්‍රම වෙනුවෙන් ලබාදී තිබුණද, එසේ ලබාදීමට ප්‍රථම අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) හා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. නිසි සැලසුමකින් හා විධිමත් අනුමැතියකින් තොරව මෙම ඉඩම් බැහැර කිරීම හේතුවෙන් විගණිත දින වන 2024 මාර්තු 19 දක්වා මෙම ඉඩම් වෙනුවෙන් ලබා ගතයුතු බදු මුදල් අයකර ගැනීමට ද නොහැකිවී තිබුණි. | මේ වන විට නිවාස සංවර්ධන අධිකාරිය වෙත නිවාස ව්‍යාපෘති 41 ක් වෙනුවෙන් ඉඩම් කට්ටි 37 ක් බැහැර කිරීමට හඳුනාගෙන ඇති අතර ඉන් ඉඩම් කොටස් 14ක් සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන ඇත. තවත් ව්‍යාපෘති 14 ක් සඳහා අධ්‍යක්ෂ (ඉ.ප.සැ) ගේ හා කලාපයේ භෞතික සැලසුම් කමිටු නිර්දේශයද ලබා ගෙන ඇත.අධ්‍යක්ෂ ජනරාල්ගේ ආවරණ අනුමැතිය ලබා දී ඇති ඉඩම් සඳහා විධිමත් බදු අනුමැතිය ලබා ගැනීමට සහ මේ වන තෙක් අධ්‍යක්ෂ (ඉ.ප.සැ) ගේ නිර්දේශ ලබාගෙන නොමැති නිවාස සංවර්ධන ව්‍යාපෘති 09 ක් සඳහා අධ්‍යක්ෂ (ඉ.ප.සැ) ගේ නිර්දේශ ලබාගැනීම සඳහා අදාල ලේඛන ඉදිරිපත් කරන ලෙස අදාළ කොට්ඨාස කළමනාකාරවරුන් දැනුවත් කර ඇත. | නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ කොන්දේසි ඇතුළත් අවබෝධතා ගිවිසුමක් ඇති කරගතයුතුය. ඉඩම් ආඥා පනත අනුව ඉඩම් බැහැර කළයුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි බී හා එල් කලාපවල ව්‍යාප්තවී ඇති උග්‍ර වකුගඩු රෝගයට පිළියමක් වශයෙන් ප්‍රමිතියෙන් යුත් ජල සැපයුමක් සහතික කිරීමේ අරමුණින් රු.80,000,000 ක් වැය කර ප්‍රති ආශ්‍රැත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් සැපයීම, ඉදිකිරීම, සවිකිරීම හා ඊට අනුශාංගික පහසුකම් සැපයීම සහ වසර 10 ක කාලයක් නඩත්තු කිරීම සඳහා 2015 වර්ෂයේදී අධිකාරිය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව අතර ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. යන්ත්‍ර ස්ථාපිත කිරීමේදී ස්ථානීය පරීක්ෂාවන් හා ඇගයීමක් සිදුකර ස්ථාන තෝරා නොගැනීම හේතුවෙන් පිරිපහදු යන්ත්‍ර 05 ක් | එල් කලාපයේ ජල පිරිපහදු යන්ත්‍ර 12 ක් 2015, 2016, 2017 හා 2018 වර්ෂවලදී ස්ථාපිත කර ඒවා නඩත්තු කරගෙන යාමේ ගැටලු මතු වී ඇත. නමුත් 2023 වර්ෂයේ විධිමත්ව මෙම ජල පිරිපහදු යන්ත්‍ර ගිවිසුමකින් ගොවි සංවිධානය වෙත පවරා දී ඇත.<br>බී කලාපය කලාපයේ ප්‍රති ආශ්‍රිත ජලපෙරණ අක්‍රීය මට්ටමේ පැවති යන්ත්‍ර 09 ම සක්‍රීය මට්ටමේ පවතී. ඒකකවල ස්ථාපිත කර ඇති ජලපෙරණ යන්ත්‍ර වලින් ප්‍රතිලාභීන් ඉහල ඵලදායිතාවක් ලබා නොගන්නා අතර ක්ෂේත්‍ර අධ්‍යනයකින් පසු ඉහත නම් සඳහන් යන්ත්‍ර 03 | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම,සුදුසුම ස්ථාන තෝරා ගැනීම,අක්‍රීය යන්ත්‍ර කඩිනමින් අලුත්වැඩියා කර පිරිපහදු ජලය ලබාදීම හා නිෂ්කාර්යව පවතින පිරිපහදු යන්ත්‍ර අවශ්‍යාම ස්ථානවල නැවත ස්ථාපනය කිරීම |

| | | | |
|---|---|---|---|
| | නිෂ්කාර්යව පැවතුණු අතර, බී කලාපයේ යන්ත්‍ර 04 ක් සවිකිරීමෙන් පසු ක්‍රියාත්මක කර නොතිබුණි. බී කලාපයේ යන්ත්‍ර 09 ක් හා එල් කලාපයේ යන්ත්‍ර 05 ක් වශයෙන් 14 ක් 2024 මැයි 10 දින වනවිට අක්‍රිය තත්ත්වයේ පැවතුණි. එල් කලාපයේ අක්‍රීයව පැවති යන්ත්‍ර 05 න් 03 ක් 2024 මැයි 10 දින ගිවිසුම්ගතව අක්‍රිය තත්ත්වයේම පැවතියදී ගොවි සංවිධාන වෙත පවරා තිබුණි.ජල සැපයුම් දෙපාර්තමේන්තුව සමඟ ඇති කරගත් ගිවිසුමෙහි 13 වන වගන්තිය ප්‍රකාරව වසර 10 ක කාලයක් ජල පිරිපහදු ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු, සේවා සැපයීම සහ අමතර කොටස් සැපයීමට එම දෙපාර්තමේන්තුව එකඟවී තිබුණද, අදාළ ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එම දෙපාර්තමේන්තුව විසින් ඉටු කළයුතු කාර්යයන් එම ඉදිකිරීම් සිදුකරන අවස්ථාවේදීම ඉටුකර ගැනීමට අවශ්‍ය නිසි කළමනාකරණයක් හා අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අවශ්‍යතාවය පරිදි වෙනත් ස්ථාන සඳහා ස්ථාන ගත කිරීමට සැලසුම් කරමින් පවතී.එල් කලාපයේ යන්ත්‍ර 12 න් 05ක් අක්‍රීයව පැවති අතර 07ක් ක්‍රියාත්මකව පැවතුනි. ඒවා නැවත අලුත්වැඩියා කිරීම සඳහා අරමුදලක් ද ගොඩනගාගෙන නොතිබුණි.එල් කලාපයේ අක්‍රිය තත්වයේ පැවති යන්ත්‍ර 05 ම 2023 වර්ෂයේ විධිමත් ගිවිසුමකින් ගොවි සංවිධාන වෙත භාරදුන් අතර මේ දක්වා එම ජල පිරිපහදු යන්ත්‍ර අලුත්වැඩියා කර නැත. ජාතික ප්‍රජා ජල සැලසුම් දෙපාර්තමේන්තුවේ ගිවිසුම් ප්‍රකාරව වසර 10ක් දක්වා මෙම ජල පිරිපහදු යන්ත්‍ර සේවා කිරීම හා නඩත්තු කිරීම සිදු කළයුතු අතර ඔවුන් විසින් එම කොන්දේසි කඩකර ඇත. | කළයුතුය. |
| (ආ) | මොරගහකන්ද ජලාශය ඉදිකිරීම හේතුවෙන් නිවාස දේපල අහිමිවූ ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු 2012 වර්ෂයේදී ආරම්භ කර 2022 නොවැම්බර් වනවිට අවසන්වී තිබුණි.<br>මෙම නැවත පදිංචි කළ ජනතාවට බීමට සහ අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය වන ජල සැපයීම පිළිබඳ සැලසුම් සකස් නොකිරීම හේතුවෙන් විගණිත දින වන 2024 අප්‍රේල් 28 දින වනවිටත් වැල්ලේවෙල සහ නව ගුරුවෙල පදිංචි කළ පිළිවෙලින් පවුල් 47 ක් හා 426 ක් වෙනුවෙන් බීමට සහ අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් දෛනිකව බවුසර් රථ මඟින් ජලය ලබාදීමට සිදුවී තිබුණි. 2023 වර්ෂයේ රු.40,733,958 ක් හා 2024 ජනවාරි සිට මාර්තු දක්වා රු.8,548,473 ක මුදලක් වැය කර තිබුණි.<br>මෙසේ නැවත පදිංචි කළ ජනතාව අතුරින් ඒකක 03 ක එකතුව පවුල් 161 ක් සඳහා විගණිත දින වන 2024 අප්‍රේල් 28 දින වනවිටත් කුඹුරු ඉඩම් ලබාදී නොතිබුණි. ඔවුන්ගේ ජීවනෝපාය අහිමිවී තිබීම හේතුවෙන් ආරම්භයේදී ව්‍යාපෘතියෙන්ද, පසුව 2022 ජුලි මස සිට විගණිත දින වූ 2024 අප්‍රේල් 28 දින දක්වා අධිකාරිය විසින්ද වන ලෙස 2022 හා 2023 වර්ෂවල එකතුව රු. 13,882,846 ක් මෙම නැවත පදිංචිකරුවන්ගේ වියළි ආහාර සලාකය | මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූ ජනපදිකයින් වැල්ලෙවෙල හා ගුරුවෙල කොට්ඨාස වල නැවත පදිංචි කර ලද අතර ගුරුවෙල කොට්ඨාසය සඳහා බවුසර් රථ 08 කුත් වැල්ලෙවෙල කොට්ඨාසය සඳහා බවුසර් රථ 04 කුත් වශයෙන් යොදවා ඇත. එම කලාපය වෙත වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන 2024 සැප්තැම්බර් මස දක්වා යොද ගත් අතර වර්ෂයේ ඉතිරි මාස 03 සඳහා වාරිමාර්ග අමාත්‍යංශය මඟින් ප්‍රතිපාදන මුදල් ලබා දී ඇත.ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය මඟින් ජලය සැපයීම සඳහා පානීය ජල ව්‍යාපෘතියක් ආරම්භ කර එහි වැඩකටයුතු මේ වන විටත් කරගෙන යනු ලබන අතර ජල සැපයුම ලබා දීමට තවදුරටත් ප්‍රමාද වන බව සඳහන් කර ඇත.<br>නව සංවර්ධන කලාපයේ පදිංචි කරන ලද ජනතාව සඳහා ඔවුන් පදිංචි කර කුඹුරු ඉඩම් රළු මට්ටම් කිරීම තාක්ෂණ සේවා අංශයෙන් සිදුකර ගෙන ගියද මේ වනවිටත් එම රළු මට්ටම් කර ඇති හෝ කුඹුරු ඉඩම් ලබා නොදුන් ජනතාවට එම ඉඩම් ලබාදී අවසන් කල නොහැකිව ඇත්තේ ජනාධිපති ලේකම් විසින් මහවැලි අධිකාරිය වෙත යොමු කරන ලද අංක PS/LSA/00/08/මහවැලි (පොදු) හා 2022.11.11 දිනැති ලිපිය මඟින් ලබාදී | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යන සිදු කර අනාර්ථික වියදම් වළක්වා ගැනීම හා ආරම්භ කළ ව්‍යාපෘති නොපමාව නිම කල යුතුය. |

| | | |
|---|---|---|
| ලෙස ලබාදී ඇත. 2024 අප්‍රේල් 28 දිනට තවදුරටත් අක්කර 181.5 ක් කුඹුරු ලෙස සැකසීමට හඳුනාගෙන තිබූ අතර, ඉන් අක්කර 72 ක වනාන්තර භූමිය සම්පූර්ණයෙන් එළිපෙහෙළි කිරීමටද අක්කර 87 ක් රළු මට්ටම් කිරීමටද ඉතිරිව තිබුණි. | ඇති උපදෙස් හේතුවෙන් බව දන්වමි.එබැවින් ආයතනයක් වශයෙන් මහවැලි අධිකාරිය වන අප හට මෙම තත්වය සඳහා විසඳුමක් ලැබෙන තුරු දිගින් දිගටම වියලි සලාකය මසකට වරක් දැනට ඉතිරිව පවතින පවුල් 65 ක් සඳහා ලබාදීමට සිදුව ඇත. | |

(ඈ) නිල නිවාස පරිපාලනය

| | | |
|---|---|---|
| (i) අධිකාරියේ සී කලාපයේ නිල නිවාස භෞතික පරීක්ෂාවේදී කොට්ඨාශ 07 ක නිල නිවාස 775 කින් 192 ක් උපයෝජනය නොවී පැවති අතර, ඉතිරි නිල නිවාසද අලුත්වැඩියා කළයුතු මට්ටමේ පැවතුණි.නිල නිවාස නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා ඉතා ඉක්මනින් ගරා වැටෙන තත්ත්වයට පත්වී තිබූ අතර, හිඟ බදු අයකර ගැනීමද සතුටුදායක මට්ටමක නොපැවතුණි. | මෙම නිල නිවාස වසර 30 – 40 කට පෙර ඉදි කරන ලද ඒවා බැවින් යම් ප්‍රමාණයක් භාවිතයට නුසුදුසු මට්ටමේ පවතී. මේවා පිලිසකර භාවිතා කළහැකි මට්ටමට පත් කිරීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. එබැවින් ඉදිරියේ දී කලාපය වෙත වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂ කීපය තුල අළුත්වැඩියා කර භාවිතා කල හැකි නිල නිවාස මාසික කුලී පදනම මත මෙයට අදාල චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව ලබා දීමට කටයුතු කරමි. සම්පූර්ණ වශයෙන් අබලන් වූ නිල නිවාස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත ව කඩා ඉවත් කිරීමටත් රේඛීය ආයතන වල ඉල්ලීම් අනුව බැහැර කල යුතු නිළ නිවාස ද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන බැහැර කිරීමටද කටයුතු කරමි. | නිල නිවාස නඩත්තු කිරීම හා හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) වෙහෙරගල කොට්ඨාශයේ නිල නිවාස 66 ක් කජු සංස්ථාවට භාරදී තිබී නැවත මහවැලි අධිකාරියට ලැබී නිල නිවාස ලැයිස්තුවේ ඇතුළත් කර තිබුණද, ඒවායේ පරිපාලනය හා කුලී අයකර ගැනීම අධිකාරිය විසින් සිදුකරද නොතිබූ බව නිරීක්ෂණය විය. තවද එම නිල නිවාස ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | නිල නිවාස අප ආයතන වෙත විධිමත්ව භාරදීමක් සිදුව නොමැති අතර වත්කම් ලේඛණයේ ද ඇතුලත්ව නොමැත. ඒ අනුව විගණනය විසින් පෙන්වා දි ඇති කරුණු අනුව ඉදිරියේ දී විධිමත් කමිටුවක් පත්කර මෙම ගැටළුව නිරවුල් කිරිමට කටයුතු කරනු ලබන අතර මේ සඳහා විධිමත් තොරතුරු දත්ත පද්ධතියක් යාවත්කාලින කරමින් පවත්වාගෙන යාමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වමි. | නිල නිවාස ස්ථාවර වත්කම් ලේඛනයට ගැනීමට හා කුලී අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (iii) කුලී අය නොකර ගොවි සංවිධානවලට නිල නිවාස ලබාදී තිබූ අතර, ඒ සම්බන්ධයෙන් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. රු.372,264 ක හිඟ නිවාස කුලී මුදලක් අයවිය යුතුව පවතින නිල නිවසක් සමීපයේ අනවසරයෙන් පදිංචිකරු ඔහුගේ නිවස ඉදිකරන අතර, අදාළ නිල නිවසේ වහලය සම්පූර්ණයෙන් ගලවා ඉවත් කරද | කුලී අය නොකර ගොවි සංවිධානවලට ලබා දී ඇති නිල නිවාස වෙනුවෙන් එකගතා ගිවිසුම් යාවත්කාලීන කිරීමට හා ගිවිසුම් නොමැති අය සඳහා ගිවිසුම් සකස් කර ඒවා විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මෙහි සඳහන් පුද්ගලයාට විරුද්ධව අනවසරයෙන් පෞද්ගලික නිවසක් ඉදිකිරීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. තව ද මේ දක්වා නිල නිවාස | නිල නිවාස සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. | කුලී නොගෙවීම සම්බන්ධව එන්තරවාසි 38ක් යොමු කර ඇත. | |
| (ඈ) | කොත්මලේ ප්‍රදේශයේ පිහිටි අධිකාරියේ නිල නිවසක්, කොත්මලේ කඳවුරු භූමියේ ඇති ගොඩනැගිල්ලක් හා දොරගල වතු බංගලාව ඇතුළු ගොඩනැගිලි සහිත හෙක්ටයාර 1.311 ක පමණ වන ඉඩම අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙත ලබාදී ඇතත් විධිමත් බදු ගිවිසුමක් ගොඩනැගිලි වෙනුවෙන් රජයේ තක්සේරුව ලබාගෙන නොතිබුණි. ගොඩනැගිලි භාරදීමේදී ඒවායේ ඇති භාණ්ඩ සම්බන්ධ භාණ්ඩ වට්ටෝරු ලේඛන කිසිවක් යාවත්කාලීන කර ගොනුවට ඇතුළත් කර නොතිබුණි. මෙම ගොඩනැගිලි සියල්ල අතුරින් 57 බී දරන නිල නිවසින් පමණක් මාසිකව රු.3,000 ක කුලී මුදලක් අයවන අතර, අනිකුත් කිසිදු ගොඩනැගිල්ලකින් අධිකාරියට කිසිදු කුලී මුදලක් විගණිත දින වන 2024 මාර්තු 22 දක්වා අයවී නොතිබුණි. මෙම දේපල මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපල ලෙසද ලැබිය යුතු කුලී මුදල් හිඟ ආදායම් ලෙසද හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | විධිමත් බදු ගිවිසුමක් නොමැතිව නේවාසික ව්‍යාපාර කළමණාකාරවරයකුගේ අත්සනින් කොන්දේසි සහිතව ඉඩම් භාර දීම ඇත. මෙම ගොඩනැගිලි භාර දීමේ දී ගොඩනැගිලි විස්තර ලබා ගෙන ඇතත් භාණ්ඩ වට්ටෝරු ලේඛණයක් නොමැති බව පිළිගන්නා අතර ඒ අනුව ඉදිරියේදී මෙම ගොඩනැගිලි තුල පවතින භාණ්ඩ වට්ටෝරුගත කිරීමට කටයුතු කරමි. අංක 57 බී දරණ නිල නිවාසය සඳහා මසකට රු.3,000 ක් බැගින් ද පැරණි වතු බංගලාව සඳහා මසකට රු.10,000 බැගින් ද අය කිරීමට ගිවිසුම් සකස් කර ඇත. | කුලී ගිවිසුමකට එළඹී රජයේ තක්සේරු මත එම ගොඩනැගිලි කුලියට ලබාදිය යුතු අතර භාණ්ඩ වට්ටෝරු ලේඛන පිළියෙල කළයුතුය.හිඟ කුලී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළයුතුය. |
| (ඉ) | අධිකාරියේ දිගන සංචාරක බංගලාව ආසන්නයේ ඉදිකර තිබූ නිල නිවස පොලොන්නරුව ප්‍රදේශයේ කාන්තාවකට 2023 අගෝස්තු 08 දින ලබාදී තිබූ නමුත්, විගණිත දින වන 2024 මාර්තු 22 දින තෙක් විධිමත් බදු ගිවිසුමකට හෝ නිවාස කම්ටු අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.තවද, මෙම නිවස වහලය සම්පූර්ණයේ අළුත්වැඩියා කර තිබුණු අතර, ඒ වෙනුවෙන් අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය හෝ ඒ සම්බන්ධ වියදම් වාර්තා ඉදිරිපත් කිරීමත් හා එම වියදම් අධිකාරිය විසින් ප්‍රතිපූරණය නොකරන බවට තහවුරු කරමින් විධිමත් අවබෝධතා ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණි. | දිගන මහවැලි කඳවුර තුල පිහිටි නිල නිවාස, වීර පෙදෙස, අංක 121/4 ලිපිනයේ රණමුක මුදියන්සේලාගේ මල්ලිකා කුමාරි මහත්මිය වෙත විධිමත් පරිදි 2023.08.08 දින සිට 2024.08.07 දක්වා බදු ගිවිසුමක් ලෙස මාසික කුලිය රු.4,800 ක් වන පරිදි 2023.08.08 වන දින, ගිවිසුමක් මගින් ලබා දුන් අතර ඒ වන විටත් ජලය හා විදුලිය විසන්ධි කර තිබූ බැවින් අලුත්වැඩියා කර භාවිතා කල යුතුව ඇති බැවින් මාසික කුලිය ද අය කිරීමට හැකියාවක් නොමැති වූ බැවින් බදු ගිවිසුම අහෝසි විය.ඒ අනුව, මෙහි අලුත්වැඩියා කටයුතු සිදු වෙමින් පවතින අතර, සියයට 50 ක පමණ ප්‍රමාණයක් නිමකර ඇත. තවද, අදාල බදු ගිවිසුම කෙටුම්පත් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල අතර, ඒ සඳහා ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත, මේ වන විට නීති අංශයේ උපදෙස් පරිදි සකස් කර ඇත. | අවසරයකින් තොරව අධිකාරිය සතු දේපල භාවිතා කිරීමට ඉඩ නොදිය යුතුය. |
| (ඊ) | මනම්පිටිය-අරලගංවිල ප්‍රධාන මාර්ගයට මුහුණලා අක්කර 1.5 ක භූමි ප්‍රදේශයක් තුළ සෞඛ්‍ය සංවර්ධන අරමුදල් යටතේ රු.48,000,000 ක් වැයකර 1999 වසරේ ඉදි | මෙම වෙළඳ සංකීර්ණය නවීකරණය කිරීම සඳහා කමිටුවක් මගින් ක්ෂේත්‍ර අධ්‍යනයක් සිදුකර ඇත. ඒ අනුව අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ හා සැලසුම්) ගේ අංක | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යන සිදු කර අනාර්ථික වියදම් වළක්වා |

| | | | |
|---|---|---|---|
| | කළ මහල් දෙකකින් සමන්විත කඩ කාමර 48 කින් යුතු රියාද් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 23 ක් 2000 වර්ෂයේදී මාසික කුලී පදනම මත ව්‍යාපාරිකයින් සඳහා බදුදී ව්‍යාපාර ආරම්භ නොකිරීම මත කඩ කාමර 11 ක් නැවත අධිකාරිය වෙත පවරා ගෙන තිබුණි.2024 නොවැම්බර් 13 දින වනවිට කඩ කාමර 12 ක් පමණක් ව්‍යාපාරික කටයුතු සඳහා විවෘතව තිබුණි. වසා දමා ඇති කඩ කාමර සඳහා ජලය හා විදුලිය විසන්ධි කර තිබූ අතර, ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය, වහලය හා සිවිලිම අබලන් තත්ත්වයට පත්වී තිබුණි. මෙම වෙළඳ සංකීර්ණය පාරිභෝගික ආකර්ශනය ලැබෙන අයුරින් ප්‍රතිසංස්කරණය කිරීමට රු.මිලියන 30.7 ක මුදලක් වැය වන බව අධිකාරියේ තාක්ෂණ සේවා අංශය සකස් කළ ඇස්තමේන්තුවලින් අනාවරණය විය. මෙවැනි වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට ප්‍රථම සියළු තොරතුරු ආවරණය වන පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළයුතු වුවත් එසේ නොකර ඉදිකිරීම හේතුවෙන් කඩ කාමර 48 න් 30 කට වැඩි ප්‍රමාණයක් ඉදිකළ දින සිට නිෂ්කාර්යව පැවතුණි. මේ හේතුවෙන් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට වැය කළ රු.මිලියන 48 ක වියදම අනාර්ථික වී තිබුණි. | LUP/SYS-B/01 VOL.VI-2021 හා 2021.08.02 මගින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(තාක්ෂණ සේවා) වෙත අදාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට අදාල සිදුකරන ලද ශක්‍යතා අධ්‍යන වාර්තාව ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. මෙතෙක් මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැති බව දන්වමි.<br>එසේ තිබියදී 2023.12.28 වන දින දිඹුලාගල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට කටයුතු කරණ ලෙස එම රැස්වීමේදී දැනුම් දී ඇත. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් අධිකාරියෙන් දැනට තීරණයක් ගෙන් නොමැත. | ගැනීමටත්, ආරම්භ කළ ව්‍යාපෘති නොපමාව නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගතයුතුය. |
| (උ) | අධිකාරිය සතු ගොඩනැගිලි බාහිර ආයතන වෙත ලබාදීම | | |
| (i) | මහවැලි අධිකාරියට අයත් ගොඩනැගිලි හා කාර්යාලයේ මහල්වලින් ආදායම් උපයා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි 1 මහල, 11 මහල සහ 12 මහල පිළිවෙලින් වාරිමාර්ග අමාත්‍යාංශය-මහවැලි අංශය, වාරිමාර්ග අමාත්‍ය කාර්යාලය හා වැව්ගම් පුබුදුව ව්‍යාපෘති කාර්යාලය සඳහා ලබාදී තිබුණි. මීට අමතරව ජාවත්ත පිහිටි මහවැලි අධිකාරියට අයත් ගොඩනැගිලි ආයතන 06 ක් කිසිදු කුලී මුදලක් අයකිරීමකින් තොරව ලබාදී තිබුණි. | පිළිගනිමි,<br>ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කරගනිමි. | ගොඩනැගිලි බාහිර ආයතන වෙත ලබාදීමේදී අවබෝධතා ගිවිසුමක් හෝ අත්සන් කර ඒ සඳහා සුදුසු කුලියක් අයකල යුතුය. |
| (ii) | ගොඩනැගිලි සහ ප්‍රධාන කාර්යාලයේ මහල්වලට අදාළ ජල විදුලි හා පවිත්‍රතා බිල්පත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ගෙවා තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වනවිට යථෝක්ත | එම ආයතනවලින් මෙම අධිකාරිය වෙත 2023.12.31 දින වන විට ජල , විදුලි හා පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන් අයවීමට තිබු මුළු මුදල රු. 11,056,377 ක් වූ අතර එකී මුදලින් රු. 3,863,186 ක | ප්‍රතිපූරණය කර ගතයුතු හිඟ ජල විදුලි හා පවිත්‍රතා ගාස්තු අයකර ගතයුතුය. |

| | | |
|---|---|---|
| ආයතන විසින් ප්‍රතිපූරණය නොකළ හිඟ ජල, විදුලි හා පවිත්‍රතා බිල්පත්වල වටිනාකම පිළිවෙලින් රු.1,131,891, රු.7,220,815 හා රු.3,711,119 වූ අතර, එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | මුදලක් 2024 වර්ෂයේ ලැබී ඇත, ඒ අනුව තවදුරටත් අයවීමට ඇති හිඟ මුදල රු. 71,93,191 ක මුදලක් අයවීමට ඇත. | |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බකමූණ බස් නැවතුම්පොල ඉදිකිරීම කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2022 අප්‍රේල් 04 දින නිම කළයුතු වුවත්, 2024 අප්‍රේල් 28 දින දක්වා එහි ඉදිකිරීම් අවසන් කර නොතිබුණු අතර, ඉදිකිරීම් අත්හැර දමා තිබුණි. | ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන් වල සිදු වූ සීඝ්‍ර වර්ධනය හා රට තුල ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ මුදල් ප්‍රතිපාදන නොමැති වීමෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත 2023.05.12 දින අවලංගු කර ඇත. ඉදිරි වැඩ කටයුතු සඳහා අදාල ඇස්තමේන්තුව සකස් කරමින් පවතින අතර, ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන 2025 වර්ෂයේ දී ලබාගැනීමට හැකියාව පැවතියහොත් මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිරි වැඩ කටයුතු නිමා කිරීමට බලාපොරොත්තු වේ. | සැලසුම් කළ කාර්ය නිම කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | මහඔය කලාපයේ නිල නිවාසයක් ඉදිකිරීම සඳහා 2017 නොවැම්බර් 14 දින රු.4,843,183 කට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර, ගිවිසුම අනුව 2018 මැයි 06 දින වැඩ නිම කළයුතු වුවත්, විගණිත දිනය වූ 2024 මැයි 10 දින වනවිටත් කොන්ත්‍රාත්තුව නිම නොකර අදාළ ඉදිකිරීම් වැඩ අතහැර දමා තිබුණි. එහිදී සංචලන අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවූ රු.1,422,931 ක මුදල අයකර ගැනීමටත් කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය පියවර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | සංචලන අත්තිකාරම් ලෙස ගෙවූ මුදලින් රු.758,678 ක මුදලක් අයවීමට තිබූ අතර එය ඇපකරය නිකුත්කල ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) මගින් 2024.07.30 දින අයකර ගන්නා ලදි. තවද කාර්යසාධන ඇපකර මුදල වන රු. 484,319 මුදලද ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) මගින් අයකර ගන්නා ලදි. මෙහි ඉතිරි වැඩ නිම කිරීම සඳහා ඇස්තමේන්තු (රු.මි. 3,867,407) කළද රටේ පැවති මූල්‍යමය හිඟය සමඟ ගොඩනැඟිලි ඉදි කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් එහි ඉදිකිරීම් කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකි විය. | ඉදි කිරීමේ කාර්යය අතහැර දැමූ කොන්ත්‍රාත්කරුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත්,සිදුවූ පාඩුව අයකර ගැනීමටත්, නිලධාරීන් වගකීම් විරහිතව ක්‍රියාකර ඇත්නම් විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, නිම නොකරන ලද වැඩ කොටස් පරීක්ෂා කර ඒවා නිම කිරීමටත්, අවශ්‍ය පියවර ගතයුතුය. |
| (ඇ) | රත්කිඳ සංචාරක බංගලාව අලුත්වැඩියාවට අදාළ කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 24 දින රු.12,107,000 ක කොන්ත්‍රාත් මුදලකට උක්ත කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කර තිබූ අතර, කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2019 ජූලි 19 දින වනවිට වැඩ නිම කළයුතු වුවත්, විගණිත දිනය වූ 2024 අප්‍රේල් 28 දින වනවිට කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි.මීට අදාළව කොන්ත්‍රාත්කරුට ගෙවූ | මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමෙන් පසු සංචලන අත්තිකාරම් මුදල හා කාර්යසාධන ඇපකර මුදල ඇපකර නිකුත් කරන ලද ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) මගින් අයකර ගැනීමට තිබුණි. මේ පිළිබඳව අවස්ථා කිහිපයක් එම අරමුදල (CGF) සමඟ සාකච්ඡා කිරීමෙන් පසු එම මුදල් ගෙවීමට එකඟ වූ අතර සංචලන අත්තිකාරම් මුදල ලෙස අයවීමට තිබූ ඉතිරි මුදල වන රු.1,536,926 ක් සහ | සංචාරක බංගලාව අලුත්වැඩියාව අතහැර දැමූ කොන්ත්‍රාත්කරුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත්,සිදුවූ පාඩුව අයකර ගැනීමටත්, වගකීම් විරහිතව ක්‍රියාකර |

| | | | |
|---|---|---|---|
| | රු.3,447,508 ක සංචලන අත්තිකාරම් මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි. සංචලන අත්තිකාරම් ලබාදෙන අවස්ථාවේදී ලබාගෙන ඇති බැංකු ඇපකරයේ කොන්ත්‍රාත්කරු වෙත කරනු ලබන සියලු ගෙවීම් ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල් ගිණුමක තැන්පත් කරන ලෙසට කොන්දේසියක් දක්වා තිබුණද, ඊට පටහැනිව සියලු ගෙවීම් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබීම හා මේ වනවිට බැංකු ඇපකරයේ කාලසීමාව ඉක්මවා ගොස් තිබීම හේතුවෙන් හානි පූරණය කරගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාළව වැඩ ආරම්භ කර වසර 5 ක් ගතවී ඇති නමුත් කළයුතු ඉතිරි වැඩ හඳුනාගෙන නව කොන්ත්‍රාත්තුවක් පිරිනැමීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. ගොඩනැගිල්ලේ වහලය ඉවත් කර තිබීම හේතුවෙන් ඉදිකර තිබූ කොටස දිනෙන් දින හානියට පත්වෙමින් පැවතුණි. | කාර්යසාධන ඇපකර මුදල වන රු. 605,390 ක මුදල 2024.09.12 දින අයකර ගන්නා ලදි.රටෙහි ඇතිවූ මූල්‍ය ආර්ථික අර්බුදය හේතුවෙන් 2022,2023 සහ 2024 වර්ෂවලදී නව ඉදිකිරීම් සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන් නොවූ අතර ඉදිරියේ දී මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගෙන මෙම කාර්යය අවසන් කිරීමට සැලසුම් කර ඇත. | ඇති නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්,නිම නොකරන ලද වැඩ කොටස් පරීක්ෂා කර කඩිනමින් නිම කිරීමටත්, අවශ්‍ය පියවර ගතයුතුය |
| (ඈ) | තම්මැන්නාව වැව ආශ්‍රිතව ආර්ථික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2021 ඔක්තෝබර් 12 දින රු.6,514,819 කට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පවරා, 2021 අගෝස්තු 23 දින රු.2,062,201 ක සංචලන අත්තිකාරම් මුදලක් නිදහස් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාළ ඉදිකිරීම් කාර්යය දින 60 ක් තුළ නිම කළයුතු වුවත් 2023 අප්‍රේල් 28 දින වනවිට අදාළ කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි.සංචලන අත්තිකාරම නිකුත් කර වසර 3 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, 2024 මාර්තු 25 දින වනවිටත් එය ආපසු අයකර ගැනීමට හෝ කොන්ත්‍රාත්තුව සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව සිදුකිරීමට අදාල ඉඩම, මාර්ග සංවර්ධන අධිකාරියේ රක්ෂිත සීමාව තුළ පිහිටි බැවින් ඉදිකිරීමට අවසර ලබා නොදීම නිසා ඉහත කොන්ත්‍රාත්තුව 2023.04.28 දින අන්‍යෝන්‍ය එකඟතාව මත අහෝසි කිරීමට කටයුතු කර ඇත.තවද මෙම ඉදිකිරීම වෙනුවෙන් අදාල කොන්ත්‍රාත් සමාගමට ලබාදෙන ලද සංචලන අත්තිකාරම් මුදල වන රු. 2,062,201 ක මුදල එම කොන්ත්‍රාත් සමාගමට මහවැලි අධිකාරිය විසින් ගෙවිය යුතු කලාවැව සංචාරක බංගලාව නවීකරණය කිරීමේ බිල්පතින් අඩුකර ගැනීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. | ශක්‍යතා අධ්‍යයන හා අවසරයන් ලබාගැනීමේ හැකියාව තහවුරු කරගැනීමත්, සංචලන අත්තිකාරම් වහාම අයකර ගතයුතු අතර, ගිවිසුමට එළඹීමට පෙර අත්තිකාරම් ගෙවීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගතයුතුය. |
| (ඉ) | මධ්‍යම පරිසර අධිකාරියේ, මධ්‍යම පළාත් කාර්යාලය ලෙස භාවිතා කරනු ලැබූ පොල්ගොල්ල වේල්ල අසල පිහිටි ගොඩනැගිල්ල මහවැලි අධිකාරිය වෙත පවරා ගෙන මධ්‍යම පරිසර අධිකාරියට අයත් කුණ්ඩසාලේ වරාපිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩමක නව ගොඩනැගිල්ලක් ඉදිකර දීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ගිවිසුම් ගතවීමකින් තොරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව යෝජිත නව ගොඩනැගිල්ලේ පළමු අදියර සැලසුම් කර ඉදිකර භාරදීමේ (Trunkey) පදනම මත පිරිනැමීමට අනුමැතිය ලැබී තිබුණි.මේ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 32,096,839 ක් විය. මුදල පළමු අදියර වශයෙන් බිම් මහලේ ස්ලැබ් (Slab Level) මට්ටම දක්වා ඉදිකිරීම සඳහා පමණක් ඉදිරිපත් කර ඇත. මීට අමතරව මෙම ගොඩනැගිලි කාර්යාලය ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු සඳහා ජාතික ක්‍රමසම්පාදන | නිසි සැලසුම්කරණයක් හා වැඩ අධීක්ෂණයක් සිදුකර සෑම විටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කර පරිසර අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| | රු.32,096,839 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත විගණිත දිනය වූ 2024 මැයි 10 වනවිට එකඟවූ පරිදි මහල් 04 කින් යුතු ගොඩනැගිල්ල ඉදි නොකර බිම් මහල පමණක් ඉදිකර තිබූ අතර, එයද නිසි නිමාවකින් තොරව අසම්පූර්ණ ලෙස අවසන් කර තිබුණි. මේ හේතුව නිසා මධ්‍යම පරිසර අධිකාරිය අදාළ ගොඩනැගිල්ල විගණිත දින වන 2024 මැයි 10 දක්වා භාරගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති හෙයින්, ඉදිරියේ දී මධ්‍යම පරිසර අධිකාරිය වෙත ප්‍රතිපාදන ලැබීමෙන් පසු ඉදිකිරීම් කඩිනමින් අවසන්කර එම කාර්යාලයේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත බව එම අධිකාරිය දන්වා ඇත. | වෙත පවරා දිය යුතුය. |
| (ඊ) | ගල්වල යාය ප්‍රදේශයේ මහවැලි ගම්මානයේ මාර්ග සකස් කිරිම හා කුඹුරු ඉඩම් රළු මට්ටම් කිරීම සඳහා රඹකැන්ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යලය විසින් අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත 2013-2014 කාලපරිච්ඡේදය තුළ අවස්ථා 05 කදී රු.මිලියන 11 ක අත්තිකාරම් ලබාදී ඇතත් එම අත්තිකාරම් මුදලින් රු.මිලියන 2.88 ක් 2024 අප්‍රේල් 28 දින වනවිටත් පියවා නොතිබුණි. | ලබාදුන් අත්තිකාරම්වලින් නොපියවූ අත්තිකාරම් පිළිබඳව විටින් විට ලිඛිතව මේ සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දැනුවත් කිරීම් කර ඇත. ඒ අනුව එම කාලවකවානුව තුල රළු මට්ටම් සිදුකල යාය 01 මහ යාය 05 හි තොරතුරු ලබාගත් පසු පියවීම් සිදුකල හැකි බව දන්වමි. | අත්තිකාරම් මුදල් කඩිනමින් පියවීමට කටයුතු කළයුතුය |
| (උ) | එල් කලාපයේ විදුලි වැටවල් 2 ක් ඉදිකිරීම සඳහා ගෙවා තිබූ රු.මිලියන 20.8 කට අධික මුදලක් වසර 08 කට අධික කාලයක් තිස්සේ නොපියවූ ශේෂයක් ලෙස ගිණුම්වල පැවතුණි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රු.11,074,476 ක මුදලක් ඉතිරිව පවතින බවට දන්වා එවා තිබූ නමුත්, එම මුදල අයකර ගැනීමට හෝ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු, කොන්ත්‍රාත්තුව සඳහා පරීක්ෂා කරනු ලැබූ සියලුම සුදුසුකම් (ශක්‍යතාව) සපුරා ඇත. ඒ අනුව, මෙම කොන්ත්‍රාත්කරු තෝරාගැනීමේදී ප්‍රසම්පාදන සංග්‍රහයට අනුව සිදුකර ඇත.කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත් දෙක සඳහාම කොන්ත්‍රාත් කළමනාකරු ලෙස පොදු පුද්ගලයෙකු නමකර තිබූ අතර අදාල කොන්ත්‍රාත් කළමනාකරු ක්ෂේත්‍රයේ සිටිය යුතු පුද්ගලයෙකු නොවන නිසා තාක්ෂණ ඇගයීම් කමිටුව සහා ප්‍රසම්පාදන කමිටුව මගින් එම යෝජනාව පිළිගන්නා ලද අතර කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය මත කොන්ත්‍රාත් කළමනාකරණ සේවාව සඳහා ගෙවිය යුතු මුදලින් සියයට 30 ක් අඩුකර කොන්ත්‍රාත්තු ප්‍රදානය සිදුකරන ලදි. | අත්තිකාරම් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළයුතුය. |
| (ඌ) | වැලිඔය ගජබාපුර සිට නැදුන්කර්නි හන්දිය දක්වා වූ මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් රු.390,085,714 ක් 2018 වර්ෂයේදී ගෙවා තිබූ අතර, අදාළ ඉදිකිරීම් නිමකර ගෙවීම් නිරවුල් කිරීමේදී රු.43,363,909 ක වැඩිපුර ගෙවීම මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට විගණිත දින වූ 2024 අප්‍රේල් 18 දක්වා කටයුතු කර නොතිබුණි | වැලිඔය ගජබාපුර සිට නැදුන්කර්නි හන්දිය දක්වා වූ මාර්ගය නවීකරණ කටයුතු සඳහා වැය වූ මුදල රු.346,721,805 ක් වන අතර ඉතිරි මුදල වන රු. 43,363,909 ක මුදල සඳහා වැලිඔය සම්පත්නුවර සිට ගජබාපුර දක්වා මාර්ගයේ 1.95 km ක දුරක් කාපට් අතුරා සංවර්ධනය කිරීමට ආරම්භ කලද එය අතරමඟ නැවතී ඇත. මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතු ඉතිරි මුදල මේ වන තෙක් ලැබී නොමැත. | අත්තිකාරම් පියවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | කන්තලේ සූරියපුර මහවැලි ගඟේ ආරක්ෂණ වේල්ලට තර්ජනයක් වන පරිදි තැන්පත් වී ඇති වැලි නිධිය හේතුවෙන් ගංවතුර ආරක්ෂණ වේල්ල බාදනයට ලක්වී තිබුණි.වේල්ලට ප්‍රතිවිරුද්ධ ඉවුරේ තැන්පත්වී ඇති වැලි නිධිය කැනීම් කර අලෙවි කර උපයා ගන්නා ලාභයෙන් ගංවතුර ආරක්ෂණ වේල්ල ප්‍රතිසංස්කරණය කිරීමට ව්‍යාපෘතිය 2019 අගෝස්තු 06 දින ආරම්භ කර තිබුණි. ගිවිසුම අනුව තැන්පත්වී ඇති වැලි කියුබ් 103,128 ක් ඉවත් කිරීම හා ඊට සමගාමීව ගංවතුර ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය මාස 06 ක් තුළ නිම කිරීමට එකඟවී අනතුරුව 2022 ජූලි 19 දින දක්වා අවස්ථා කිහිපයකදී මෙම ගිවිසුම දීර්ඝ කර තිබුණි.<br>ප්‍රමුඛ කාර්යයක් ලෙස 2019 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය වසර 4 කුත් මාස 7 ක් ගතවී ඇතත් විගණිත දින වන 2024 මැයි 07 දක්වා නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ගිවිසුම පරිදි මාස 06 ක කාල සීමාවක් තුල වැලි කියුබ් 103,128 ක ප්‍රමාණයක් ඉවත් කිරීමට හා වේලි ආරක්ෂණ බැම් 3 ඉදිකිරීමට එකඟව ඇත.එසේ නමුත් 2022 ජුලි 19 ව දින වන විට අවස්ථා කිහිපයකදී ගිවිසුම් කාල සීමාව දීර්ඝ කර ඇත. 2020, 2021 වසර වල ඇතිවූ කොරෝනා වසංගතය හා ඉන්ධන අර්බුදය අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට අපොහොසත් වූ බව උක්ත සමාගම විසින් දැනුම් දී ඇත. | ගිවිසුම් පරිදි අදාළ කාර්යයන් නිම කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. සංඛ්‍යාත්මක පරස්පරතාවය සඳහා වාර්තාව ලබා ගත යුතුය. |
| (ඒ) | කලාවැව සංචාරක බංගලාව නවීකරණය කිරීම සහ පැති බැම්ම ඉදිකිරීම සඳහා 2016 දෙසැම්බර් 12 දින රු.40,490,644 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. පසුව මෙහි කොන්ත්‍රාත් වටිනාකම රු.57,586,734 ක් ලෙස සංශෝධනය කර තිබූ අතර, විගණිත දින වන 2024 මාර්තු 25 දින වනවිට ඉන් රු.41,050,169 ක මුදලක් ගෙවීම් කර තිබුණි. අදාළ ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කිරීමේදී ගොඩනැගිල්ලේ බොහෝමයක් ස්ථානවල බිත්ති පිපිරීම, බිම් උළු බොල්වීම හා පිපිරීම, බළලුවැව පස ඇති කොටසේ වහලය ප්‍රධාන බිත්තිවලින් විතැන් වෙමින් පැවතීම බළලුවැව පස ඇති වැව් බැම්ම හා ඉන්ටලොක් අතුරා ඇති කොටසේ වැව් බැම්ම ආශ්‍රිතව හිඩැසක් නිර්මාණය වෙමින් පැවතීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | අදාල කොන්ත්‍රාත්තුවේ ගොඩනැගිලි භාරදෙන අවස්ථාවේ දක්නට නොලැබුනු අඩුපාඩු නඩත්තු කාල සීමාව තුළ හඳුනාගත් අතර එම ඉදිකිරීම් අඩුපාඩු නිවැරදි කරන ලෙස කොන්ත්‍රාත්කරුට ඒ ඒ අවස්ථාවන්වලදී දැනුම් දී ඇතැම් අඩුපාඩු නිවැරදි කර තිබූ අතර, එසේ නිවැරැදි නොකරන ලද අඩුපාඩු මහවැලි අධිකාරිය මගින් නිවැරදි කර ඊට අදාල වියදම කොන්ත්‍රාත්කරුගේ රැඳවුම් මුදල් වලින් අයකර ලංකා මහවැලි අධිකාරිය මගින් සිදුකරන ලදී.<br>තවද නඩත්තු කාල සීමාවේදී නිවැරැදි කිරීම් කරන ලද අඩුපාඩු නඩත්තු කාල සීමාවෙන් පසුව නැවත නිරීක්ෂණය කරන ලදී. එනම් ගොඩනැගිලිවල බිත්ති පිපිරීම,බිම් උළු බොල් වීම හා පිපිරී,බළලුවැව පස ඇති කොටසේ වහලය ප්‍රධාන බිත්ති වලින් විතැන් වෙමින් පැවතීමත් වැව් බැම්ම හා ඉන්ටලොක් අතුරා ඇති වැව් බැම්ම ආශ්‍රිතව හිදැසක් නිර්මාණය වෙමින් පැවතීම. | ජලාශ ආශ්‍රිත ඉදිකිරීම් නිසි ව්‍යුහාත්මක සැලසුම් සහිතව කළයුතුය. |
| (ඔ) | මහවැලි කලාප තුළ වන අලි හා මිනිස් ගැටුම් අවම කිරීම සඳහා එල්ලෙන ලෙස විදුලිවැට ඉදිකිරීමට මහවැලි අධිකාරිය හා ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම එක්ව ආරම්භයේදී බී කලාපයේ අරලගංවිල, කන්දකාඩු, සිංහපුර අතර හා | ගොවිපලවල් වටා විදුලි අලි වැට කඩිනමින් ඉදිකිරීම සඳහා එවකට ඒ හා සම්බන්ධ පෘතුල දැනුමක් හා පලපුරුද්දක් ඇති රාජ්‍ය ආයතනයක් වූ “ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසම” වෙත ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රසම්පාදන | අවබෝධතා ගිවිසුම අනුව ඒ අධීක්ෂණ කටයුතු සිදුකර එම ඉදිකිරීම් නිමකර ගතයුතුය. |

| | | |
|---|---|---|
| සී කලාපයේ මහවැලි පුහුණු මධ්‍යස්ථානය වටා ඉදිකර තිබුණි. මේ සඳහා පිළිවෙලින් රු.4,844,272 ක්, රු.9,234,319 ක් හා රු.8,000,000 ක් වශයෙන් අත්තිකාරම් ලබාදී තිබූ අතර, මෙලෙස එක් ආයතනයකට කොන්ත්‍රාත් පැවරීම හා ගෙවීම් සිදුකිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයකින් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව ඉහත පරිදි කොන්ත්‍රාත් පිරිනැමීම හා වැඩ නිම කිරීමට පෙර අත්තිකාරම් ලෙස ගෙවීම් කිරීම සිදුකර තිබුණි. මෙම අලි වැටවල් නිසි පරිදි ඉදිකිරීම් කර ඇති බවට අධිකාරියේ තාක්ෂණ අංශය හෝ වෙනත් පාර්ශවයක් විසින් තහවුරු කර නොතිබීම හා නිසි පරිදි බිල්පත් ඉදිරිපත් නොකිරීම මත අත්තිකාරම් නිරවුල් කිරීමට නොහැකිවී තිබුණි. තවද, විගණනය විසින් භෞතිකව පරීක්ෂා කළ ස්ථානවලදී මෙම අලිවැට විනාශවී ගොස් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | මාර්ගෝපදේශන සංග්‍රහයේ සෘජු කොන්ත්‍රාත් ක්‍රමවේදය (Direact Contracting) යටතේ ඇති 3.7.1 වගන්ති ප්‍රකාරව නව නිපැයුම් කරුවන්ගේ කොමිසම වෙත මෙම ඉදිකිරීම සඳහා අංක 2021/04 , 2021/04-16 හා 2021.04.23 දිනැති අනුමැතිය යටතේ ප්‍රදානය කර අදාල අත්තිකාරම් මුදල් ලබා දීම සිදු කර ඇත. | |
| (ඕ) 2023 වර්ෂයේ සී කලාපයේ වැව් හා ප්‍රධාන ඇල ඒකක 2 හි නඩත්තු කටයුතු, සනීපාරක්ෂක කටයුතු, නිල නිවාස කඳවුරේ හා මහවැලි ක්‍රීඩාංගනයේ දෛනික නඩත්තු කටයුතු සහ පිරිසිදු කිරීමේ කටයුතු, නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාල ගෙවත්තේ සහ කෘෂි අංශයේ පැල තවානේ දෛනික නඩත්තු කටයුතු, තාක්ෂණ සේවා අංශය, යාන්ත්‍රික වැඩපලෙහි ගබඩාව සහ කාර්යාලයේ දෛනික නඩත්තු කටයුතු හා කොට්ඨාශ 07 ක ජල පාලන හා මෙහෙයුම් නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා ගොවි සංවිධාන මට්ටමින් සේවකයින් බඳවා ගැනීම වෙනුවට රු.18,905,600 ක් වටිනා සුළු පරිමාණ කොන්ත්‍රාත් (ශ්‍රම කොන්ත්‍රාත්) 35 ක් පුද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණි. | වාර්ෂිකව කලාපයේ ඇති ඉදිකිරීම් කටයුතු හා නඩත්තු කටයුතු වලට අමතරව කලාපයේ ජල පාලන කටයුතු, සනීපාරක්ෂක කටයුතු, පිරිසිදු කිරීමේ හා විවිධ කාර්යයන් ශ්‍රමිකයන් පමණක් යොදා ගනිමින් සිදු කර ගැනිමට අවශ්‍ය වන ශ්‍රම කොන්ත්‍රාත් ප්‍රදානයන් සිදු කර ඉටු කර ගැනීම සිදු කරනු ලබයි. මෙම කාර්යයන් සිදු කර ගැනීමේදී මේ සඳහා ශ්‍රමිකයන් යොදා ගැනීම අවශ්‍ය වේ. තවද කම්කරුවන් ආයතනයට බඳවා ගැනීමට නොහැකි බැවින් සිදු කල යුතු මෙම කාර්යයන් ඉටු කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානයන් මඟින් සිදු කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. | සුදුසුකම්ලත් ගොවි සංවිධාන මගින් කොන්ත්‍රාත්තු ඉටුකරගත යුතුය. |

3.6 **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට පැවති කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා | පිළිගනිමි. | පවතින පුරප්පාඩු |

| | | | |
|---|---|---|---|
| | මහවැලි අධිකාරියේ තනතුරු 145 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 4,859 ක් වූ අතර, එදිනට තනතුරු 118 කට අදාළව පැවති පුරප්පාඩු සංඛ්‍යාව 1,390 ක් විය. | ජාතික අයවැය චක්‍රලේඛ අංක. 05/2022 හා උපදෙස් පරිදි සියළු ම ශ්‍රේණිගත උසස්වීම් හා තනතුරු උසස්වීම් ලබා දීම තාවකාලිකව අත්හිටුවා තිබියදි 2023.05.23 වන දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා (COPE) රැස්වීමේ දී 2023.03.31 වන දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව අභ්‍යන්තරින් හා බාහිරින් බඳවා ගත හැකි තනතුරු පුරප්පාඩු 326 ක් සම්පූර්ණ කර ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත.<br>බඳවා ගැනීම් කමිටුවෙන් ලබා දුන් උපදෙස් පරිදි ප්‍රාථමික සේවා ගණයේ තනතුරු පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් 97 ක් බඳවා ගැනීමට කටයුතු කරන ලදි. | සමාලෝචනය කර අවශ්‍ය නිලධාරීන් පත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) | අනුමත තනතුරු 04 කට හා අනුමත නොවූ තනතුරු 08 කට අදාළව පැවති අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිවෙලින් 50 ක් හා 11 ක් වශයෙන් එකතුව 61 ක් විය. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 25/2014 හා 25/2014 (I) අනුව ශ්‍රී ලංකා ලංකා මහවැලි අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ (MA 1-2) සිට ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 1) දක්වා අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූරණ කර ඇති සේවකයින් ඇති සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දි ලිපිය පමණක් කළමනාකරණ සේවා දෙපාරතමේන්තුවෙට දන්වා ඇත. ඒ අනුව අනුමත තනතුරු 04 කට අදාළව අතිරික්ත සේවක සංඛ්‍යාවක් පෙන්නුම් කරනු ලබයි. එසේ ම පැරණි අනුමත සේවක සංඛ්‍යාවට අනුව බඳවා ගත් නිලධාරීන්/ සේවකයින් ඔවුන්ට පමණක් පෞද්ගලික වන සේ තැබීම මත ද සේවක අතිරික්තයක් පෙන්නුම් කරනු ලබයි. | අනුමත නොවූ තනතුරු සඳහා නිලධාරීන් බඳවා නොගත යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට 34 ක් වූ ජ්‍යෙෂ්ඨ අංශවල පැවති තනතුරුවලින් පුරප්පාඩු සංඛ්‍යාව 22 ක් වූ අතර, එය අනුමත කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 65 වැනි ඉහළ අගයක් ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පවතින පුරප්පාඩු සමාලෝචනය කර අවශ්‍ය ස්ථිර නිලධාරීන් පත් කිරීමට කටයුතු කල යුතුය. |
| (iv) | අධිකාරියේ නිලධාරීන් 120 දෙනෙකු රාජකාරී ආවරණය සඳහාත්, නිලධාරීන් 04 දෙනෙකු රාජකාරී ඉටුකිරීම සඳහාත් තවත් නිලධාරීන් දෙදෙනෙකු වැඩබැලීම සඳහාත් පත්කර ඇති බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 2023 ඔක්තෝබර් 05 දින දන්වා තිබුණද, 2024 අප්‍රේල් 04 දින විගණනය | ජාතික අයවැය චක්‍රලේඛ අංක. 05/2022 හා 2022.09.02 වන දිනැති ලිපි මඟින් රාජ්‍ය වියදම් දැඩි ලෙස පාලනය කිරීම සම්බන්ධයෙන් ලබා දෙන ලද උපදෙස් පරිදි සියළු ම ශ්‍රේණිගත උසස්වීම් හා තනතුරු උසස්වීම් ලබා දීම තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලදි. 2023 වර්ෂය අවසන් වන විට පත්වීම් 96 ක් පමණක් සේවයේ යෙදී සිට ඇත.රාජකාරී අඛණ්ඩව | පවතින පුරප්පාඩු සමාලෝචනය කර අවශ්‍ය ස්ථිර නිලධාරීන් පත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 37 කට අදාළව වැඩබැලීම, රාජකාරී ඉටුකිරීම හා රාජකාරී ආවරණය යටතේ ලබාදී ඇති පත්වීම් සංඛ්‍යාව 96 කි. | පවත්වාගෙන යාම සඳහා මෙම පත්වීම සේවා අවශ්‍යතාවය මත සිදු කරන්නෙක් බැවින් හා ස්ථිර පත්වීමක් ලබා ගැනීමට මෙය සුදුසුකමක් නොවන බැවින් හා මෙය බාහිර අයවලුන්ගෙන් සිදු කරනු ලබන පත් කිරීමක් නොවන බැවින් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය පරිදි මෙම පත්වීම් ලබා දීමට කටයුතු කර ඇත. | |
| (v) | අධිකාරිය සඳහා අනුමත කර ගත් බඳවා ගැනීමේ පරිපාටිය අනුව එහි සෑම තනතුරක් සඳහාම පත්වීම් බලධාරියා අධ්‍යක්ෂ මණ්ඩලය වුවද රාජකාරී ආවරණය, රාජකාරී ඉටුකිරීම සහ වැඩබැලීම සඳහා 2018 වර්ෂයේ සිට අධ්‍යක්ෂ ජනරාල්වරයාට අමතරව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) හා අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) විසින්ද පත්වීම් ලිපි නිකුත් කර තිබුණි. | ඉහත පිළිතුරම අදාළ වේ. | තනතුරක වැඩබැලීම සඳහා හෝ රාජකාරී ඉටුකිරීම සඳහා පත් කිරීම් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකළයුතුය. |
| (vi) | අධිකාරිය විසින් 2018, 2019 සහ 2020 යන වර්ෂවල රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කළ නිලධාරීන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම තනතුරුවල රාජකාරී ආවරණය කරමින් පැවතුණි. නිත්‍ය තනතුරට අමතරව වෙනත් තනතුරක දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව රාජකාරී ඉටුකිරීමට පුරප්පාඩු තනතුරු සඳහා අභ්‍යන්තරිකව හෝ අයදුම්පත් කැඳවා සුදුසුකම් සහිත නිලධාරීන් පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළයුතු වුවද එසේ සිදු නොකර රාජකාරී ආවරණය කිරීමේ පදනම මත පත්වීම් ලබාදී තිබුණි. | ඉහත පිළිතුරම අදාළ වේ. | පුරප්පාඩුව පවතින තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත් කිරීම කල යුතුය. |

**3.7 වාහන පද්ධති කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙහිඅත්තකන්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු අංක PF-0845 වාහනය, 2019 දෙසැම්බර් 22 දින අනතුරට ලක්වී තිබුණි. මුදල් රෙගුලාසි 104 (4) අනුව අලාභහානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුළතදී හානි සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත්, අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් | මෙම නිලධාරියා වැඩ තහනම් කාලයට ගණනය කල හිඟ වැටුප අවසන් මස වැටුප අනුව ගෙවිය යුතු මුදල රු. 3,493,376 කි. ආයතනය වෙත අයවීමට ඇති මුදල රු. 6,217,909 ක් වේ. ඒ අනුව මේ වන විට ආයතනය වෙත අයවිය යුතු මුළු මුදල වන්නේ රු. 2,724,532 බව මාගේ 2024.07.22 දින ලිපියෙන් දන්වා ඇත. එකී මුදල් ගෙවන ලෙස ඒ මහතාට 2024.09.09 දින එන්තරවාසියක් | වාහනය අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමටත්, වගකිවයුතු පාර්ශවයන්ගෙන් මුදල් අයකර ගැනීමටත් කටයුතු |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කර තිබුණේ 2023 මැයි 22 එනම් අනතුර සිදුවී වර්ෂ 03 කුත් මාස 05 කට පසුවය. වාහනය 2023 මාර්තු 23 දින රු.9,991,909 ක ඇස්තමේන්තුවක් මත යුනයිටඩ් මෝටර්ස් ආයතනයේ අනුරාධපුර ශාඛාව වෙත අලුත්වැඩියා කටයුතු සඳහා භාරදී තිබූ අතර, රක්ෂණ වන්දි ලෙස රු.3,700,000 ක් පමණක් අනුමතවී තිබුණි. විගණිත දින වන 2024 මැයි 10 දින වන විටත් අලුත්වැඩියා කටයුතු නිම කර නොතිබුණු අතර, රක්ෂණ වන්දියෙන් ආවරණය නොවන අලුත්වැඩියා වියදම වන රු.6,291,909 ක මුදල අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යවා ඇත. ඔහුට විරුද්ධව නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. ඒ අනුව රු. 2,724,532 මුදල නීති මඟින් අයකර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි.රක්ෂණ වන්දියෙන් ආවරණය නොවන මුළු මුදල නීති මගින් කටයුතු කර අයකර ගැනීමට යටත්ව අධිකාරිය මගින් ගෙවීම කර උක්ත වාහනය අළුත්වැඩියා කර ධාවනය කිරීමට කටයුතු කරණ ලෙස තවද 2024.05.14 දින පැවති 359 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ ඉදිරිපත් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව උපදෙස් ලබා දී ඇත. | කළයුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු අංක WP-JF 3105 දරන වාහනය 2004-2005 කාලය තුළ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබාදී ඇති බව ඉකුත් වර්ෂවල විගණන වාර්තා මඟින් දක්වා තිබූ නමුත්, ඒ සඳහා 2024 අප්‍රේල් 28 දින දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම කැබ් රථය අස්ථානගත විම සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (1) අනුව කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම් දැනුවත් කල අතර අමාත්‍යාංශ ලේකම් විසින් ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104 පරික්ෂණ කටයුතු සිදු කිරිම සඳහා කමිටුවක් පත් කර අදාල පරීක්ෂණ කටයුතු කරනු ලැබේ.<br><br>මුලික විමර්ශන වාර්තාව අනුව මහවැලි සහ ගංගාධාර සංවර්ධන හා රජරට සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් වන ඇස්.බී.විජේකොන් මහතා විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත සිදුකල ඉල්ලිමකට අනුව මෙම කැබ් රථය අමාත්‍ය කාර්යය මණ්ඩලය වෙත ලබා දි ඇත. එවකට වලව කලාපයේ ප්‍රවාහන නිලධාරි ලෙස රාජකාරි සිදුකල කේ.ජී.සුගතදාස මහතා විසින් 2005.05.11 දිනැතිව නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකාර (තාක්ෂණ සේවා) වෙත ලිපියක් ඉදිරිපත් කර එවකට නේවාසික ව්‍යාපාර කළමණාකාරගේ වාචික උපදෙස් අනුව කැබ් රථය ඒ මහතා විසින් ගෙන ගොස් ගරු ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්ගේ උපදෙස් අනුව අධ්‍යක්ෂ (ප්‍රවාහන හා නඩත්තු) ගේ තිරණය මත ආරක්ෂක නියාමක ඩබ්.පි.එදිරිවිර ජයවර්ණ මහතා වෙත විධිමත්ව භාර දි ඇති බව සඳහන් කර ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව) විසින් ප්‍රධාන ප්‍රවාහන නිලධාරි වෙත යොමු කල 2011.03.08 දිනැති ලිපිය අනුව කැබ් රථය ගරු මෛත්‍රිපාල සිරිසේන අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලය වෙත ලබා දි ඇති බව සඳහන් කර ඇත. | බාහිර පාර්ශවයන් වෙත වාහන බැහැර කිරීමේදී නිසි අනුමැතියක් සහිතව තටයුතු කළයුතුය. |
| (ඇ) | වාහන අපහරණය සඳහා පත් කළ කමිටුවේ නිර්දේශය අනුව 2019 වර්ෂයේදී වාහන 45 ක් වාහන ලෙස | අයිතිය තහවුරු නොවන ධාවනයෙන් ඉවත් කල අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන යකඩ වටිනාකම පමණක් ඇති වාහන විශාල | වාහන අපහරණයට පෙර වාහනවල |

| | | | |
|---|---|---|---|
| | බැහැර කිරීමටත්, වාහන 63 ක් අබලි යකඩ ලෙස බැහැර කිරීමටත්, වාහන 31 ක් නැවත අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමටත් තීරණය කර තිබුණි. අබලි යකඩ ලෙස බැහැර කළ වාහන 63 ක වැසි අංක ඉවත් කර එම වැසි අංක මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයට භාරදී තිබුණු අතර, එම වාහනවලින් 25 ක හිමිකාරීත්වය අධිකාරිය සතුව නොතිබුණි. | ප්‍රමාණයක් පරිශ්‍රය පුරා අවිධිමත් ලෙස ගොඩගසා තිබේ. මේ නිසා පරිසර ප්‍රශ්න, බැහැර කිරීම් නොකිරීම පිළිබඳ ප්‍රශ්න මාධ්‍ය මගින් සිදුකරණ ආයතනය අපකීර්තියට පත්කරණ ප්‍රවෘත්ති ගැටළු ගණනාවක් පසුගිය කාලය තුල මෙම හදුනා නොගත් සුන්බුන් වාහන නිසා පැන නැගී තිබුණි. තවදුරටත් පරිශ්‍රය තුල රදවා ගැනීමෙන් කිසිදු ආර්ථික වාසියක් ආයතනයට නොලැබෙන බැවින් මෙසේ හදුනගෙත් සුන්බුන් වාහන 2023 වර්ෂයේ වාහන අපහරනය සඳහා යොමු කරන ලදි. එමගින් රු.මිලියන 6.4 ක ආදායමක් උත්පාදනය කර තිබුණි. | හිමිකාරීත්වය තහවුරු කරගත යුතුය. |
| (ඈ) | 2014 වර්ෂයේ සිට අක්‍රීයව පැවති කොත්මලේ වේල්ලෙහි නඩත්තු කටයුතු සඳහා භාවිතා කරන ලද දොඹකර යන්ත්‍රය 2017 දෙසැම්බර් 29 දින අලුත්වැඩියා කර රු.මිලියන 9.8 ක මුදලක් අදාළ අලුත්වැඩියාව සිදුකළ ආයතනයට ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම අලුත්වැඩියාවෙන් පසු යන්ත්‍රයේ හයිඩ්‍රොලික් හෝස් පද්ධතියේ බට පිපිරීම නිසා යන්ත්‍රයෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකිව වසර 10 කට වැඩි කාලයක් නිශ්කාර්යව තබා තිබුණි. | කොත්මලේ වැඩබිමට 1985 දොඹකරය ගෙන්වා ඇති අතර එහි එන්ජිමේ ප්‍රධාන අළුත්වැඩියා කටයුත්තක් 2017 දෙසැම්බර් 29 රු. මි. 9.8 ක මුදලක් වියදම්කර අළුත්වැඩියා කටයුත්තක් සිදුකර එම අළුත්වැඩියාවෙන් පසු යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේදි එහි Hydraulic පද්ධතියේද අළුත්වැඩියාවක් සිදුකිරීමට අවශ්‍ය විය. මීට හේතු වනුයේ යන්ත්‍රය වසර 32කට වඩා පැරණි බැවිණි. මේ වන විට එම යන්ත්‍රෙය් Hydraulic පද්ධතිය මෙන්ම සියළුම ටයර් ද දැඩි ලෙස ආපදා වී ඇති බව නිරීක්ෂණය වන බැවින් මෙම ආපදා පිළිසකර කරගැනීම සඳහාද ආසන්න වශයෙන් රු.මි. 10 ක් පමණ වැයකිරීමට සිදුවන බව කාර්යභාර ඉංජිනේරු 2024.10.11 දිනැති ලිපිය මගින් සඳහන් කර ඇත, එම අළුත්වැඩියා කටයුතු සිදුකර ගත්තද යන්ත්‍රයේ පැරණි භාවය නිසා යන්ත්‍රය ක්‍රියා කිරීමේදී නැවත මතුවන අළුත්වැඩියා සහ අවශ්‍ය උපාංගද වෙළදපලේ සොයාගැනීමට අපහසු බැවින් මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීම ඵලදායි නොවේ. | යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සිදුකර ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඉ) | වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ වාහන පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයට අනුව අමාත්‍යාංශයට අයත් වාහන 241 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ලබාදී ඇතත් ඒවා අධිකාරියේ නමට පවරා ගැනීමට 2024 මැයි 29 දින වනවිටත් කටයුතු කර නොතිබූණි.වාහන 46 ක් සම්බන්ධ තොරතුරු නොමැති බැවින් ප්‍රවාහන අංශයේ ලේඛනවලට ඇතුළත් කර නොතිබූණි.එසේම එම වාහන අතුරින් අංක 56-8184 දරන වාහනය 2023 වර්ෂයේදී වෙන්දේසි කර තිබුණි | මේ සම්බන්ධව සොයා බලා ඉදිරි කටයුතු කරමි. | වාහන ලේඛනයක් නඩත්තු කළයුතු අතර අයිතිය තහවුරු කරගෙන අපහරණය කළ යුතුය. |